කෝල්‍යාගේ දිනපොත

රුසියානු ලේඛක

නිකොලායි නෝසව්

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

කෝල්යාගේ දිනපොත

පරිවර්තකගේ වෙනත් කෘති

සාහිත්‍ය පරිවර්තන

දොන් නදිය නිසලව ගලා බසී - පළමුවැනි කාණ්ඩය - 2000
(හොඳම ප්‍රකාශිත කෘතිය ලෙස 2001 යෞවන සම්මාන)
දොන් නදිය නිසලව ගලා බසී - දෙවැනි කාණ්ඩය - 2002
දොන් නදිය නිසලව ගලා බසී - තෙවැනි කාණ්ඩය - 2006
දොන් නදිය නිසලව ගලා බසී - සිව්වැනි කාණ්ඩය - 2006
චේ- සටන් සගයින්ගේ ඇසින් - 2005
(සුසන්ත රන්ජන් ගමගේ සමඟ)
කලින් නික්මුණු වසන්තය - 2006
නිසල උයන - 2007
කොක්කු සරති අහස් තලේ - 2010
වොල්ගා සිට ගංගා තෙක් - 2010

ළමා සහ යෞවුන් සාහිත්‍ය පරිවර්තන

පුරු පුරු දඟ කරන්නෙ නෑ - 2003
කොට්ටෝරු පූංචා - 2005
සීයාගේ ගෙදර ගිහින් - 2006
හැංගි මුත්තො හැංගියෝ - 2006
පුංචි පුතුට වැඩ කන්දයි - 2006
පළමු මාළුවා - 2007
පටලැවිල්ල - 2008
රණ්ඩුව හොඳ නැමයි - 2008
ඉත්තෑවගෙ අත්මේස් - 2008
මාෂා සහ වලසා - 2008
ඔරලෝසුවෙ කතන්දරේ - 2008
සතුන් දිහා බලා ඉගෙන - 2008
වලස් පූතා දඟකාරයි - 2008
කවුද කවුද ශක්තිමත් ම - 2008
මෙවලම් නැතිව ගෙවල් තනන්නෝ - 2008
යන්තරයට උගත්වන්න - 2008
පුංචි පුංචි පැටව් (සංස්කරණය) - 2008
අලෙයොනා අක්කයි-ඉවාන් මල්ලියි (සංස්කරණය) - 2008
සුළැඟිලි පුතා - 2009
මිෂ්කාගේ කැඳ හැළිය - 2010
මහ පොළොවේ රහස් සොයන්නෝ - 2010
වැඩබැරිදාස ගැන කතා - 2012
ටොක් ටොක් ටොටොක් - 2013

වෙනත් පරිවර්තන

ඩියෙන් බියෙන් පූ මහ සටන - 2006
සාහිත්‍යය හා කලාව - මාඕ සේතුං - 2007
පක්ෂයේ වැඩ ශෛලිය පිරිපහදු කිරීම - මාඕ සේතුං - 2010

සංස්කරණ

දයලෙක්තික භෞතිකවාදය - 2007
තිෂ්මි - සැඩ සුළඟ සහ මඳ පවන - 2008

කාව්‍ය (ස්වතන්ත්‍ර)

භුගත සහෝදර සංදේශය - 2006

වෙනත්

හෙට ඉරක් පායයි (පුවත්පත් තීරු ලිපි එකතුව) - 2010

කෝල්‍යාගේ දිනපොත

රුසියානු ලේඛක

නිකොලායි නෝසව්

සිතුවම්

වී. වයි. කොනොවාලොව්

පරිවර්තනය

මහින්ද සෙනරත් ගමගේ

සයුරි ප්‍රකාශන
අංකඃ 102/176,
මත්තේගොඩ නිවාස සංකීර්ණය පාර,
මත්තේගොඩ.

කෝල්යාගේ දින පොත - නිකොලායි නෝසව්
ප්‍රථම මුද්‍රණය 2008
දෙවන මුද්‍රණය 2013

පරිවර්තතනය © මහින්ද සෙනරත් ගමගේ
071 5181421 mahinda.sayuri@gmail.com

ISBN 978-955-1889-07-4

මුද්‍රණය
සයුරි ප්‍රින්ටර්ස් ඇන්ඩ් පබ්ලිෂර්ස් පුද්. සමාගම
අංකඃ 102/176
මත්තෙගොඩ නිවාස පාර,
මත්තෙගොඩ.

ප්‍රකාශනය
සයුරි ප්‍රකාශන
අංකඃ 102/176, මත්තෙගොඩ නිවාස සංකීර්ණය පාර,
මත්තෙගොඩ

පිළිගැන්වීම

හෙට දවස
යහපත්ව ගොඩනඟන්නට
සිටින
ලාංකේය දූ දරු පරපුරට.....

මැයි 28

අද දවස මට නං බොහෝ ම වැදගත් එකක්- පාසලේ අවසාන දවස. ඒ වගේ ම මම ඉහළම ලකුණු එක්ක ඊළඟ පන්තියට සමත් වුණා. හෙට ගිම්හාන නිවාඩුව පටන් ගන්නවා. මං කල්පනා කළා නිවාඩු කාලෙදි දින පොතක් පවත්වා ගන්න. දිනපතා ම නොවැරදවා ලියනවා නම් මට ෆවුන්ටන් පෑනක් ගෙනත් දෙන්න අම්මා පොරොන්දු වුණා. ඉතිං මම තිල්පාට කවරයක් එක්ක එකට අමුණා ඇති ලිපි ලියන කොළ මිටියක් මිලට අරන් මට සිද්ධවෙන වැදගත් දේවල් ලියන්නයි යන්නේ. වැදගත් දෙයක් සිද්ධ වුණු ගමන් ම මම දිනපොත අරන් ඒකේ ලියා ගන්නවා. ඒ වගේ ම මට හිතෙන දේවලුත් ලියන්නට යි සිතා සිටින්නේ. මං හැම ජාතියෙ ම දේවල් හිතනවා. බුද්ධිමත් දෙයක් මගේ ඔළුවට ආව ගමන් ම මං ඒවා ලියා ගන්නවා. අද දවස ගැන ලියන්න් තරං වැදගත් දෙයක් නෑ. මොන ම බුද්ධිමත් හිතුවිල්ලකුත් නෑ.

මැයි 29

අදත් වැදගත් කිසි ම දෙයක් සිද්ධ වුණේ නෑ. මගේ හිතුවිලි ගැනත් කියන්න තියෙන්නෙ ඒක ම යි. සමහර වෙලාවට ඒ මම නිදහසේ හිටපු මුළු කාලෙ ම ළමයි එක්ක එළියේ සෙල්ලං

කරමින් හිටිය නිසා. ඒකෙන් මට හිතන්න කිසිම වෙලාවක් තිබුණේ නෑ. කමක් නෑ, හෙට මොනවා හරි හම්බ වෙයි.

මැයි 30

අදත් මොකවත් ම සිද්ධ වුණේ නෑ. මොකක් හරි හේතුවක් හින්දා කිසි ම හිතුවිල්ලකුත් නෑ. ඇත්තට ම මං දන්නේ නෑ මොනවා ලියන්නද කියලා. සමහරවිට මං මොනවා හරි හිතලා ලියන්න ඕනෑවත්ද? ඒත් ඒක දිනපොතක් වෙන එකක් නෑ. දින පොතක හැම දේ ම ඇත්ත වෙන්න ඕනෑ.

මැයි 31

අද අපේ තරුණ පුරෝගාමීන්ගේ කණ්ඩායමේ රැස්වීමක් තිබුණා. අපේ කණ්ඩායම් නායක යූරා කුස්කොව් කතා කළා.

"ඉතිං මිතුරනේ දැන් ග්‍රීෂ්මය ඇවිත්, නිවාඩුව පටන් අරන්. සෙල්ලම් කරනවට වඩා අමතර දෙයක් ගිම්හාන කාලෙදි කරන්න සමහරවිට ඔයගොල්ලන්ගෙන් සමහරෙක් හිතනවා ඇති. ඒත් ඒක වැරදීමක්. හැබෑ පුරෝගාමියෝ අවුරුද්ද පුරාම තමන්ගේ වැඩ කටයුතු දිගට ම කරගෙන යනවා. ඒ ගොල්ලෝ කොහෙත් ම කාලය නාස්ති කරන්නේ නෑ. ඒ හින්දා අපි හිතමු මේ ගිම්හානේදී කරන්න පුළුවන් වැදගත් දෙයක්, අපි හැමෝට ම එකට එකතු වෙලා කරන්න පුළුවන් දෙයක්"

අපි හිතුවා, හිතුවා, ඒත් කිසි කෙනෙකුට කිසි දෙයක් හිතාගන්න බැරි වුණා. අන්තිමේ වීත්යා අල්මාසොව් මෙහෙම කීවා.

"අපිට පුළුවන් අපේ එළවළු පාත්තියේ වැඩ කරන්න"

"ඒකට පරක්කු වැඩියි" එහෙම කීවේ යූරා. "දෙවැනි කණ්ඩායම ඒ ගැන මුලින් ම හිතලා. ඒ ගොල්ලේ දැනට ම කැකිරියි, තක්කාලියි, පුහුලුයි හිටවලා"

"අපි ඉස්කෝලේ වත්තේ පැළ හිටවමු" ෂෙන්යා ෂෙම්යාකින් යෝජනා කළා.

"ඒකට මාස දෙකක් ම පරක්කුයි. පැළ හිටවන්න ඕනෑ වසන්තේ මුලදී ම යි. ඇරත් තවත් එක ම ගහකටවත් ඉස්කෝලේ වත්තේ ඉඩක් නෑ" යූරා කීවා.

"අපි තැපැල් මුද්දර එකතු කරමු" එහෙම කීවේ ෆේද්යා ඔව්සියන්නිකොව්. "මං මුද්දර එකතු කරන්න කැමතියි"

"ඒක මුළු කණ්ඩායමකට හරියන වැඩක් නෙවෙයි. අපි එක එක්කෙනාට තනියෙන් ඒක කළහැකි"

"එහෙනං අපිට පුළුවන් රසකැවිලි දවටන එකතු කරන්න" එසේ යෝජනා කළේ ග්‍රීෂා යාකුෂ්කින්.

"රසකැවිලි දවටන!" පව්ලික් ග්‍රචියොව් ඇසුවේ සමච්චලයට යි. "තමුසේ ඊළඟට කියාවි ගිනි පෙට්ටි එකතු කරමු කියලා. ඔය ජාතියේ දේවල් එකතු කරන එකේ හොඳේ මොකක්ද. අපට ඕනෑ කරන්නේ ප්‍රයෝජනවත් වැඩක්"

අපි මොළය කාල් ගාමින් කල්පනා කළත් සුදුස්සක් කල්පනා කරගන්නට බැරි වුණා. ගෙදර ගොස් ඒ ගැන කල්පනා කරන්නැයි යූරා අපට කීවා. දින දෙකකින් පසු අපි නැවත මුණ ගැසී එකිනෙකාගේ වෙනස් යෝජනා ගැන සාකච්ඡා කරනවා ඇති.

හිතීමේ බලාපොරොත්තුවෙන් මම ගෙදර ගියත් රෑ කෑමට පෙර ළමුන් හා සෙල්ලමට ගිය හේතුවෙන් මට ඒ ගැන එහෙම පිටින්ම අමතක වුණා. රෑ කෑමෙන් පසුවත් මම තව ටිකක් සෙල්ලමට ගියා. ඉන්පස්සේ මම ගෙදර ඇවිත් සැහැල්ලු රෑ ආහාර අරගෙන ආයෙත් ගෙදරින් පිටවුණා. රාත්‍රියේ මම දිනපොත ලියන්නට ඉඳගත්තත් අම්මා කීවා දැන් නිදාගන්න වෙලාව කියලා. ගිම්හාන කාලේ කරන්න වැඩක් ගැන හිතන්න ඕනෑ නේද කියලා මට කල්පනා වුණේ එවේලේයි. ඒත් ඉතිං ඉඳගෙන වගේම ඇඳේ දිගාවෙලාත් හිතන්න පුළුවන්නේ. ඉතිං මම ඇඳට ගිහින් දිගාවෙලා කල්පනා කරනවා.

ජූනි 1

ඊයේ රෑ මං ඇඳට වෙලා හිතන්න පටන් ගත්තා. ඒත් ගිම්හානෙට කරන වැඩ ගැන හිතෙනවා වෙනුවට හැම ජාතියෙ ම දේවල් ඉවරයක් නැතුව මගේ ඔළුවට ගලාගෙන ආවා. මං මුහුද ගැන, සාගරේ ගැන, ඒ සාගරේ ජීවත්වෙන හැම ජාතියක ම මෝරුයි තල්මස්සුයි ගැන හිතන්න ගත්තා. තල්මස්සු ඒ තරං විශාල මොකදැයි මට පුදුම හිතුනා. උන් ගොඩ බිම ජීවත් වුණා නං,

අපේ පාරවල්වල උන් ඇවිදිනවා නං හෙම මොනවා වේවිද, තල්මහෙක් අපේ ගෙයි වැදුනොත් අපි කොහේ ජීවත් වෙන්නද?

හපොයි බොලේ කියලා මට කියවුණා. මං කොහෙත් ම ඕවා නෙවෙයි හිතන්න ඕනෑ. ගිම්හානයට කළ යුතු වැඩක් ගැන හිතන්න හිත එක තැනක තියාගන්න මම තදින් උත්සාහ කළා. ඒත් මට හිතා ගන්න පුළුවන් වුණ එකම දේ සත්තු ගැන - ඒ කියන්නේ අශ්වයොයි බූරුවොයි ගැන විතර ම යි. අශ්වයෝ ඔය තරමට විශාල ඇයි, බූරුවෝ ඔය තරමට පුංචි ඇයි කියලා මං හිතුවා. එහෙම වුණත් සමහරවිට අශ්වයෝ කියන්නේ ලොකු බූරුවෝ වෙන්ඩ ඕනෑ. එතකොට ඔටුවන්ට මොල්ලි තියෙන්නේ, අලින්ට හොඬවැල් තියෙන්නේ ඇයි? ඔටුවන්ට හොඬවැලුත් තිබුණා නං මොල්ලිත් එක්කම උන් ඔටුවොද නැත්තං ඔටු කෙඳි තියෙන අලිද?

එතෙන්දි ආයෙත් මම පාරෙන් පිටට වැටුණා. මම කොච්චර උත්සාහ කළත් මගේ හිත ඉවරයක් නැතුව හතර අතේ යනවා. මගේ වගේ ඔළුවකින් හිතන්න උත්සාහ කරන එකත් පලක් නැති එකක් කියලා මට තේරුණා. ඉතිං මං නින්දට වැටුණා.

ජූනි 02

ජයවේවා! අම්මා මට ෆවුන්ටන් පෑනක් ගෙනැත්! මං දැන් ලියන්නේ මගේ අලුත් පෑනෙන් විතරමයි. ප්‍රශ්නෙ තමා ලියන්න දෙයක් නැතිකම. මං මුළු පැයක් තිස්සේම මොළය කාල්ගාමින් උන්නත් ලියාගන්න තරම් මොකවත්ම මට හිතාගන්න බැරිවුණා. හිත කළඹවන මොකවත් දෙයක් කොහෙත්ම සිද්ධ නොවෙනවා නං ඒක මගේ වැරැද්දක්යෑ?

ජූනි 03

අද උදේ එළියට යද්දී කාවද මං දැක්කේ? පාරදිගේ එන ග්‍රීෂා යකුෂ්කින්.

"ඒයි, කොහේද ඔය යන්නේ ?" මං ඇහුවා.

"මං යනවා ඉස්කෝලේ තරුණ ස්වභාව විද්‍යාඥයින්ගේ කවයට"

"මාත් එන්නද?"

"අපොයි මොකෝ, යමු"

අපට මගදී යූරා කුස්කෝව් මුණ ගැසුණා. ඔහුත් සිටියේ කවයට යමින්. ඔක්කෝම පිරිස එකතු වුණායින් පසු කවය මෙහෙයවන අපේ ගුරුතුමිය නීනා සෙර්ගෙයෙව්නා අපව වත්තට කැඳවාගෙනා ගොස් මල් සෑදී ඇත්තේ කොහොමදැයි කියා දුන්නා. ඈ අපට කීලය සහ කලංකය ගැන කියා දුන්නා. පරාග නැතිනම් රොන් නමින් හැඳින්වෙන කහපාට කුඩු ගැනත් කියා දුන්නා. මී මැස්සන් හරි වෙනත් කුරුමිණි සත්තු හරි එක මලක ඉඳලා අනිකට අරන් යන්නේ මේ පරාගයි. උන් මලක වහන කොට උන්ගේ කකුල්වල මේ පරාග ඇලිලා ඊළඟ මලට යනවා. පරාග පෝෂණය නැතිනම් පරාගනය කියා කියන්නේ මේකටයි. පරාග පෝෂණය වුණු මලක බීජ ඇතිවෙනවා. ඒත් පරාග මලකට වැටුණේ නැතිනම් කොහෙත් ම ගෙඩියක් ඇතිවෙන්නේ නෑ.

අස්වැන්න වැඩි වෙන්නට කුරුමිණි සත්තු උදව් දෙන්නේ එහෙමයි. උන් පරාග විසුරුවා හැරියේ නැතිනම් බීජ ඇති වෙන්නේ නෑ.

අනිත් කුරුමිණි සත්තුන්ට වඩා වැඩි දෙයක් මී මැස්සන් අස්වැන්න වැඩිකරන්නට කරනවා. ඒ උන් මුළු දවස තිස්සේ ම පැණි එකතු කරමින් මලින් මලට ඉගිලෙන නිසායි. ආන් ඒ නිසායි පුළුවන් තරමට මී මැසි ජනපද තිබිය යුත්තේ.

පන්තියට පස්සේ යූරා පුරෝගාමී කණ්ඩායම කැඳවා ගිම්හානය වෙනුවෙන් අපි සිතුවේ මොනවාදැයි අපෙන් ඇසුවා. යෝජනා කරන්නට කිසිවක් කිසිවෙකුට තිබුණේ නෑ. අපි අපේ හිතන තොප්පි හරි හැටියට පැළඳ ගන්න ඕනෑ යැයි යූරා කීවා. එසේ නැති වුණොත් අපි මොනවා හරි හිතා ගන්නට කලින් ගිම්හානය අවසන් වී යාවි. ග්‍රිෂා යකුෂ්කින් කතා කරන්නට පටන් ගත්තේ යූරා රැස්වීම අවසන් කරන්නට යද්දියි.

"අපි මී මැසි පෙට්ටියක් හදලා මී මැස්සන් ඇති කරමු"

"ඔව්, ඒක නම් අපූරුයි. මී මැස්සන් හරි ප්‍රයෝජනවත්. පැණි හදනවට අමතරව උන් අස්වැන්න වැඩි කරගන්න උදව් කරනවා" යූරා කීවා.

"ජයවේවා! අපි මී මැසි ජනපදයක් ඉස්කෝල වත්තේ පටන් ගම්මු. ඒක තමයි ඉස්කෝලේ පළවෙනි එක වෙන්නේ. අපේ

කණ්ඩායම ජනප්‍රිය වේවි!" පව්ලික් ග්‍රචියෝව් කෑ ගැසුවා.

"පොඩ්ඩක් ඉන්න. අපි මී මැසි පෙට්ටියක් හදන්නවත් දන්නෙ නෑ" යූරා කීවා.

යූරා හරි. කොහොම පටන් ගන්නදැයි කියලාවත් අපිට අදහසක් තිබුණේ නෑ.

"අපි ගිහින් නීනා සෙර්ගෙයෙව්නා ගුරුතුමීගෙන් අහමු. ඈ දන්නවා වෙන්ඩ ඕනෑ" යූරා කීවා.

අපි අපේ මී මැසි පෙට්ටිය ගැන කියන්නට නීනා සෙර්ගෙයෙව්නා ළඟට දිව්වා. අපි මී මැස්සන් ඇති කිරීම ගැන සැළසුම ගැන ඇයට කීවා.

"ඔයාලා මී මැස්සන්ව ගන්නේ කොහෙන්ද?"

"අපි උන්ව අල්ලා ගන්නම්" ඒ කීවේ සෙර්යෝෂා.

"අල්ලා ගන්න? කොහොමද?"

"අපේ අත්වලින් තමා"

ගුරුතුමියට මහ හඬින් සිනා ගියා. "මී මැස්සෝ එක එකා ගානේ අල්ලා ගන්න ගියොත් උන් කිසිදාක ඔයාලා ගාව ඉන්න එකක් නෑ. මී මැස්සෝ ජීවත් වෙන්නේ විශාල සමාජයක්, කණ්ඩායමක් නැත්නං පවුලක් විදිහට. ඔය ගොල්ලෝ අල්ලා ගන්න මී මැස්සෝ උන්ට ඉඩ ලැබුණු හැටියෙම පැනලා ගිහින් උන්ගේ පවුලට එකතු වේවි"

"එහෙනං ඉතිං අපි මොනවද කරන්නේ?"

"ඔයගොල්ලෝ මීමැසි පවුලක් ම, මී මැසි ජනපදයක් ම ගන්න ඕනෑ"

"කොහෙන්ද ගන්නේ?"

"ඔයාලට පුළුවනි තැපෑලෙන් ඇණවුම් කරන්න" නීනා සෙර්ගෙයෙව්නා පිළිතුරු දුන්නා.

"තැපෑලෙන්?"

"ඔව්, ඔයාලා මී මැස්සෝ ඇති කරන විශාල ගොවිපොළකට ලියලා ඉල්ලන්න ඕනෑ මී මැසි ජනපදයක් ඕනෑ කියලා"

"කොයි මී මැසි ගොවිපොළට ලියන්නද කියලා අපි දන්නෙ නෑනේ"

"හොයා බලන්නේ නැතුව මටත් කියන්න අමාරුයි. ඒත් මං ඔය ගොල්ලෝ වෙනුවෙන් හොයලා බලන්නම්කෝ" ගුරුතුමිය

කීවා.

මී මැසි පෙට්ටියක් සෑදී ඇත්තේ කොහොමද කියලා ඈ අපට කියා දුන්නා. ඒක හරි ම සරලයි. ඕනෑ කරන්නේ හිල් තියෙන ලොකු ලී පෙට්ටියක් විතරයි. ඒ ඇතුළට මී මැස්සෝ දැම්ම ම උන් ම ඉටිවලින් වද බැඳලා ඒවා පැණිවලින් පුරවනවා. ඒත් උන් වද බඳින්නේ කෙළින් ම පෙට්ටි බිත්තියේ. එතකොට පැණි අහකට ගන්න අමාරු වෙනවා. ඉතිං මී මැස්සන් ඇති කරන්නෝ කරන්නේ තුනී ඉටි තට්ටුවක් ගෑව ලී රාමු පෙට්ටිය ඇතුළෙ තියන එකයි. මී මැස්සෝ එවිට වද බඳින්නේ අර ඉටි උඩයි. මී මැස්සන් ඇති කරන අයට තියෙන්නේ රාමුව අහකට ගන්න එක විතරයි.

අපි මී පෙට්ටියක් හදන්නට කෙළින් ම තීරණය කළා. තෝල්යා පෙසොව්ස්කි කීවා ඒක අපිට එයාගෙ මඩුවෙදි කරන්න පුළුවන් කියලා. ගෙන ආ හැකි මොනයම් හරි උපකරණයක් තියෙනවා නම් ඒවා අරගෙන එන ලෙස යූරා අපට දැනුම් දුන්නා.

ගෙදර යන අතරේ මම මී මැස්සන් ගැන හිතුවා. හිතලා බලන්න මී මැස්සන් තැපෑලෙන් ලබාගන්න හැකිවීම ගැන! ඒක පුදුමයක් නෙවෙයිද?

ජූනි 04

අද උදේ අපි හැමෝ ම තෝල්යා පෙසොව්ස්කිගේ මඩුවේදී මුණ ගැසුණා. විත්යා අල්මාසොව් කියතක් ගෙනාවා, ග්‍රීෂා යකුෂ්කින් ගෙනාවේ පොරොවක්, යූරා කුස්කෝව් ආවේ තියතක්, අඬුවක් සහ මිටියක් අරගෙන. පව්ලික් ග්‍රචියොව් ළඟ මිටියක් තිබුණා. මම ගෙන ගියේත් මිටියක්. එතකොට මිටි තුනයි.

"පෙට්ටිය හදන්න කොහෙන්ද අපි ලී හොයා ගන්නේ?" එහෙම ඇහුවේ සෙර්යෝෂා.

අප ළඟ එක ම ලෑල්ලක්වත් තිබුණේ නෑ. කොහෙන් හොයාගන්නද කියලා දැනගෙන හිටියෙත් නෑ.

"ඒක නම් අපූරු වැඩේ! ලෑලි නැතුව අපට මී මැසි පෙට්ටියක් හදන්න බෑ" එහෙම කීවේ යූරා.

"හ්ම්.... මොනව හරි පරණ ලෑලි ටිකක් මේ කිට්ටුව පාත

තියෙන්න පුළුවන්"

අපි හැමෝ ම ලෑලි හොයන්න පිටත් වුණා. හැම මඩුවක් ගානේ ම, හැම අට්ටාලයක් ගානේ ම අපි හොයා බැලුවත් එකම එකක්වත් අපට හොයාගන්න බැරි වුණා.

"අපි ගාල්යා හම්බ වෙන්න යමු. ඈ අපට උදව් කරාවි" යූරා කීවා.

ගාල්යා අපේ ජ්‍යෙෂ්ඨ පුරෝගාමී නායිකාවයි. අපි ඈ ළඟට ගිහින් අපේ කරදරය ගැන කීවා.

"මට පුළුවනි ප්‍රින්සිපල් එක්ක කතා කරන්න. සමහරවිට පහුගිය දවස්වල අලුත්වැඩියා කිරීම්වලින් ඉතුරු වුණු ලෑලි ටිකක් අපට ගෙනියන්න එයා ඉඩ දේවි"

විශාල ලෑලි හතරක් ගෙන යන්නට විදුහල්පති තුමා අපට අවසර දුන්නා. අපි ඒවා මඩුවට ඇදගෙන ගිහින් වැඩට බැස්සේ හැබෑ උනන්දුවකින්. කියතෙන් කැපීමට, යතු ගෑමට, මිටියෙන් ගැසීමට, මේ හැම දේට ම අපි දක්ෂයෝ වුණා. වටේ යමින් තෝල්යා හැම දේකට ම කෑ ගසමින් අණ දුන්නා. එයා හිතන්නේ ඒක එයාගේ මඩුව හින්දා, එයාට අපි හැමෝගෙ ම ලොක්කා වෙන්න පුළුවන් කියලා. මම තව පොඩ්ඩෙන් එයා එක්ක රණ්ඩුවකට පැටලෙනවා. එයාට මිටියක් ඕනෑ වෙලා, ඒක සන්සුන්ව ඉල්ලනවා වෙනුවට එයා බෙරිහන් දෙන්න ගත්තා.

"කෝ මේ මිටිය? මිනිත්තුවකට කලිං ඒක මා ළඟ තිබ්බා, දැන් අතුරුදහන් වෙලා"

"ඒක මේ කොහේ හරි ඇති. මං මේ දැන් ඇණේකට ගැහුවා" යූරා කීවා.

"එහෙනං කොහේ ඒක ඇලෙව්වද?"

"මං කොහේවත් ඇලෙව්වේ නෑ"

"තමුසේ ඒක හොයා බලන එකයි හොඳ"

"තමුසෙ ම හොයා බලන එකයි"

හැම තැන ම හොයා බැලුවත් ඔහුට එය හොයා ගන්නට බැරි වුණා.

හැම දෙනා ම වැඩ නතර කොට මිටිය හොයන්නට වුණා. අන්තිමේදී ඒක හොයා ගත්තා. ඒ මගේ අතේ තිබිලා!

"මොකෝ තමුසේ ඔතන පඹයෙක් වගේ හිටන් ඉන්නේ"



තෝල්යා මගේ ඇඟට කඩා පැන්නා" තමුසෙට පේන්නෙ නැද්ද අපි උඩයි පහළයි හැම තැන ම මිටිය හොයනවා කියලා?"

"මං කොහොමද දන්නේ තමුසේ හොයන්නේ මේ මිටිය කියලා? අපි ගාව මිටි තුනක් තියෙනවා නේද?"

"තුනක් තිබුණයි කියලා ඇති හොඳේ මොකක්ද, ඕන කරන වෙලාවට එකක්වත් අතේ නැත්තං?"

"ඉතිං තමුසේ ඔච්චර කලබලයක් අවුස්සන්න ඕන කමක් නෑ. තමුසෙට වගේ ම මිටිය පාවිච්චි කරන්න අයිතියක් මටත් තියෙනවා. අපි ඔක්කෝටම ඕනෑ වැඩ කරන්න" මම කීවා.

අද අපි මී මැසි පෙට්ටිය හදලා ඉවර කළේ නෑ. ඒ ඉර බැහැලා ගිය හින්දා. එයින් පස්සේ මඩුව අස්සේ වැඩ කරන්නට බැරි තරමට කරුවල වුණා.

ජූනි 05

ජයවේවා! අද මී මැසි පෙට්ටිය හදලා අවසානයි. ඔන් බලන්න- මම අද දවස අන්තිමේ ඒකේ චිත්‍රයක් ඇඳලා තියෙනවා. පිටතින් තියෙන්නේ පියනයි. පෙට්ටිය පතුළේ විවරය 'ප්‍රධාන දොරටුවයි'. ඉහළින් තියෙන අනෙක් හිලත් දොරක්, එක විදිහක 'හදිසි දොරටුවක්'. පතුළේ තියෙන ලීස්තරය තියෙන්නේ ආපහු වදයට

එන මී මැස්සන්ට ඇතුළට රිංගන්න කලිං වහන්නටයි. ඒකට කියන්නේ ලැගුම් ලෑල්ල කියලායි. පියන වෙන ම තියෙන්නේ රාමු ඉවත් කරගන්න ඕන වුණ වෙලාවට අහකට ගන්න පුළුවන් වෙන්නට යි. අපි රාමු දොළහකුත් හැදුවා.

මී මැස්සන් ගැන අහන්නට යූරා ගියා නීනා ගුරුතුමිය ළඟට. ඒත් ඇයට තවමත් ඒ ගැන හොයා බලන්න වෙලාවක් ලැබිලා නෑ. එයාට මොකවත් ම හොයාගන්න බැරි වුණොත් මොනවා කරන්නද. අපේ මී මැසි පෙට්ටියෙන් මොනවා කරන්නද?



ජූනි 06

මුළු දවස තිස්සේ ම මම අද ඇවිද්දේ මී මැස්සන් ගන්න පුළුවන් තැන් ගැන මිනිස්සුන්ගෙන් අහමිනුයි. ඒත් ඒ කාටවත් ඒ ගැන කියන්න පුළුවන් වුණේ නෑ. මට මුළු උදේ වරුවෙ ම දැනුනේ කේන්තියක් වගේ ම දුකක්. ගෙදර එද්දී අලෝෂා මාමා ඇවිත් උන්නා.

"ඉතිං තරුණයා මොකෝ මෙච්චරට බෙරිවෙලා?" එයා ඇහුවා.

"මට මී මැස්සෝ ටිකක් ඕනැ, ඒත් කොහෙන් උන් ගන්න ද කියලා දන්නේ නෑ"

"මොන ඇන්නෑවටකටද මී මැස්සෝ?"

අලෝෂා මාමාට මම අපේ මී මැස්සන් ඇති කිරීමේ සැළසුම ගැන සියල්ල ම කීවා. "ඒත් අපි කොහෙන් කියලා මී මැස්සොන්

හොයා ගන්නද?"

"පොඩ්ඩක් ඉඳිමු, පොඩ්ඩක් ඉඳිමු... මට මතකයි අපේ ගමේ මී මැස්සෝ ඇති කරන කෙනෙක් උන්නා වගේ. මගේ මතකේ හරිනං එයා මීමැස්සෝ අල්ලන්න පුරුදු වෙලා හිටියේ උගුලකින්"

"මොන වගේ උගුලකින්ද?"

"ඒක මේ හිලක් තියෙනව තුනී ලෑලි පෙට්ටියක්. හරියට කුරුල්ලනට හදන ගෙයක් වගේ එකක්. ඒකට පැණි ටිකක් දාලා කැලේ ගහක එල්ලලා තියනවා. පැණිවල පුසුඹට මී මැස්සෝ ඇදිලා එනවා. සමහර වෙලාවට මුළු රැන ම ඇවිත් පෙට්ටියේ වහනවා. එතකොට එයා කරන්නේ පෙට්ටිය ගෙදර ගෙනැත් නියම මී මැසි පෙට්ටියට මී මැස්සන්ව මාරු කරන එකයි. ඔයාටත් පුළුවනි ඒ ජාතියේ උගුලක් හදලා අම්මත් එක්ක ගම් පළාතේ ගිය වෙලාවක කැලේ ගහක ඒක එල්ලලා තියන්න. ඒ විදිහට මී මැසි රැනක් ම අල්ලා ගන්න පුළුවන් වේවි"

ගම් පළාතට අපි යන්නේ කවදාදැයි කියලා මම අම්මාගෙන් ඇහුවා.

"අපෝ දන් ම නෙවෙයි. මට ජූලි අන්තිම වෙනකම්, සමහරවිට අගෝස්තු වෙනකම් නිවාඩු ගන්න වෙන්නේ නෑ" අම්මා කීවා.

සෙර්යෝෂාව මුණ ගැහෙන්න ගිය මම උගුල ගැන කීවා.

"අපි එකක් හදමු. හදලා ඒක අපේ ගමට අරන් යමු. එහේ අපූරු කැලයක් තියෙනවා. ගඟකුත් තියෙනවා" එයා කීවා.

"ඒ කොහේද?"

"ශිෂිගිනෝවල. මෙතන ඉඳලා කිලෝමීටර් පහක් තියෙනවා"

"අපිට එහේ නවතින්න පුළුවන්ද?"

"අපොයි ඔව්. පෝල්යා නැන්දා ඇර වෙන කවුරුවත් එහේ නෑ"

මම ගෙදර දිව්වේ අම්මාගෙන් මට සෙර්යෝෂලාගේ ගමට යන්න අවසර දෙනවද අහන්නයි.

"මෝඩ වෙන්න එපා. මං කොහොමද ඔයාව නන්නාඳුනන තැනකට යන්න අරින්නේ?" අම්මා උත්තර දුන්නේ එහෙමයි.

"ඒත් එච්චර දුරක් නෙවේනේ. කිලෝමීටර් පහක් විතරයි. අපට පයිනුත් යන්න පුළුවනි"

"බෑ බෑ, ඔයාට යන්න බෑ. ඔයාලා කොහොමද එහේ තනියම

ඉන්නේ?"

"අපි තනියම නෙවෙයි. පෝල්යා නැන්දා එහේ ඉන්නවා"

"පෝල්යා නැන්දා! එයාට ඔයාලව ආම්බාන් කරගන්න පුළුවන් වෙන එකක් නෑ"

"ඒත් අපි හොඳට ම හොඳින් ඉන්නං, ඔව්, ඇත්තට ම යි කියන්නේ, අපි හොඳ ළමයි වගේ ඉන්නං"

"බෑ බෑ... මට නිවාඩු ලැබුණහම අපි එකට යමු. ඔයා මං නැතුව ගියොත් ගඟේ ගිලෙන්න පුළුවනි, නැත්තං කැලේ අතරමං වේවි, නැත්තං තව මොනව හරි ඕන දෙයක් වෙන්න පුළුවනි."

අපි කොහෙත් ම නාන්නට නොයන බව මම කීවා, ගඟ අහලකටවත් නොයන බව මම කීවා, ඒ වගේ ම කැලේටවත් යන්නේ නැති බව මම කීවා. ඒත් අම්මා නෙවෙයි ඇහුම්කන් දුන්නේ. මම කන්කෙඳිරි ගෑවා, නාහෙන් ඇඬුවා. මේක නතර නොකළොත් තාත්තාට කියන බවට අන්තිමේ අම්මා මට තර්ජනය කළා. ඉතිං මම නතර කළා. මම රෑ සැහැල්ලු කෑම වේලත් නොකා නින්දට ගියේ බඩගින්නේ ම යි. ඒකට මට කමක් නෑ.

ජූනි 07

වෙනදාට වඩා කලින් අවදි වූ මම ආයේත් අම්මාට කන්කෙඳිරි ගාන්නට වුණා. අද මට එය නවත්තන්නට කීවත් මම නතර කළේ නෑ. ඈ වැඩට යනතුරු ම මම නොනැවතී කන්නලව් කළා. එයින් පස්සේ මම ගියේ සෙර්යෝෂාගේ ගෙදරට යි. ඔහුත් පව්ලිකුත් හෙට ගමට යන බව ඔහු මට කීවා. මට අවසර ගන්නට බැරි වුණොත් ඔවුන්ට තනියම යන්නට වෙන බවත් කීවා. ගෙදර ආව මම මුළු දවස තිස්සේ ම දැනුනේ මහා කාළකණ්ණි බවක්. මම ඔහේ බලාගෙන ඉඳගෙන හිටියා. අම්මා ගෙදර ආවා. මම වෙන කවදාටත් වැඩියෙන් නරක විදිහට කන්නලව් කරන්න ගත්තා. අම්මාගේ ඉවසීම හිඳුනා. මා ගැන තාත්තට කියනවා කියලා අම්මා මට තර්ජනය කළා. ඒත් මම නතර වුණේ නෑ. ඉතිං දැන් මොනවා වුණත් කමක් නෑ. අන්තිමේ තාත්තාත් ගෙදර ආවා.

"මොකෝ එයා ගියාම වෙන්නේ?" තාත්තා එහෙම කීවේ මගේ

කන්කෙඳිරිය ගැන කීවාමයි. "මං හිතන්නේ ඒක හොඳ අදහසක්. දැන් එයා ලොකු කොල්ලෙක් නොවැ. එයා පොඩ්ඩක් ස්වාධීන වෙන්න ඉගෙන ගන්න දැන් හොඳ කාලේ"

තාත්තා හැම වෙලේ ම බාධා කරන බවත් ළමයා (ඒ කියන්නේ මම) හරියටකට හදාගන්න අමාරු කරවන බවත් අම්මා කියා හිටියා. තාත්තා කීවේ අම්මා මාව හරියකට හදාගන්නේ නැති බවයි. ඒ දෙන්නා තව පොඩ්ඩෙන් රණ්ඩු වෙනවා. ඒත් ඒක බේරා ගත්ත හැටියේ ම අම්මා සෙර්යෝෂාගේ අම්මා මුණ ගැහෙන්නට ගියා. ඒ දෙන්නා හැමදේ ම සූදානම් කළා. සෙර්යොෂාගේ අම්මා කීවේ අප හින්දා කිසි ම කෙනෙකුට කරදරයක් වෙන්නේ නෑ කියායි. පෝල්යා නැන්දා අපිව බලා කියා ගනිමින් කෑම උයා දෙනවා ඇති.

එයින් පස්සේ අම්මා සන්සුන් වුණා. මට දවස් තුනකට ඈ අවසරය දුන්නා, මා හොඳින් සිටිය හොත් යළිත් එසේ යන්නට දෙන බවත් කීවා. හැම දේකින් ම හොඳට ඉන්නවා කියලා මං පොරොන්දු වුණා.

මී මැස්සන් අල්ලන්ට ගමට යන බව ආරංචි වීමෙන් අනිත් සගයින් හැම දෙනා ම ඇවිස්සිලා. යූරා එයාගෙ මාලිමාව අපට දුන්නා කැලේදී අපට පාර වරදින්නේ නැති වෙන්න. තෝල්යා අපට පුංචි පිහියක් දුන්නා. ෆේද්යා අපට ගෙනාවේ කඳවුරු හට්ටියක්. ගිනි මැලයක් උඩින් ඒක එල්ලලා කෑම උයාගන්න පුළුවනි. තුනී ලෑලි කෑල්ලක් හොයා ගත් අපි උගුලක් හදා ගත්තා. ඒක බොහෝ ම හොඳට හැදුනා. ඒක ඉස්සරහින් හිලක් හැදුව අපි පුංචි දොරකුත් හැදුවා. ඒ මී මැස්සෝ ඇතුළට ආවහම වහන්නයි. මී මැසි පෙට්ටියේ වගේ ම පියනකුත් අපි හදා ගත්තේ මී මැස්සන්ව එළියට ගන්න පුළුවන් වෙන්නයි.

අම්මා මට ගෙනියන්න හැම ජාතියෙම කෑම ජාති ගෙනැත්- ධාන්‍යාහාර, පිටි, බටර්, සීනි, පාන් සහ ටින් කෑම. මගේ ගමන් මල්ල ඒ බඩු වලින් පිරිලා හොඳටෝම බරයි. සෙර්යෝෂාගේ ගමන් මල්ලත් මගේ එක තරමට ම තරබාරුයි. ඒත් පව්ලික්ගේ එක තමා ලොකු ම එක. ඉවුම් හට්ටිය තිබුණේ එයා ළඟයි. ඒ ඇරුනහම උණුවතුර බෝතලයක් සහ හැම ජාතියේ ම බඩුත් එයාගෙ මල්ලෙ තිබුණා. හොඳයි, දැන් ඉතිං සියල්ල සූදානම්.

මගේ හිත කොච්චර කලබල වෙලාද කියනවා නං මට හෙට ශිෂිගිනෝ වලට පිටත් වෙනකං බලාගෙන ඉන්නත් බැරි තරම්.

ජූනි 08

ජයවේවා! අපි දැනටමත් ශිෂිගිනෝ වලට ඇවිත්. සෙර්යොෂාගේ ගමේ ගෙදර ලීයෙන් කළ පුංචි බංගලාවක් බව අපට දැන ගන්න පුළුවන් වුණා. වටේට ම ගස්. ඒ වටේ වැටක්වත් නෑ. පොළොවේ හිටවපු කණු පේලියක් තියෙනවා. ඉතිං මම හිතන්නේ වැටක් හදන්න පටන් අරගෙන තිබුණත් ඉවරයක් කරන්නට වෙලාවක් තිබිලා නැතුවා වාගෙයි. අපි එද්දී ගේ වහලා දාලා. ඇතුළේ කවුරුවත් ම හිටියේ නෑ. පෝල්යා නැන්දා කොහේදෝ ගිහින්. අපි ඉතිං ඈ එනතුරු බලා හිටියා හිටියා... පස්සේ අපි තීරණය කළා කැලෑවට යන්න. කාලය නාස්ති නොකර අපේ උගුල එල්ලන්නට. පැණි ටිකක් උගුල තුළ තබා අපි එය ගහක එල්ලුවා. ඊට පස්සේ අපි නාන්නට ගඟට ගියා. වතුර හොඳටෝම සීතලයි. ඒත් අපි හොඳ හැටි වතුර ගහගත්තා. අන්තිමේ අපි ගොඩ ආවා. අපි හිටියේ සීතලෙන් නිල්පාට වෙලා, අපේ දත් කට කට ගාලා ගැහෙනවා. ඒ මදිවාට අපිට යකෙක් කන්න බඩගිනියි.

අපි ඉවුරේ ම ගිනි මැලයක් ගහලා මස් බඳුනක් කඩලා ගිනි මැලේ උඩ තියලා උයා ගත්තා. ඒක නං හරි ම හරි රසයි. කෑවාට පස්සේ අපි ආපහු ගෙදර ආවත් පෝල්යා නැන්දා තව ම ආපහු ඇවිත් නෑ.

"අපට මී මැස්සෝ පිරිච්ච ගස් බෙනයක් හම්බ වුණොත් හරි ම අපූරුයි නැද්ද! එතකොට අපිට මුළු රෑනක්ම කෙළින් ම අල්ලා ගත්තැහැකි" එහෙම කීවේ පව්ලික්.

"ඔව් ඒත් කොහෙන් ඒ වගේ බෙනයක් හොයා ගන්නද?"

"අපි බලමුකෝ මේ හරියේ මී මැස්සෙක් ඉන්නවද කියලා. ඊට පස්සේ ඌ යන්නේ කොහාටද කියලා බලමු. ඌ රොන් එකතු කර ගත්තහම ඌ ආපහු වදේට ඉගිල්ලේවි. අපි ඌ පස්සේ දුවලා රංචුව ඉන්න තැන බලාගමු"

මී මැස්සෙක් මලකට පහත් වෙනවා අපි දුටුවා. අපි ඌ දිහා බලන්නට නතර වුණා. ඌ මලින් මලට ඉගිල්ලුනා. අපි හතර

ගාතයෙන් වැටී ඌ පස්සේ බඩගෑවේ ඌ අපට නොපෙනී යන්නට නොදී.

බඩගෑම මට ඉක්මනට ම ඇතිවුණා. මගේ අත, පය, කොන්ද රිදෙන්න ගත්තා, ඒත් මී මැස්සා තව ම නවතින්නේ නැතුව ම රොන් උරනවා, ආපහු වදේට යන්න උගේ යාන්තංවත් අදහසක් නෑ.

අන්තිමේදී සේර්යෝෂා මෙහෙම කීවා. "මං හිතන්නේ මී මැස්සෝ ආපහු වදේට යන්නේ දවසේ හුඟක් පමා වෙලා. දැන් අපි ගිහින් තව සැරයක් නාමු. මී මැස්සෝ පස්සේ යන්න අපිට තව හුඟාක් වෙලාව තියෙනවා"

ආයෙත් වරක් ගඟට ගිය අපි දෙවැනි සැරේටත් නාන්නට වුණා. ඉර බහින තුරුම අපි හිටියේ වතුරේ. ඊට පස්සේ හැඳ

පැළඳ ගත් අපි ආපසු ගෙදරට ආවා. ඒත් පෝල්යා නැන්දා තවමත් ඇවිත් නෑ.

"සමහරවිට එයා නගරෙට ගිහින් අද එන්නේ නැතුව වත්ද?" මං ඇහුවා.

"මෝඩ කතා කියන්ඩ එපා. එයා එන්න ම ඕනෑ. එයා කොහේ ඉන්නද?" සේර්යෝෂා කීවා.

"ඒත් හිතමු එයා එන්නේ නෑ කියලා? අපි ගෙදර යන එකයි වඩා හොඳ"

"මං කොහේවත් යන්නේ නෑ. මට හොඳටෝම මහන්සියි" එහෙම

කීවේ පව්ලික්.

"අපි කොහේ බුදියන්ඩද?"

"අපිට පුළුවන් අල්ලපු ගෙවල්වලින් අහන්න අපිව රෑට නවත්ත ගන්න පුළුවන්ද කියලා" සෙර්යෝෂා කීවා.

"නෑ, අපි එහෙම නොකර ඉඳිමු. අපි පුංචි කුඩාරමක් අතු ඉති වලින් හදාගෙන එළියේ බුදියා ගනිමු" පව්ලික් යෝජනා කළා.

"ඒක නං නියම අදහස! කුඩාරමක බුදියන එක විනෝදයක් වේවි. මං මීට කලිං කවදාකවත් ඒක කරලා නෑ. ඒත් කොහොමද කුඩාරමක් හදන්නේ?" සෙර්යෝෂා හඬ තැලුවා.

පව්ලික් කුඩාරම හදන හැටි දනං සිටිය හින්දා අපි වැඩට බැස්සා. සෙර්යෝෂාත් මමත් අතු ටිකක් කඩාගෙන ආවා. පව්ලික් දිග ලී කෝටු හතරක් හොයාගෙන ඇලේට හිටෙව්වා, හරියට පිරමීඩයක් වගේ හිටින්න. ඊට පස්සේ ඒ වටේ අතු ගොඩ ගැහැව්වා. ඊළඟට අපි කළේ වේළුණු පාසි තොගයක් ගෙනැවිත් කුඩාරම පුරා අතුරන එක. ඒ නිදාගන්නටයි. කොට්ට විදිහට අපේ ගමන් මළු තිබුණා. ඉඩකඩ මදි වුණත් ඇතුළේ බොහෝ ම සුවපහසුයි, උණුසුමයි. අපි ටිකක් තද බද වෙලායි හිටියේ.

වෙන කොහේවත් නොයන්නට අපි තීරණය කරලායි තිබුණේ. ඒ අපට මැරෙන තරං මහන්සි දනුනු නිසා. ඒකේ කොහෙත් ම පුදුමයක් නෑ. හිතලා බලන්න අද දවසට අපි ඇවිදපු තරමක්, - නගරේ ඉඳලා මෙහේට ආවේ පයින්. ඊට පස්සේ කැලේට ඇවිදගෙන ගියා, ඊට පස්සේ ගඟට, එතැන ඉඳන් ආපහු ගෙදරට, ආයෙත් කැලේටයි ගඟටයි, එතනින් ආපහු ගෙදරට. සාමාන්‍ය මිනිහෙක් මාසයක් ඇවිදින තරං දුරට වැඩිය අපි එක දවසට ඇවිදලා. ඒ ඇර අපි කුඩාරමකුත් හැදුවා.

දැන් අපි ඉඳගෙන ඉන්නේ ගෙදර පඩිය උඩ. ඒ ටිකක් විවේකයකටයි. මම ෆවුන්ටන් පෑනෙන් දිනපොත ලියනවා. පව්ලිකුයි සෙර්යෝෂායි වටපිට දර්ශනය රස විඳිනවා. මේක හරි ම සුන්දර, සංසුන් සැන්දෑවක්. කොහෙත් ම හුළඟ හැමීමක් නෑ. ගස් වැල් හෙළවිල්ලක් නැතිව සංසුන්. ඇස්පෙන් ගස්වල කොළ විතරක් යාන්තමට වෙව්ලනවා. ඒවා පේන්නේ හරියට රිදියෙන් හදලා වාගේයි. අහස පැහැදිළියි, ලොකු රතුපාට හිරු කැලේ පිටිපස්සෙන් ගිලීගෙන යනවා. සමූහ ගොවිපොළේ හරක් ආපසු

ගාලට දක්කාගෙන යනවා. එළදෙන්නු යන්නේ කම්මැලි විදිහට ගාට ගාටා. උන් පණහක් විතර එතැන ඇති- කළු, දුඹුරු, රතු, පුල්ලි වැටුණු, ඉරි වැටුණු, සමහර රෝස පාට එවුනුත් ඉන්නවා. දැන් හිරු භාගයක් ම හැංගිලා. මිනිත්තු කීපයකින් අපි අපේ කූඩාරම ඇතුළට බඩගානවා, නිදා ගන්න. තාම කළුවර වෙලා නෑ. ඒත් ඉක්මනට ම එහෙම වේවි. අපිට බොහෝ ම සැප පහසු තැනක් නිදා ගන්ට තියෙද්දී අන්ධකාරේ වාඩි වෙලා ඉන්න එකේ කිසි ම බුද්ධිමත් කමක් නෑ.

ජූනි 09

ඊයේ රෑ අපිට ඒ තරං නින්දක් ලැබුණේ නෑ. මේකයි සිද්ධ වුණේ. පවුලික් කපටියි. එයා ඉස්සෙල්ලා ම කූඩාරමට ගිහින් මැදින් තැනක් අල්ලාගත්තා. සෙර්යෝෂාටයි මටයි ඊට පිටිනුයි ඉඩ ඉතුරු වුණේ. සෙර්යෝෂා කෙළින් ම නින්දට වැටුණා. ඒත් මට කොහෙත් ම නින්දක් ආවේ නෑ. මුලදී මට හොඳ සැප පහසුවක් දැනුනා, ඒක කොච්චරද කියනවා නං මට හිතුනා මිනිස්සු මොකද මේ තරමට ඇඳන්, මෙට්ට, කොට්ට වගේ දේවල් හද හදා කරදර වෙන්නේ කියලා. ඒවා නැතත් බොහො ම හොඳින් නිදා ගන්න පුළුවන් නොවැ. ටික වෙලාවකට පස්සේ මගේ ඔළුව කකියන්න පටන් ගත්තා. මල්ල ඇතුළේ ඔච්චර තදට තියෙන්න් මොනවාදැයි හිතාගන්න මං උත්සාහ කළා. මැකරෝනිද නැත්තං ධාන්‍ය කෑමද... මල්ලට ඇනලා බලලා හොයා ගත්තේ මං නිදාගෙන ඉන්නේ උයන හට්ටිය උඩ බවයි.

"මං වැරදිලා අරන් තියෙන්නේ පව්ලික්ගේ මල්ල වගෙයි" එහෙම හිතුව මම ගමන් මල්ල අනිත් පැත්ත හරවා ගත්තා. ඒත් අනිත් පැත්තෙත් මොනවාදෝ ජාතියක භාජනයක්. මම ගමන් මල්ල ඒ අතට මේ අතට පෙරළමින් උත්සාහ කළේ ඔළුව තියාගන්නට මොනවා හරි මෘදු දෙයක් සමහර විට රෝලක් වැනි දෙයක් හොයා ගන්නයටයි.

"මොනවද ඔය හොයන්නේ?" පවුලික් ඇහුවා.

"රෝල් එකක්"

"මොකක්! දැනට ම බඩගිනි වෙලාද?"

"බූරු කතා අහන්න එපා"

"නැත්තං, වෙන මොකටද රෝල් එකක්?"

"ඔළුව තියාගන්න. මේ මල්ල හරි තදයි"

"සිනිඳුවා!" පව්ලික් තියෙව්වා.

"බලනවා ටින් එකක් උඩ ඔළුව තියලා නිදාගෙන කොහොමද කියලා" මම කීවේ එකට එක.

මට රෝලක් හොයා ගන්නට බැරි වුණත් අන්තිමේ මොකක්දෝ කඩදාසි බෑගයක් හමුවුණා... ඒකෙ තියෙන්න වැඩියක් ම ඉඩ තිබුණේ සීනි... ඒක උඩ හිස තියාගෙන යාන්තම් නින්දට හරි බරි ගැහෙන කොට ම මගේ කොන්ද රිදෙන්න වුණා. මං හිතන්නේ ඒ එකම විදිහට හුඟ වෙලාවක් දිගාවී හිටිය හින්දායි. ඉතිං මම අනිත් පැත්තට පෙරළුණා.

"තාච්චියක දාපු ආඳෙක් වගේ ඇඹරෙන එක නවත්තනවකෝ" පව්ලික් මැසිවිලි කියන්න වුණා.

"මොකෝ, මට ඕන නං ඇඹරෙන්න බැරිද?"

"තමුසේ මාව තල්ලු කරනවා, ඒකයි!"

"සිනිඳුවා... තල්ලුව උහුලන් ඉන්ඩ බෑ"

ඒ එක්කම මගේ පැත්තකුත් රිදෙන්නට වුණා. සෑහෙන වේලාවක් නැගිටලා හිටිය මම නිදාගන්න තදින් උත්සාහ කළා. ඒත් කිසිම පලක් නෑ. මම මුනින්තලාවී දිගාවුණා.

"ටිකක් දඟලන්න්න නැතුව ඉන්ඩ බැරිද තමුසෙට. ඔහොම උඩ පනින කොට අනිත් අය බුදියන්නෙ කොහොමද?" පව්ලික් ඤැරු ඤූරු හඬ නඟන්නට වුණා.

"ෂ්... තමුසෙට තත්පරෙන් නින්ද යාවි" මට ඒ වචන යාන්තම් පිට කරගන්න විතරයි පුළුවන් වුණේ. ඒත් එක්ක ම මුළු කූඩාරම ම අපේ ඇඟ උඩට කඩා වැටුණා. මම අහම්බෙන් කූඩාරමේ කණුවකට පයින් ගහලා.

"මොට්ට බූරුවා! ඔන්න කළා වැඩේ, දැන් ඉතිං ඔක්කොම ඉවරයි!" පව්ලික් හඬ තැලුවා.

සෙර්යෝෂා අතු අස්සෙන් හිස එළියට දම්මේ නිදිමතේ ම ඇසි පිල්ලම් ගසමින්

"මේ මොන ජාතියක විහිළුවක්ද ඈ?" ඔහු ගෙරෙව්වා.

"මෙන්න මේ මොට්ට මෝල් අලියගෙ වැඩක්. හ්ම් දැන් නැගිටලා

ඇවිත් මේක හදාගන්න උදව් කරනවා" පව්ලික් කීවා.

සුන්බුන් අස්සෙන් බඩ ගෑ අපි ආයෙත් වහල සෑදීම ඇරඹුවා. තදින් අඳුර වැටෙන්නට පෙර අපේ කටයුතු අවසන් කරගන්නට, අපට තවමත් ප්‍රමාණවත් තරමට ආලෝකය තිබුණා. මේ සැරේ පළමුවෙන් ඇතුළට රිංගා ගත් මම අනෙක් අයට කලින් මැද තැන අල්ලා ගත්තා.

"ඒයි... ඔතන මගේ තැන!" පව්ලික් විරෝධය පෑවා.

"මේක චිත්‍රපටි හෝල් එකක් නෙවේ. ආසනවල අංක ගහලා නෑ"

ඔහු මා තල්ලු කොට දමන්නට උත්සාහ කළත් මම ටිකක්වත් සෙළැවුණේ නෑ. ඉතිං ඔහු පිළිකුළෙන් නහයෙන් පිඹිමින් කෙළවරින් දිගාවී ගත්තා. ඔහුත් බොහෝ සුවපහසුවකින් සිටියේ නැති බවක් මට පෙනුනා. ඒ ඔහු බොහෝ වතාවක් එහා මෙහා පෙරළුණු නිසායි. දිග වේලාවක් යනතුරු මටත් නිදා ගන්නට පුළුවන් වුණේ නෑ. අන්තිමේ මම කිරා වැටෙන්නට වුණා. කොපමණ වෙලා නිදා ගත්තාදැයි මම දන්නේ නෑ, මොනවා හීනෙන් දැක්කාද කියාවත් මට මතක් කර ගන්නට බෑ. ඒත් භයානක පාරක් ඔළුවට වැදුනායින් මම ඇහැරුණා. මොනවා වුණාද, ඉන්නේ කොහේද කියලා ටික වෙලාවක් යනතුරු මට තේරුම් ගන්න බැරි වුණා. ඒත් ඊට පස්සේ මට පෙනුණේ කූඩාරම ආයේත් කඩා වැටී ඇති සැටියි. පොලු ටික කෙළින් ම ඇද වැටී තිබුණේ මගේ ඔළුවටයි. ඒ වෙලාවේ තිත්ත කළුවරයි. හුඟක් දුර ඈත තරුවල යාන්තමට දිළිසෙන එක ඇරුනහම අහස ම අන්ධකාරයි. අපි ආයේත් පිටතට බඩගෑවා.

"මම හිතන්නේ ආයෙත් හදන්න වෙයි වගේ" සෙර්යෝෂා ඈනුම් ඇරියා.

"මේ කළුවරේ කොහොම හදන්ඩද?"

"මෙහෙමයි, අපට උත්සාහ කරලා බලතහැකි, එළිමහනේ හොඳහැටි නිදාගන්ඩ බෑ"

පොලු ටික සොයමින් අපි අතු ගොඩ අස්සේ අත පත ගෑවා. අපිට කෙළින්ම තුනක් හමු වුණත් හතරවැනි එක නැතිවෙලා තිබුණා. ඒක සොයමින් අපි හැමතැනම ගියා. අන්තිමේදී ඒක සොයා ගනිද්දී අනෙක් තුන අපි අතින් නැතිවෙලා. තවත් ටික

වෙලාවක් අතපත ගාමින් සෙවූ අපිට අන්තිමේ පොලු සියල්ල ම සොයා ගන්නට පුළුවන් වුණා. ඒවා හිටවන්නට යන විට ම පවුලික් කතා කළා.

"පොඩ්ඩක් ඉම්මු, කොහේද අපේ කඳවුර"

"මොන කඳවුරද?"

"අපේ ගමන් මලුයි අනිත් දේවලුයි තියපු තැන"

අපි ගමන් මලු සොයන්නට අන්ධකාරය අස්සේ එහා මෙහා ඇවිදින්නට වුණා. ඒත් ඒවා අතුරුදහන් වෙලා ගිහින්. ඒවා හෙවිල්ල අතහැර දාපු අපි වෙනින් තැනක කූඩාරම හදන්න තීරණය කළා. පව්ලික් පොලු හිටවන අතරේ සෙර්යෝෂාත් මමත් අතු එකතු කළා.

"ඉක්මනට මෙහේ එනවා!" සෙර්යෝෂා හිටි අඩියේ ම හඬ තැලුවා. "මට කොළ අතු ගොඩක් ම හම්බ වුණා"

මම ඔහු සිටි තැනට ගියා. ඇත්තට ම එතැන පොළොවේ කොළ අතු ගොඩක් ම තිබුණා. උස්සාගෙන යන්නට පුළුවන් තරමට කරට ගත් අපි ඒවා පව්ලික් ළඟට අරගෙන ගියා. ඊළඟ තොගය ගෙනියන්නට ආ වෙලාවේ සෙර්යෝෂා මෙහෙම කීවා.

"පොඩ්ඩක් ඉන්නවා, මෙතන මොනවදෝ තියනවා"

"කොහේද?"

"මෙතන කොළ අතු ගොඩ යට. මොනවා හරි මල්ලක්"

මම නැමිලා අත පත ගෑවා. කළුවරේ ම මට මල්ලක් අහුවුණා.

"ඔව් තමා. ඒක පිරිලාත් එක්ක, බලනවා. ඊට එහායින් තවත් එකක් තියෙනවා"

"හරිම අපූරුයි, මලු දෙකයි"

"හෝ... මෙන්න තව එකක්"

"මලු තුනක්! කවුරු වෙන්ඩ ඇද්ද මේවා මෙතන දාලා ගියේ?" සෙර්යෝෂා හඬ තැලුවා.

"මළ විකාර... මේවා අපේ"

"අපේ?"

"අපේ තමා. ඒවා අපේ ගමන් මලු"

"ඒකත් එහෙමද! මේවා මෙතන තියෙයි කියලා හොයන්න කවුරු හිතාවිද?"

පාව්ලික්ට කතා කළ අපි අපේ සොයා ගැනීම් පෙන්නුවා. අපි

අපේ ගමන් මලුත් උස්සාගෙන අලුත් තවාතැනට ගමන් කළා. ඇතුළට මුලින් ම රිංගා ගන්නට හිතාගෙන මං ගියේ ඉස්සරහින් ම යි. ඒත් මට දොර හොයා ගන්න බැරි වුණා. මම කූඩාරම වටේ දිගට ම දිගට ම ඇවිදගෙන ගියත් එය හැම පැත්තෙන් ම වහලායි තිබුණේ.

"ඒයි කොහේද දොර?" මම ඇහුවා.

"හප්පේ.... වැඩේ තමා... මට දොරක් තියන්ඩ අමතක වුණා"

පරිස්සමින් අතු කීපයක් එහා මෙහා කළ පව්ලික් ඇති තරමට ඉඩක් හැදුණු හැටියේ ම ඇතුළට රිංගාගෙන මැදින් දිගාවී ගත්තා. මං හිටියේ වාද කරන්න බැරි තරමට මහන්සියෙන්. ඉතිං මං සෙර්යෝෂා කළා වගේ වචනයක් වත් කතා කරන්නේ නැතිව පැත්තකින් ඇල වුණා. ආයේමත් සැරයක් මගේ ඔළුවට යටින් තද මොකක්දෝ දෙයක්- උයන හට්ටි නැත්තං වෙනින් භාජනයක්- ඒත් මං හිටියේ හොඳට ම මහන්සියෙන්. ඉතිං මම කෙළින් ම නින්දට වැටුණා. ඉතිං ඕකයි කතන්දරේ.

දැන් ඉතිං උදේ. මම අනිත් අයට කලින් නැගිට්ටේ මගේ දිනපොත ලියන්නයි. ඉර ඉහළ නැගලා. දැනට ම සෑහෙන්න රස්නෙයි. අපැහැදිළි සුදු වළාකුළු අහසේ පාවෙනවා. ගමේ එළදෙන්නු හඬ නගන හැටිත් බල්ලෝ බුරන හැටිත් මට ඇහෙනවා. සෙර්යෝෂාත් පව්ලිකුත් තවමත් කූඩාරම ඇතුළේ සැපට නිදි. මං දැන් මිනිත්තුවකින් ඒ ගොල්ලන්ව ඇහැරවන්නයි යන්නේ. අපි උදේ කෑම ගන්නයි සූදානම. මම බඩගින්නේ හාමත් වෙලා.

එදාම සවස

උදේ කෑමට පස්සේ අපි කැලෑවට ගියා අපේ උගුල පරීක්ෂා කරන්න. ඒක හිස්. ඉතිං අපි තීරණය කළා ආයේත් මී මැස්සන් පස්සේ යන්න. ඊළඟ පැය දෙක ම අපි ගෙව්වේ උන් පස්සේ බඩගාමින්. අන්තිමේ පාව්ලික්ගේ ඉවසීම හිඳුනා. එයා මී මැස්සා ආපසු මී වදයට යවන්න උං බය කරන්නට උත්සාහ කළා. ඒකට එයා කළේ කෑ ගසන්නටත්, අත් වනන්නටත්, අඩි පොළොවේ හප්පන්නටත් ගත් එකයි. මී මැස්සා කේන්තියෙන් පාව්ලික්ගේ

ඔළුව වටේ සූ හඬ නඟන්නට වුණා. එක සැරේට ම පාව්ලික් මහ භයානක විදිහට බෙරිහන් දෙන්න ගත්තා. මී මැස්සා එයාට විදලා. පාව්ලික්ගේ කන රතු වෙලා ඉදිමෙන්න වුණා.

පාව්ලික්ට යකා නැග්ගා. "ඔය හෙණ ගහච්ච මී මැස්සෝ! මට ඕකුන් එපා වෙලා. තමුසෙලා කැමතිනං උන් එක්ක ඕන දානයක් කර ගන්නවාලා. අපොයි මගේ කනේ ලස්සන කොහොමද?"

"ඒකට කමක් නෑ, ඔය වේදනාව ඉක්මනට නවතීවි"

"තමුසෙලාට නං කීවැහැකි. තමුසෙලා දන්නෙ නෑ මේකේ රඟ. අපොයි බොලේ... මම දැන් මොනවා කරන්නද?"

"ඕක ලේන්සුවකින් වෙලුවොත් වත්?" මම යෝජනා කළා.

"නෑ... මං ගඟට ගිහින් ඒක තෙමනවා"

පාව්ලික් එයාගේ කන තෙමන්නට ගිය අතරේ මමත් සෙර්යෝෂාත් දිගට ම මී මැස්සන් පස්සේ ඇදුනා. අපි ඒක කළේ මාරුවෙන් මාරුවටයි. කෙනෙක් මී මැස්සා බලා ගන්නා අතරේ අනිත් කෙනා විවේක ගත්තා. අපි බලා හිටියා හිටියා.... අපි බලාගෙන හිටියා. මී මැස්සා හිටි හැටියේ ම ඉහළට නැගලා ඈතට පියෑඹුවා. අපි ඌ පස්සෙන් දුවන්නට වුණා. ඒත් ඌ

කොච්චර උඩට නැග්ගද කියනවා නං ඌ අපට පේන්නේ නැතිව ගියා.

"මොන ලැජ්ජාවක්ද! දැන් ඉතිං අපිට ආයෙත් පටන් ගන්න වෙනවා" සෙර්යෝෂා කීවා.

එතකොට ම පාව්ලික් ගඟේ ඉඳලා දුවගෙන ආවා. එයාගේ අතේ තිබුණු තොප්පියේ මොනවාදෝ තිබුණා.

"බලනවකෝ මොනවද මට හම්බ වුණේ කියලා!" එයා කෑ ගහලා කිව්වා.

ඒ මොනවාදයි බලන්නට අපි පව්ලික් ළඟට දිව්වා. තොප්පිය පිරිලා හිටියේ පණ පිටින් කාප් පැටව්.

"කොහෙන්ද උන් හොයා ගත්තේ?"

"ගඟ ළඟ වගුරෙන්"

"බිළී පිත්තක් හරි වෙන මොකක්වත් හරි නැතුව උන්ව අල්ලා ගත්තෙ කොහොමද?"

"එතන වතුර නැති ගානයි. මං උන්ව නිකම් ම අල්ලා ගත්තා. හරි දැන් අපි මාළු සුප් එකක් හදමු"

වගුර ළඟට ආයේත් අපි දිව්වා. තවත් මාළු අල්ලාගෙන ආව අපි බොහෝ ම රස මාළු සුප් එකක් හදා ගත්තා. ඉන් පස්සේ අපි ආයෙත් ගඟ දිහාවට ගියේ රෑ කෑම වේලට තවත් මාළු ටිකක් අල්ලා ගන්නයි.

"ආන්න තොගයක් ම, අපිට හැමදා ම රෑ කෑමට මාළු කන්න පුළුවනි" පව්ලික් කීවා.

හවස කෑම වේලෙන් පස්සේ අපි මී මැස්සන් පස්සේ දුවන්නට ආයෙත් කැලෑවට වැදුණා.

"අපි උන්ට වතුර ටිකක් ඉහලා බලමු. උන් වහිනවා කියලා හිතලා වදේට පියාඹාවි"

හට්ටියට වතුර පුරවාගත් අපි අපිට මුලින් ම හමුවුණු මී මැස්සාට ඒවා ඉස්සා. ඌ මල් නටුව දිගේ බඩගාගෙන ගිහින් කොළ පාට කොළයක් යටින් හැංගුණා. ඌ බලා හිටියේ වැස්ස නවතිනකං වෙන්නට ඕනෑ. මොකද ඉක්මනට ම එළියට ආව ඌ අව්වට වෙලා ඉඳගෙන තමන්ව වේලා ගත්ත හින්දා. වේළුණු හැටියේ ම ඌ තටු විහිදලා ඈතට පියෑඹුවා. අපි ඌ පස්සේ එලවන්නට යද්දී ම ඌ මලක වහලා ආයෙත් රොන් එකතු කරන්නට වුණා.

සෙර්යොෂා කටපුරා වතුර පුරවලා මී මැස්සාගේ ඇඟට විද්දා. එත් මී මැස්සා නම් ගෙදර පියෑඹුවේ නෑ. වේලෙන තුරු බලා හිටිය උං ආයේත් මලෙන් මලට පියාඹන්න වුණා.

"මොන මුරණ්ඩු මී මැස්සෙක්ද!" සෙර්යොෂා එහෙම කියලා ආයෙත් උංට වතුර පාරක් විද්දා. මේ වෙලාවේ නම් අසරණයා හොඳට ම තෙතබරි වුණා. උගේ පියාපත් ඇකිළිලා පිටට ඇලී ගියා.

'වැස්සේ' නැවතීමක් පේන්නේ නැති බව දැක්ක මී මැස්සා තටු වේළුණු හැටියේ ම ඈතට ඉගිල්ලුණා. අපි උං පස්සේ දිව්වා. මුලදී උං ඉගිල්ලුනේ පොළොවට කිට්ටුවෙන්, ගස් කඳන් අතරිනුයි. ඒත් ඊට පස්සේ උං උඩට නැගලා අපට නොපෙනී ගියා. එයින් පස්සේ අපි අනිත් මී මැස්සන්ටත් වතුර විදලා බැලුවා. ඒත් උන් හැම එකෙක් ම ක්‍රියා කළේ එක ම විදිහටයි. මුලදී උන් කොළයක් යටින් හැංගෙනවා, ඊට පස්සේ එළියට ඇවිත් අව්ව තපිනවා, ඊළඟට ඈතට ඉගිල්ලෙනවා. අපිට එක ම මී මැස්සෙක් පස්සේවත් යන්නට බැරි වුණා. ඒ උන් පියෑඹුවේ හුඟක් උඩින් වගේ ම ඉතා ම වේගයෙන් හින්දායි. හැම මී මැස්සෙක් ම යන්නට යන තුරාම අපි මේ වැඩේ යෙදුනා. ඒ වෙනකොට ඉරත් බැහැලා ගිහින්. අපි ආපහු අපේ කඳවුරට ඇවිත් රෑ සැහැල්ලු ආහාරය සූදානම් කළා.

තෝල්යා නැන්දා මොකක්දෝ හේතුවක් හින්දා තව ම ත් ආපහු ඇවිත් නෑ. තවත් එක රැයක් අපේ කූඩාරමේ ගෙවන්නට අපි තීරණය කළා. මං හිතන්නේ අපි හැබෑට ම ආපහු ගෙදර යන්න ඕනෑ කියලායි. ඒත් සෙර්යොෂායි, පාව්ලිකුයි කියන්නේ අපි තව එක රැයක් හිටියාට ඇති දෙයක් නෑ කියලා. මොකද අපි මොනවා වුණත් හෙට ගෙදර යන හින්දා. මේ සැරේ අපි තීරණය කළේ රෑට ඔළුව උඩ කඩා වැටෙන්නේ නැති කූඩාරමක් හදාගන්නටයි. සෙර්යොෂායි, පාව්ලිකුයි දැනට ම බරට ම වැඩ. ඒ ගොල්ලෝ කණු වැඩියෙන් ගැඹුරට හිටවනවා. ඒ අතරේ මම අපේ වීර ක්‍රියා ගැන මගේ දිනපොතේ ලියනවා. අහස කළු වලාකුළුවලින් පිරිලා. කලින් තිබුණාට වඩා හුළඟ හීතලයි වගේ ම සැරයි. රෑට වැස්සොත් හෙම මොනවා වෙයිද? වැහි වතුර එළියට ගලාගෙන යන විදිහට අපි කූඩාරම කොළ අතු හුඟකින් වට කරන්නට ඕනෑ. ලියන එක නවත්තලා මම සෙර්යොෂාටයි

පව්ලික්ටයි උදව්වට යන එකයි හොඳ.

ජූනි 10

අපිට ඊයේ රෑ නම් කිසි ම අකරතැබ්බයක් නෑ. ඒ අපි කූඩාරම හරියට හැදුව හින්දා. හරියට හදන එකෙන් නිතර ම වන්දිය ලැබෙනවා. ඊට පස්සේ පුළුවනි නිදාගන්න, වහළ ඔළුවට කඩා වැටෙයි කියලා බයක් නැතුව. රෑ වැස්සෙත් නෑ. මම පාන්දරින් ම ඇහැරුණා. කුරුල්ලෝ මාව ඇහැරෙව්වා. උන්ට පුළුවන් තරමට හයියෙන් කීචි බීචි, චිරි බිරි ගාන්න පටන් ගනිද්දී එළිය වැටිලා නැති තරම යි. මම කූඩාරමෙන් එළියට බඩගෑවාට පස්සේ පෙනුනේ ඉර තාමත් පායලා නැති බවයි. අහස පැහැදිළි ළා නිල් පාටයි, සබන් පෙණ වගේ මෙළෙක, සිනිඳු සුදු වලාකුළු පොළොව උඩින් පාතින් පාවුණා. ටිකෙන් ටික ඒවා ලොකුවෙලා වාෂ්පයක් වගේ උඩට උඩට ගිහින් මුළු අහස ම වසා ගත්තා. ටික වේලාවකට පස්සේ ඒවා තද රෝස පාටකට, ඒ කියන්නේ ස්ට්‍රෝබෙරි අයිස් ක්‍රීම් පාටට හැරුණා. ඒ ඔක්කෝම කාලා දාන්ඩ පුළුවන් වේවිද? අපේ අන්තිම කෙනාට එනකම් ම ඒවා ඇති වෙයි. ඒත් තව ටිකක් ඉතුරු වේවි. මං හිතන්නෙ නෑ මුළු ලෝකෙ ම ඉන්න මිනිස්සුන්ට ඔච්චර අයිස් ක්‍රීම් කන්න පුළුවන් කියලා. මේ දේවල් හිත හිතා ඉන්න අතරේ මම දැක්කා විශාල රතු පාට ඉරක් පොළොව උඩට නගිනවා. එක සැරේට ම හැම දෙයක් ම දිළිසෙන්නටත්, බබලන්නටත් වුණා. කොළපාට තණ කොළ තවත් කොළපාට වෙලා පෙනුණා. හැම තණකොළයක ම පුංචි පිණි බිංදුවක් ගානේ තිබුණා. ඒවා දිළිසුනේ දියමන්ති වාගේ. මේ ලස්සන බලන්න මම සෙර්යෝෂාවත්, පව්ලික්වත් ඇහැරෙව්වා. ඒත් ඒ ගොල්ලෝ ඇස් පිහදාගන්නටත් කලින් පිණි නැතුව ගිහිල්ලා, බලන්න තරම් දෙයක් ඉතුරු වෙලා තිබුණේ නෑ.

"අයියෝ... තමුසෙලා නං නිදිකුම්බරයෝ. ගුලකට රිංගා ගත්ත මී ජෝඩුවක් වගේ මහ දවල් වෙනකං නිදි! උදෙන් ම ඇහැරුණේ නැත්තං තමුසෙලාට මොකවත් ම කොහෙත් ම බලාගන්ඩ හම්බ වෙන්නේ නෑ"

පව්ලික් ඇඤුමක් යවලා අතපය හිරි ඇරලා උදේ කෑමට මාළු

සුද්ද කරන්නට වුණා. ඒත් සෙර්යෝෂා කීවේ අපි මුලින්ම ඇඟපත සෝදා ගන්නට ඕනෑ බවයි. ඉතිං අපි රංචු ගැසී ගොස් ගඟේ ගිලුණා. ඊට පස්සේ උදේ කෑම සූදානම් කරන්නට ආපසු ඇවිත් මාළු බැද්දා. අපේ ගමන් මලුවල පිටි ටිකක් තිබී හමුවුණු නිසා පව්ලික් වෙල්ලවැහුම් කීපයක් සෑදුවා. ඒවා එච්චර ම හොඳ නෑ. ඒත් ඒකෙන් මට හොඳ අදහසක් ආවා.

"අපි මී මැස්සන්ට පිටි ටිකක් ඉහිමු. ඒකෙන් උන්ගේ ඇඟ බර වෙලා උන්ට වේගෙන් පියාඹන්න බැරි වේවි"

ඒ යෝජනාව පිළිගැනුණා. අපි අපට මුණ ගැසුණු පළවෙනි මී මැස්සාට පිටි ටිකක් ඉස්සා. මී මැස්සා එක සැරේට ම තමන්ව පිරිසිදු කර ගත්තා. මිනිත්තුවකදී ඌ පිටි ඔක්කෝම ගසලා දාලා ආයෙත් රොන් උරන වැඩේ යෙදුණා.

"මං දන්නවා මොකද කියලා. අපි මුලින් ඌව තෙමලායි පිටි දාන්න ඕනෑ. එතකොට ඒවා ඇලෙනවා. මී මැස්සට ලේසියෙන් පිහදා ගන්ඩ බැරි වේවි" සෙර්යෝෂා කීවා.

අපි ඒකත් කරලා බැලුවා. සෙර්යෝෂා වතුර කටක් පුරවාගෙන කදිම ලෙසින් මී මැස්සාට විද්දා. පව්ලික් ඌට පිටි ඉස්සා. ඇඟ පුරා පිටි ඇළුණු මී මැස්සා තමන් පිරිසිදු කර ගන්නට ගත්තා. ඌ ඔළුවත් ඇසුත් ඉස්සරහා කකුල් වලින් පිහදාන අතරේ ම බඩත් තටුත් පිහ දැම්මේ පිටිපස්සේ කකුල් වලිනුයි. සම්පූර්ණයෙන් පිරිසිදු වෙන තුරු ඌ හුඟාක් මහන්සියෙන් වැඩ කළා. (පිටේ තියෙන කුඩා තෙත පිටි පදාසය විතරක් ඉතුරු වේලා තිබුණා) අපි තවත් වතුරයි පිටියි වඩියක් ඌට දෙන්නටයි සූදානම් වුණේ. එතකොට ම ඌ තටු විහිදලා ඉගිල්ලිලා ගියා. අපි ඌ පස්සේ පැන්නුවා. මුල දී ඌ ඉගිල්ලුණේ හෙමින්, ඒත් ඊට පස්සේ වේගයෙන් ඉගිල්ලිලා ඉක්මනින් ම කැලෑව පහුකරගෙන කුඹුර දිහාවට ඇදෙන්නට වුණා. අපි ඌ පස්සේ දිව්වේ පිස්සු හැදිලා වගෙයි. අපි ගොඩැලි උඩින්, ගස් කඳන් උඩින් වගේ ම කාණු හරහා පහත් තැන් හරහා පැන්නා. ගෝවා පාත්තියක් උඩින් ඌ පස්සේ පැන්නුව අපිට එක සැරේට ම ඉස්සහර මුණ ගැහුණේ ලෑලි වැටක්. මී මැස්සා කෙළින් ම වැට උඩින් ඉගිල්ලී අතුරුදහන් වුණා. අපිත් වැටට උඩින් පැන්නා. ඒක වත්තක්. හිතලා බලන්නකෝ අපි කොච්චර පුදුම වුණාද කියලා මී මැසි පෙට්ටි



පේළියක් ම දකින්න ලැබුණා ම. ඒවා හැම එකක් ම හරියට ම අපි හැදුව මී මැසි පෙට්ටිය වගේ ම යි. එක මී මැසි පෙට්ටියක් පැත්තකින් වයසක මනුස්සයෙක් පුදුමයෙන් වගේ අපි දිහා ඇස් ඇරගෙන හිටගෙන බලා උන්නා.

"හ්ම්.... දැන් ඉතිං මොනවද උඹලට කියන්ඩ තියෙන්නේ?" එයා ඇහුවේ රළු පරළු විදිහට.

අපි එතන හිටගෙන හිටියේ ඇස් උළුප්පාගෙන, පඹයින් මෙන්.

"අ....අ....ම්...මොකුත් නෑ" පව්ලික් ගොත ගහමින් ආපහු වැට උඩට නැග්ගා.

"මොකද ඔය වැට උඩ බඩගාන්නේ? ගේට්ටුවක් තියෙනවා නොවැ!" වයසක මනුස්සයා කීවේ තරවටු කරන විදිහෙන් අත හොළව හොළවා.

"...මං ගේට්ටුව දැක්කේ නෑ" එහෙම කිව්ව පව්ලික් අතුරුදහන් වුණා.

සෙර්යෝෂායි මායි වයසක මනුස්සයා එක්ක ඉතුරු වුණා. මං බල බලා හිටියේ කොයි පාරෙන් ගැලවිලා යන්නද කියලායි. එතකොට නාකි මනුස්සයා මෙහෙම ඇහුවා.

"උඹලා මොනවද මෙහේ කරන්නේ තක්කඩියනේ?"

"අපි.... මේ.... මේ... අපිට වැරදීමක් වුණා" මම කියා ගත්තා.

"අපේ මී මැස්සා ඔයාගෙ වත්තට පියැඹුවා, අපි ඌ පස්සෙන්

එළවාගෙනයි ආවේ" සෙර්යෝෂා පැහැදිළි කළා.

"නුඹලගේ මී මැස්සා?" වයසක කෙනා පුදුමෙන් බැලුවා. "වෙන්ඩ බෑ! උං මගේ මී මැස්සෙක් වෙන්ඩ ඕනෑ"

එතකොටයි අපි දැක්කේ වත්ත මී මැස්සන්ගෙන් පිරිලා තියෙන හැටි. උන් හතර අතේ ම ඉගිල්ලෙනවා. උන්ගේ සූ සද්දෙන් මුළු වටපිටාව ම පිරිලා.

"ඇයි නුඹලා මී මැස්සා පස්සේ පැන්නුවා?"

උං කැලෑ මී මැස්සන් සිටින ගස් බෙනයකට ගමන් කරාවි කියා අපි හිතූ බව අපි කීවා.

"නුඹලාට මොකටද මී මැස්සො ඕනෑ?"

අපේ පුරෝගාමී කණ්ඩායම මී මැස්සන් ඇති කරන්නට තීරණය කළ හැටි අපි විස්තර කළා. වයසක සීයා අපට බනින්නේ නැති බව වැටෙන් එහා ඉඳන් අහගෙන හිටිය පව්ලික් හෙමින් අපි ගාවට ආයෙත් ආවා. අපි කැලේ එල්ලුව මී මැසි උගුල ගැනත් සීයා එක්ක කීවා. එයා මේ ගැන හුඟක් උනන්දු වෙන බව පෙනුනා.

"මී මැස්සෝ ඇති කරන එක අපූරු දෙයක්. හුඟාක් ප්‍රයෝජනවත් රස්සාවක්. ඒත් කැලෑ මී මැස්සන් අල්ලා ගන්න එක එච්චර ලේසි නෑ. ඇරත් මේ හරියේ උන් එකෙක්වත් නෑ. ඔයාලගේ උගුලට අහුවුණොත් අහුවෙන්නේ ඉබාගාතේ ගිය මී මැස්සෙක් විතරයි"

"එතකොට අපි මොකද කරන්නේ?"

"මං ඔයාලට පටන් ගන්න ටික දෙනෙක් දෙන්නං. මට පේනවා ඔයාලට මී මැස්සන් ඇති කරන්න හැබෑවට ම ඕනෑකම තියෙනවා කියලා. මී මැසි ඇති කරන්නෝ එකිනෙකාට උදව් කර ගන්ඩ ඕනෑ"

මගෙ හදවත ප්‍රීතියෙන් උඩ පැන්නා. මං හිතුවේ සීයා ඒ වෙලාවෙ ම අපිට උන්ව දේවි කියලායි. ඒත් එයා මෙහෙම කීවා.

"හැන්දෑව වෙන්ඩ ඇරලා මේ පැත්තට එමුකෝ එහෙනං. වදෙන් පිටවෙන්ඩ කිට්ටු රංචුවක් මා ගාව ඉන්නවා. මට පුළුවන් ඔයාලට උන්ව ගෙනියන්ඩ දෙන්ඩ. ඒත් දාගෙන යන්ඩ මොනවා හරි විදිහක පෙට්ටියක් අරන් එන්න ඕනෑ"

"අපේ උගුල් පෙට්ටිය හරියාවිද?" මම ඇහුවා.

"ඔව් ඒක අපූරුයි. හවස තුනට හරි හතරට හරි ටිකක් රස්නෙ අඩු වුණා ම එමු"

අපි අපේ උගුල ගන්නට ආපහු කැලේට දිව්වා. දැන් අපි බලා ඉන්නේ සීයා වෙන්නට යන්නයි. ඉතිං අපි බලා ඉන්න අතරේ මං හිතුවා මගේ දිනපොත ලියන්න. ලියනකොට වෙලාව ඉක්මනින් ගෙවෙන හැටි මං දැකලා තියෙනවා. අපිට දැන් හුඟක් වෙලා බලා ඉන්න වෙන්නේ නෑ. මං බලාපොරොත්තු වෙනවා මී මැසි රංචුව එහේ ඉඳීවි කියලා. දැනට එච්චරයි.

පසුව

අන්තිමේදී අපට මී මැස්සන් ලැබුණා. සීයා පුදුම තරං කරුණාවන්ත කෙනෙක්. නිතර නිතර ම මී මැස්සන්ගෙන් ඇනුම් කන නිසා මම හිතුවේ හැම මී මැසි ඇති කරන කෙනෙක් ම කේන්ති යන අය කියලයි. ඒත් මේ සීයා අඩු ගානේ යාන්තං වත් කේන්ති යන කෙනෙක් නෙවෙයි. එයා හුඟාක් අපූරුයි, හිත මිතුරුයි. ඒ වගේ ම එයා පොරොන්දු ඉෂ්ට කළා. අපි එයාගෙ වත්තට ආපහු ආවා ම මී මැසි රංචුව සූදානම් කරලා තිබුණා. තුනී රෙද්දකින් වැසූ විශාල පෙනේරයක හැඩය තියෙන වටකුරු ලී පෙට්ටියකයි උන් හිටියේ. හප්පොච්චියේ, ඒකේ කොච්චරනං මී මැස්සොද! ස්ථිරව ම පෙට්ටිය උන්ගෙන් සම්පූර්ණයෙන් ම පිරිලා. සීයා තුනී රෙද්ද අයින් කරලා මී මැස්සන්ව අපේ මී මැසි උගුලට වක් කළා, හරියට ම මෑ ඇට හරි ඒ වගේ වෙන මොනවා හරි මල්ලක් හළනවා වගේ. ඉක්මනින් උගුල වැසූ අපි සීයාට ස්තුති කළා. එයා අපට පිටවෙන්න කලිං මී මැස්සන් පාලනය ගැන හැම ජාතියක ම උපදෙස් දුන්නා.

එයා අපට කීවේ මී මැස්සන්ව කෙළින් ම මී මැසි පෙට්ටියේ ඉටි රාමුවලට නිදහස් කරන්න කියලායි. පටන් ගැනීමේදී මී මැස්සන්ට හදාගත් පැණියක් ලබා දෙන්න ඕනෑ. ඒ උන් රොන් එකතු කරගන්න තුරු ආහාර වෙනුවෙනුයි. පැණිය හදාගන්නට නම් සීනි දිය කරන්නට ඕනෑ. ඒක පුංචි වීදුරු භාජනේකට වත් කරලා රෙදි කෑල්ලකින් කට බැඳලා මී වදය ඇතුළේ උඩු යටිකුරුව එල්ලනට ඕනෑ. රෙදි කෑල්ල අස්සෙන් පැණි හෙමින්

බේරී එන වෙලාවට මී මැස්සෝ ඒවා උරා බොනවා. තුනී රෙදි වලින් ඔළුවට දා ගන්න ආවරණ හදාගන්න හැටිත් සීයා අපට ඉගැන්නුවා. ඒ මී වදය අරින වෙලාවට ප්‍රයෝජනයට ගන්නයි. ඒ වගේ ම මී මැස්සන්ව ආපහු වදයට එළවන්න දුම් භාජනයක් හදාගන්න හැටි ගැනත් පෙන්නුවා. ඒක කේතලයක් වගේ කටකුයි මයින හමකුයි එකට මූට්ටු කළ වටකුරු යකඩ භාජනයක්. ඒකට වේළුණු දරකෝටු ටිකක් දමලා ගිනි තියන්න යි තියෙන්නේ. මයිනහම ඇද්දාම කටෙන් දුම් පිටවෙනවා.

"මී මැස්සෝ බොහෝම හිත ඇදගන්න පුංචි සත්තු ජාතියක්. මී මැස්සන් ඇති කරන්න යන ඕනෑ කෙනෙක් මුළු ජීවිතේ පුරා ම උන්ට ආදරේ කරනවා, කවදාවත් උන්ව ඇති කරන එක අතෑරලා දාන්නේ නෑ" සීයා කීවා.

"ඇයි ඒ?"

"උන් නැති වුණා ම පාළුවක් දැනෙනවා ඒකයි"

අන්තිමේ අපි සීයාට ආයුබෝවන් කියලා ගෙවල් බලා පිටත් වුණා. නගරෙට අපි එනකොට හුගාක් හවස් වෙලා. සෙර්යෝෂා මී මැස්සන් ටික එයාගෙ දිහාට අරගෙන ගියා. පව්ලික් එක්ක මම ගෙදර දිව්වේ අපේ ගෙවල්වල අයට අපි ආපහු ආව බව කියන්න යි. වැඩි වෙලා යන්නට කලින් අපි සෙර්යෝෂාගේ ගෙදරට එකතු වුණා.

අපි ගම්බදට වෙලා කාලය ගෙව්වේ කොහොමද කියලා සෙර්යෝෂාගේ අම්මා අපෙන් ඇහුවා. අපි බයවුණේ ඈ අපෙන් පෝල්යා නැන්දා ගැන අසාවි කියලයි. මොකද අපි ගස් අතු වලින් හැදුව කුඩාරමක උන්නා කියලා දැන ගත්තොත් ඈ මොනවා කියාවිදැයි අපි දැනගෙන හිටියේ නැති හින්දා. මී මැස්සන් ඇති කරන සීයා ගැන සෙර්යෝෂා ඉතා ම ඉක්මනින් කතා කරන්නට ගත්තා. එයාගේ අම්මා ඒ කතාවට බොහෝ උනන්දුවෙන් අහගෙන හිටියා.

"එතකොට පෝල්යා නැන්දට කොහොමද?" ඈ ඇහුවා.

අපිට උත්තර දී ගන්න වෙලාවක් ලැබුණේ නෑ. කවුදෝ දොරට තට්ටු කළා. ඒ පව්ලික්ගේ අම්මා. ඈ පැමිණියේ පව්ලික්ට රෑ සැහැල්ලු ආහාරය ගන්නට කතා කරන්නයි. අපි සැනසුම් සුසුමක් හෙළලා ඇයට මී මැස්සන් පෙන්නලා මී මැසි පාලක සීයා ගැන

කීවා. එතකොට සෙර්යෝෂාගේ අම්මා ආයෙත් මෙහෙම ඇහුවා.

"ඒත් ඇයි ඔයාලා පෝල්යා නැන්දා ගැන මොකවත් කියන්නෙ නැත්තේ?"

මොනවා කියන්නදැයි අපි දැනගෙන හිටියේ නෑ. වාසනාවට ඒ වෙලාවේ මගේ අම්මා පැමිණියා. අපි ඇටත් මී මැස්සත් පෙන්නලා උන්ව අපට දුන් සීයා ගැන කීවා. අපි ගම්බදට වෙලා හිටියේ කොහොමද කියලා මගේ අම්මාත් අපෙන් ඇහුවා.

"ම්, අපි බොහෝම අපූරුවට උන්නා..."

"මං හිතන්නේ ඔයාලා පෝල්යා නැන්දට එච්චර කරදර දෙන්ඩ නැතුව ඇති කියලා"

"මං එහෙම හිතන්නේ නෑ" මං එහෙම කීවේ ඒක බොරුවක් වෙන්න පුළුවන්ද ඇත්තක් වෙන්න පුළුවන්ද කියලා හරියට ම දන්නේ නැතුවයි.

"පෝල්යා නැන්දා අපිව බලන්න ළඟදීම ඒවිද?" සෙර්යෝෂගේ අම්මාටයි ඒක දැනගන්න ඕන වුණේ.

"න්... නෑ... අඩු ගානේ මං හිතන්නේ එහෙම නෙවෙයි. සෙර්යෝෂා උත්තර දුන්නා.

"එයා මොකුත් ම ඒ ගැන කිව්වේ නැද්ද?"

"නෑ, කිව්වේ නෑ"

කොහොමින් හරි ඒක නම් ඇත්තයි. මේ කතා බහ කොහෙන් කෙළවර වෙයිදැයි මම දන්නෙ නෑ. ඒත් හරියට ම ඒ වෙලාවේ කවුදෝ ආයෙත් දොරට තට්ටු කළා. අපි සැනසුම් සුසුමක් හෙළුවා. ඒත් වැඩි වෙලාවකට නෙවෙයි. දන්නවද කවුද ඇතුළට ආවේ කියලා. වෙන කවුරුවත් නෙවෙයි පෝල්යා නැන්දා! තිකම් ම අපේ කටවල් ඇරුණා.

"සුභ සැන්දෑවක්!" පෝල්යා නැන්දා කීවා.

"සුභ සැන්දෑවක්! අපි මේ දැන් ඔයා ගැන කතා කළා විතරයි, ඔයා අපිව බලන්න ඒවිද කියලා" ඒ සෙර්යෝෂාගේ අම්මා.

"ගොවිපොළේ ඉඳලා නගරේ පැත්තට එන ලොරියක් තිබුණා. ඉතිං මං ඒකෙන් වාසිය අරගෙන ඔයාලව බලන්න ආවා"

ඊට පස්සේ එයා සෙර්යෝෂා දිහාට හැරිලා මෙහෙම කීවා.

"කොහොමද සෙර්යෝෂා! මං ඔයාව දැක්ක කල්!"

සෙර්යෝෂා රතුවුණේ බීට්රූට් අලයක් වගේ.

"ඒ කොහොමද? ඔයා එයාව අද දැක්කෙ නැද්ද?" සෙර්යෝෂගේ අම්මා පුදුම වෙලා ඇහුවා.

පෝල්යා නැන්දාත් පුදුම වෙලා බැලුවා.

"මං එයාව කොහේදි දකින්නද?"

"ඇයි ශිෂිගිනෝ වලදිනේ"

"මං එහේ දවස් තුනකින් හිටියේ නෑ. මම තරාසොව් ගොවිපොළේ වැඩට ගියා"

අන්තිමේ වැඩේ එළියට ආවා.

"දැන් මෙහේ බලනවාලා, කොහේද නුඹලා එතකොට හිටියේ?" සෙර්යෝෂාගේ අම්මා ඇහුවේ තදින්.

"ශ්...ශිෂිගිනෝවල" සෙර්යෝෂා ගොත ගැහුවා.

"ඒත් ගේ වහලානේ තිබුණේ"

"ඒක මං දන්නවා"

"කොහේද නුඹලා නිදාගත්තේ?"

අපි කොළ අතුවලින් කූඩාරමක් හදාගත්තා"

ඉතිං ඊට පස්සේ තිබුණු ගාලගෝට්ටියක්! ඔක්කෝම එක සැරේට ම කතා කරන්න ගත්තා... මගේ අම්මා, පව්ලික්ගේ අම්මා සහ සෙර්යෝෂාගේ අම්මා.... ඊට පස්සේ මොනවා වුණාද කියලා මං දන්නේ නෑ. මොකද අම්මා මාව ගෙදර අරං ගිය හින්දා. එයා හිටියේ හොඳටෝම කේන්තියෙන්. ගෙදර යනකම් ම එයා මට බැන්නා.

"නුඹ හොඳටෝම නරක ළමයෙක්. මං පෙන්නන්නංකෝ ගස් යට රෑ දෙකක් මගෙන් අවසර නොගෙන නිදාගන්න හැටි! මං නැතුව ගෙයින් පිටවෙන්ඩ දෙන අන්තිම වතාව තමා මේ"

එදා හැන්දෑවේ ගෙදරට වෙලා ඒ වගේ හැම දෙයක් ම අහගෙන ඉන්න මට සිද්ධ වුණා. මං හිටියේ ගිහින් මී මැස්සන්ව කොයි වෙලේ බලන්න යන්න ලැබේවිද හිත හිතා.

ජූනි 11

අද වුණේ මහ සවුත්තු වැඩක්.

මම උදේ ම පව්ලික්ගේ ගෙදර ගිහින් දෙන්නා එක්ක ම සෙර්යෝෂාගේ ගෙදර ගියා. එයා ඒ වෙනකොටත් හිටියේ ඇඳේ.



අපි එයාට ඇහැරෙව්වා. අපිව දකින එකෙන් එයා කොහෙත් ම සතුටු වුණේ නෑ. එයා කිව්වා එයා අපූරු හීනයක් බලා බලායි හිටියේ කියලා.

"ඒකෙන් කමක් නෑ. ඕකෙ ඉතුරු හරිය අද රෑට බලාගන්න බැරියැ. දැන් මී මැස්සො ටික මී මැසි පෙට්ටියට දාන්න ඕනෑ" අපි කීවා.

"මං ඇඳගෙන එනකං ඔයාලා ගිහින් අනිත් අයට කියන්න"

"කෝ උගුල?"

"අපේ බැල්කනියේ. මං ඒක ඊයේ රෑ එතන තිබ්බා, මී මැස්සන්ට අලුත් හුළං ටිකක් වදින්න"

අපි බැල්කනියට ගියා. උගුල එතන තිබුණත් කුඩා දොර ඇරලා දාලා. මී මැස්සෝ මුළු පළාත පුරා ඉගිල්ලෙනවා.

"අපොයි මොට්ට මෝලා, තමුසේ බුදියන අස්සේ මී මැස්සෝ ඔක්කොම ඉගිල්ලිලා ගිහින්" පව්ලික් සෙර්යෝෂාට බෙරිහන් දුන්නා.

සෙර්යෝෂා බැල්කනිය උඩට දුවගෙන ආවා.

"ඔතන කට බලියාගෙන ඉන්නෙ නැතුව දොර වහනවා" එයා කෑ ගැහුවා.

"මොකෝ තමුසෙ අපට කෑ ගහන්නේ ? අපිද වරදකාරයෝ? උගුල ඇරලා දාලා තියෙන්නේ තමුසෙයි" පව්ලික් බැණ වැදුණා.

"මං දන්නෙ නෑ කොහොම මට අමතක් වුණාද කියලා දොර වහන්න"

"පල් බූරුවා!" මට කියවුණා.

"ඒක මගේ වැරැද්ද නෙවෙයි. පෝල්යා නැන්දගෙන් බැණුම් ඇහුව තරමෙ හැටියට මට මී මැස්සො ගැන අමතක වෙලා ම ගියා."

"මං ඔට්ටු අල්ලනවා දන් එකෙක්වත් ඉතුරු වෙලා නැතුව ඇති. උන් ඔක්කෝම ඉගිල්ලිලා ගිහින් වගේ" පව්ලික් කීවා.

"සමහරවිට ටිකක් ඉතුරු වෙලා ඇති. අපි බලමු"ඒ සෙර්යෝෂා.

මම පියන ඇරියා. තුන්දෙනා ම එබිලා බැලුවා. තවත් සෑහෙන තොගයක් මී මැස්සෝ ඒ අස්සේ හිටියා. පියන ඉස්සූ හැටියේ ම උන් උඩට ඉගිල්ලුනා. එක මී මැස්සෙක් පියාඹාලා ඇවිත් මගේ අතේ වැහැව්වා. උන් ආපසු උගුලට යවන්නට පව්ලික් අත වනන්නට වුණා. බයට ම මගේ අතින් පියන අතෑරුනා. මී මැස්සා එළවා දමන්නට මම අත ගසා දැම්මා. එතකොට ම ඌ මට විද්දා. මම බෙරිහන් දීගෙන ඌ චප්ප වෙන්නට පාරක් දුන්නා. ඒ එක්ක ම අතිත් මී මැස්සෝ කේන්තියෙන් සූ සූ ගාන්නට වුණා. උන් උගුලෙන් පිට වෙලා අපට පහර දෙන්න ගත්තා. පව්ලික් ආපහු කාමරයට දිව්වා. සෙර්යෝෂා එයාගේ පස්සෙන් දිව්වා. එක මී මැස්සෙක් මගේ බෙල්ලට විද්දා. තව එකෙක් මගේ කොණ්ඩේ පටලැවුණා. මම කාමරේට දිව්වේ මී මැස්සාව කොණ්ඩයෙන් එළියට අදිමිනුයි. ඒත් ඌ මගේ ඔළුවට විද්දා. පව්ලික්ගේ බෙල්ලටයි, තොලටයි විදලා. සෙර්යෝෂාගේ නාහෙටයි බෙල්ල පිටපස්සටයි විදලා.

අපි තුවාල තෙමන්න කුස්සියට දිව්වා. ඒවා හොඳට ම දැවිල්ලයි. ගින්දරෙන් පිච්චෙනවා වගෙයි. අපි එක එක්කෙනාට උදව් කරගෙන මී මැසි විත් අයින් කළා. ඒත් දැවිල්ල නං අඩු වුණේ නෑ.

"ඒක තමුසෙගෙ වැරැද්ද. තමුසේ අත වනන්නේ නැතුව ඉන්ඩයි තිබුණේ. මී මැස්සො කැමති නෑ මිනිස්සු අත් වනනවට" සෙර්යෝෂා කෑ ගැසුවේ පව්ලික්ටයි.

"මට කෑ ගහන්ඩ එපා! තමුසෙට විතරක් නොවෙයි මී මැස්සො ඇනලා තියෙන්නේ. බලනවා මේ මගේ තොල දිහා. ඒක මහ භයානක විදිහට දනවා"

"එතකොට මගේ නාහේ. තමුසෙ හිතන්නෙ ඒක දැවිල්ල නෑ

කියලද?"

"තමුසෙ නාහෙන් මොකවත් කරන්නෙ නෑනේ. ඒත් මට කතා කරන්න වෙන්නේ කටෙන්"

දෙන්නා එක එක්කෙනා දිහා කේන්තියෙන් බලාගෙන හිටියේ කතා බහක් නැතුවයි.

වතුර ටැප් එකෙන් ලේන්සු පොඟවලා තුවාල තෙම තෙමා අපි හුඟ වෙලාවක් කුස්සියට වෙලා හිටියා.

එක සැරේට ම සෙර්යෝෂා උඩ පැන්නා. එයාගේ මූණේ තිබුණේ හොඳට ම බයවුණු පෙනුමක්.

"අපොයි බොලේ, අපි උගුල ඇරලා දාලයි ආවේ"

අපි ආපහු කාමරයට දුවලා බැල්කනියට එබිලා බැලුවා. උගුල එතන එහෙම ම යි. පියන ඇරිලා. එක මී මැස්සෙක් නැත්තං දෙන්නෙක් ඒ උඩින් කරකැවුණා. ඒත් ඉක්මනින් ම උනුත් පිටවෙලා ගියා. බැල්කනියට ගිය අපි උගුලට එබිලා බැලුවා. ඒක හිස්.

"උන් ඔක්කොම ගිහින්" සෙර්යෝෂා දුක් වුණා.

"සමහරවිට උන් ආපහු ඒවි" මම කීවා.

"එයි කියලා තමා බය" ඒ පවුලික්.

එතකොට ම අපි දැක්කා තෝල්යායි, යූරායි පාර දිගේ එන හැටි. අපිව දැක්ක ඒ ගොල්ලෝ කෑ ගැහුවා.

"හෝ.... එහෙනං ඔයාලා ඇවිත්"

"ඔව් අපි ආවා"

"මී මැස්සො ගෙනාවද?"

"ඔව්"

මිනිත්තු කීපයකින් ඒ දෙන්නා කාමරේට ආවා.

"ඉතිං කෝ මී මැස්සෝ?"

"උන් ගිහින්. ඉගිල්ලිලා ගිහින්" උත්තර දුන්නේ මම යි.

"කොහේටද?"

"කොහේටද! උන්ට අමතක වෙලා අපට කියලා යන්න, කොහේට යනවද කියලා" පව්ලික් කීවේ සමච්චලයෙන් වගේ ම කේන්තියෙන්.

"මොකෝ තමුසේ කේන්තියෙන්? තමුසෙ අපට කඩා පනින්න ඕන කමක් නෑ"

අපි ඒ දෙන්නට මුළු කතාව ම කිව්වා. සීයා අපට මී මැස්සන් දුන්න හැටි, ඒ වගේ ම මී මැස්සන් ඉගිල්ලිලා ගිය හැටි.

"සමහරවිට සීයා අපට තව රංචුවක් දෙන්න බැරි නෑ?" යූරා ඇහුවා.

"අපොයි බෑ, අපිට නම් බෑ ආයෙත් ගිහින් එයාගෙන් ඉල්ලන්න. එයා හිතුවේ අපි උන් පරිස්සමින් බලා ගනීවි කියලයි. එයා අපට තවත් නං දෙන එකක් නෑ, අපි කොච්චරට පරිස්සමක් නැති අයද කියලා දැන ගත්තොත්"

"අපි මොකද කරන්නේ?"

"අපිට ටිකක් ඉන්ඩ වෙනවා. සමහරවිට උන් ආපහු ඒවි"

ඉතිං අපි බලා සිටියා. යූරාත්, තෝල්යාත් අපිත් එක්ක ටික වෙලාවක් ඉඳගෙන හිටියත් ඊට පස්සෙ එපා වෙලා යන්න ගියා. ඒ සිද්ධ වුණු දේ අනිත් අයට කියන්න යි.

ඉතාමත් ඉක්මනින් අපේ අනිත් සගයෝ එක් කෙනෙකුට පස්සේ අනිත් එක්කෙනා ගානේ එන්නට ගත්තා. කතාව ආයෙත් ආයෙත් කියන්නට අපිට සිද්ධ වුණා. මේ වැඩෙන් අපි හෙම්බත් වුණා. සෙර්යෝෂාගේ නහය හොඳට ම රතුවෙලා, පැත්තක් ඉදිමිලා. පව්ලික් අඳුනා ගන්න බැරි තරමට එයාගේ තොල් ලොකු වෙලා. එතකොට මගේ ඔළුව ගෙඩි ගැහිලා, බෙල්ලේ තව තඩිස්සියක්. රෑ කෑම වෙලාව වෙනතුරා ම බලා සිටියත් එක ම මී මැස්සෙක් වත් ආපහු ආවේ නෑ.

"උන් ආපහු සීයගෙ වත්තට ම ගිහින් වෙන්ඩෑති" එහෙම කීවේ සෙර්යෝෂා.

"ඔහේ ගියාවේ. මට නං ඇති කාරියක් නෑ. උන් ආපහු ආවත් මං නෙවෙයි උන් ගැන කරදර වෙන්නේ" පව්ලික් කීවා.

"මාත් එහෙම යි. මං ආස නෑ මී මැස්සන්ගෙන් ඇනුං කන්ඩ" සෙර්යෝෂා එකඟ වුණා.

මම මෙහෙම කීවා. "මං නං මී මැස්සෝ ඇති කරන එක ගැනවත් එච්චර හිතන්නෙ නෑ. මී මැස්සන්ට සුව පහසුව හදන්ඩ ගියා ම කරදර ගොඩක පැටලෙනවා. උන් ඇනලා ඉවර වෙලා ඊට පස්සේ ඉගිල්ලිලා යනවා යන්ඩ"

එතකොට ම යූරා ආවා. "ජයවේවා! අපි ලියුමක් ලියන්නයි යන්නේ" එයා කීවා.

"කාටද?"

"මී මැසි ගොවිපොළට. ගුරුතුමී අපට ලිපිනය ගෙනැත්. අපි එයාලට ලියලා ඉල්ලමු මී මැස්සෝ ටිකක් පාර්සල් කරලා එවන්න කියලා"

"ඕක තමුසෙලා ම ලියා ගන්නවා. මං නං තවත් මී මැස්සෝ ගැන උනන්දුවක් නෑ" ඒ පව්ලික්.

"උනන්දුවක් නෑ?"

"නෑ... අපට උන් ගැන කරදර වෙන්ඩ ඕන නෑ. අපි තීරණය කළා මුළු වැඩේ ම අතෑරලා දාන්ඩ"

"ඔයාලට ඒක කරන්ඩ බෑ. ඒක පුරෝගාමී කණ්ඩායමේ තීරණයක්" යූරා කීවා.

"අපි වෙන මොක හරි වැඩක් හොයා ගනිමු කරන්ඩ. ලෝකෙ තියෙන එක ම වැඩේ මී මැස්සන් ඇති කරන එක විතරයෑ?"

යූරා උත්සාහ කළේ අපව නම්මා ගන්න ම යි. ඒත් අපි අපේ තීරණයේ තදින් ම හිටියා. මී මැස්සන් එක්ක තවත් කිසි ම දෙයක් කරන්නට අපි යන්නේ නැත. ඒ තමා අවසාන තීරණය.

අපි පාඩම් ඉගෙන ගෙන යි තියෙන්නේ. වෙන ඕනෑ කෙනෙක් මී මැස්සෝ එක්ක වද වුණාවේ. අපි ඊට වඩා වේදනාවෙන් අඩු දෙයක් හොයා ගන්නවා කරන්න.

ජූනි 12

අද උදේ මට නැගිට ගන්නට බැරි වුණු තරම යි. මගේ බෙල්ල ඉදිමිලා, ඔළුව හරවා ගන්න බැරි තරමට ඒක රිදෙනවා. වම් පැත්ත හරි දකුණු පැත්ත හරි බලන්නට ඕනෑ නම් මට ඇඟ ම හරවන්නට වෙලා. ඔළුව මුදුනේ ගෙඩියත් රිදෙනවා. මගේ අතත් එහෙම යි.

මම පව්ලික්ගේ ගෙදර ගියා. එයා බෙල්ල තවමින් ගෙදර උන්නා. අපි අර මී මැස්සන්ට නපුරු ලෙසින් දෙස් දෙවොල් තිබ්බා! ඊට පස්සේ ඉදිමුණු නාසයකුත් එක්ක සෙර්යෝෂා ආවා. එයාත් මී මැස්සන්ට සාප කළා.

ටික වෙලාවකට පස්සේ ග්‍රීෂා යාකුෂ්කින් පැමිණියා.

"ඔය ගොල්ලෝ මී මැස්සෝ ඇති කරන උපකරණ හදන්න

උදව් කරන්නේ නැද්ද?"

"මොනවද තමුසෙලා හදන්නේ?"

"දුම් භාජනයක්, ඔළුවට දාගන්න දැල් ආවරණයක්, එතකොට උන් එක්ක වැඩ කරද්දි උන් අපට අනින්නේ නෑ"

"උන් තමුසෙලාට නං අනියි, ඒත් අපට නං අනින්නේ නෑ. මොකද උන් එක්ක කිසි ම දෙයක් කරන්න අපි යන්නෙ නැති හින්දා"

ග්‍රීෂා අපි එක්ක වාද කරන්න හැදුවා.

"ඕකෙන් වැඩක් නෑ. දැන් අපට මී මැස්සෝ ඇති කරන එක ඇතිවෙලා. අපි කරලා බැලුවා. දැන් තමුසෙලාත් කරලා බලනවාලකෝ"

"ඒක තමයි අපි මේ කරන්න යන්නේ"

"තමුසෙලත් බොහෝම ඉක්මනට වැඩේ නවත්තාවි"

"නෑ, අපි නවත්තන්නේ නෑ. අපි තමුසෙලා වගේ නෙවෙයි"

"හොඳා බලමුකෝ"

ග්‍රීෂා කේන්තියෙන් පිඹ පිඹ යන්නට ගියා.

එයා කැමති නම් ගියාවේ. ඒ ගොල්ලෝ ඇනුම් කනකම් බලා ඉදිමු. එතකොට ඒ ගොල්ලොත් සිංදුවෙ තාලෙ වෙනස් කරාවි.

ජූනි 13

අද මගේ බෙල්ල එච්චරට ම රිදෙන්නෙ නෑ. හෙමින් කළොත් මට බෙල්ල හරවන්න පුළුවනි. ඒක තව ම රිදෙන්නේ හයියෙන් හැරෙව්වොත් විතරයි. පව්ලික්ගේ බෙල්ලත් හොඳ අතට හැරිලා, හොඳට ම හොඳ යි නෙවෙ යි.

ග්‍රීෂා ඇවිත් අපට පෙන්නුවා දුම් භාජනය යි, මුහුණු ආවරණය යි. එයා මුළු කාමරේ ම දුම් ගස්සලා යන්න ගියා. හරියට අපි මීට ඉස්සර දුම් දැකලා නෑ වගේ!

ජූනි 14

මගේ බෙල්ල කැක්කුම් දෙන එක සම්පූර්ණයෙන් ම නැවතිලා. ඔළුවේ ගෙඩියත් නැත්තටම නැතිවෙලා. කිසි ම අමාරුවක් නැතුව

මට දූන් බෙල්ල හරවන්න පුළුවන්. ඒක ගස්සන්න වුණත් පුළුවනි, ඒත් රිදෙන්නෙ නෑ. එහෙම වුණත් මම අස්සයෙක් නොවෙන හින්දා ඕළුව ගස්සන්න ඕන කමක් නෑ. ලියන්න තරං වැදගත් වෙන මොකවත් දෙයක් නෑ.

ජූනි 15

අද උදේ මමයි පව්ලිකුයි සෙර්යෝෂලගේ ගෙදර ගිහින් දාං ඇද්දා. මම සෙර්යෝෂාත් එක්ක ඇදලා අත් දෙකකුත් පව්ලික් එක්ක ඇදලා එක අතකුත් දිනුවා. පව්ලික් මා එක්ක ඇදලා තුන් සැරයක් දිනුවත් සෙර්යෝෂාගෙන් එක සැරයක් වත් දිනුවේ නෑ. සෙර්යෝෂා මගෙන් අත් දෙකක් දිනුවා. ඊට පස්සේ ෂෙන්යායි යූරායි දුවගෙන ආවා.

"ඉක්මනට යමු! මී මැස්සෝ ඇවිල්ලා!"

"මොන මී මැස්සොද?"

"අපි ඉල්ලලා යවපු උන්. උන් පාර්සල් තැපෑලෙන් ඇවිත්. මුළු පෙට්ටියකින් එකක් ම. රංචු රංචු ගාණක් මී මැස්සෝ. ඒ එක්ක ම කලින් ම හදාපු වදත් එක්ක රාමු දෙකකුත්. යමු. අපි උන්ව මී මැසි පෙට්ටියට දාන්නයි යන්නේ"

අපි තුන්දෙනා උඩ පැනලා නැගිට්ටේ යන්නට සූදානමින්.

"හෝ... හෝ... ඔයාලා කීවේ තවත් නං මී මැස්සෝ ගැන උනන්දුවක් නෑ කියලා නේද!" යූරා අපි දිහා බැලුවේ ජයගත්ත බැල්මකින්.

"නෑ තමා. හරියට අපි මීට කලින් මී මැස්සන්ව දැකලා නෑ වගේ" අපි කීවේ ආයෙත් ඉඳ ගන්නා අතරෙයි.

"හැබැයි ඒ මේ වගේ මී මැස්සො නෙවෙයි. මුං නං හරි ම අපූරු එවුන්!"

"හොඳා එහෙනං උන් ඔච්චර අපූරු නං ගිහින් උන්ව ඉඹ ගන්නවා"

"ඔව් අපි එහෙම කරනවා, ඔට්ටුයි ඔයාලත් බොහෝම ඉක්මනට එහෙම කරාවි"

එහෙම කියලා ඒ දෙන්නා යන්නට ගියා.

"ඒ මී මැස්සන්ව බලන්න තිබ්බා නං අපූරුයි" මම කීවා.

"අපට යන්න බෑ. ඔක්කොම කියාවි අපිට කිසි ම කොන්දක් නෑ කියලා" එහෙම කීවේ පව්ලික්.

"ඇයි?"

"ඔක්කෝම කට්ටිය කියාවි මී මැස්සෝ අති කරන එක අතෑරලා දම්මේ ඒකේ තියෙන අමාරුකම්වලට බයේ කියලා. අනිත් අය ඒවා කරන වෙලාවට අපි බලන්න එන්න නං ගාණක් නෑ කියාවි. නෑ නෑ අපි සැරයක් තීරණයක් ගත්තා නං ඒක කඩන්නෙ නැතුව ඉන්න ඕනෑ"

"ඒක හරි. අපි පෙන්නමු අපිට කොච්චර තදට ඉන්න පුළුවන්ද කියලා" සෙර්යෝෂා එකඟ වුණා.

මම මුළු හැන්දෑවෙ ම මී මැස්සන් ගැන යි හිතුවේ. කොහොමටත් මම නං හිතන්නේ නෑ මී මැස්සෝ එච්චරට ම නරක යි කියලා. උන් අපූරු, මහන්සි වෙලා වැඩ කරන කෘමීන් ජාතියක්. උන් සාමකාමීව එකට ජීවත් වෙනවා. උදාහරණයකට, මී මැස්සෝ දෙන්නෙක් රණ්ඩු කරනවා කවදාවත් දැකලා නෑ නේද?"

ජූනි 16

අද උදේ අපි පව්ලික්ගේ ගෙදර දාං ඇද්දා. ඒත් ටික වේලාවකින් මට දාං ඇදිල්ල එපා වෙලා ගෙදර ආවා. මම දිගට ම හිත හිතා උන්නෙ මී මැස්සන් ගැන යි. ඇයි උන් අනින්නේ? ඒ උන් ස්වභාවයෙන් ම නපුරු හින්දාද? නැත්නම් වෙනින් මොනවා හරි හේතුවක් තියෙන හින්දාද? මං හිතන්නේ නෑ ඒ උන් නපුරු හින්දා කියලා. උන් හතුරන්ගෙන් ආරක්ෂා වෙන්නේ විතෙන් ඇනීමෙන්. මී වදයට කවුරු හරි පහර දුන්නොත් මී මැස්සො අනිනවා. මං අහලා තියෙනා උන් මී පැණි හොරා කන්න එන වලස්සුන්ටත් අනිනවා කියලා. ඒ අතින් උන් හරියට ම හරි. කොහොමටත් උන් මහන්සි වෙලා වැඩ කරලා පැණි එකතු කරන්නේ තමන්ගේ ප්‍රයෝජනේට මිසක වලස්සුන්ට නෙවෙයි. මං හිතන්නේ උන් මිනිස්සුන්ට අනින්නේ වැරදීමෙන්, මොකද උන් දන්නෙ නෑ මිනිස්සු උන්ට හානියක් කරන්න යන්නේ නෑ කියන එක. ඇත්ත, මිනිස්සු උන්ගේ පැණි ගන්නවා තමයි, ඒත් ඒ ගොල්ලෝ ඒ ඔක්කෝම ගන්නේ නෑ. ඒ ගොල්ලෝ ගන්නේ ඒ ගොල්ලන්ට ඕනෑ තරම විතරයි. ඒ වගේ ම ඒ ගොල්ලෝ මී

මැස්සන්ව රැක බලා ගන්නවා, මී මැසි පෙට්ටි හදලා දෙනවා, සීත කාලෙදි උණුසුමට සැප පහසුවට තියනවා. මිනිස්සු උන්ව රැක බලා නොගත්තවා නම් මී මැස්සන්ට මීට වඩා භුගාක් නරක දසාවක් ඇති වෙනවා. උන් එහෙම නං පැණි නැති වෙලාවට සීනි පැණියක් බොන්න තියෙන, අපූරුවට ඉඩකඩ තියෙන මී මැසි පෙට්ටිවල වෙනුවට ජීවත් වෙනවා ඇත්තේ ගස් බෙනවල හරි වෙන මොනවා හරි ගුල්වලයි.

මී මැස්සන්ගෙන් ඇනුම් කන්න ඕනැ නැත්නම් දැල් ආවරණයක් පළඳාගෙන දුම් භාජනයක් පාවිච්චි කරන්න පුළුවනි, මී මැසි පාලනය කරන්න. එතකොට ඔක්කෝම හරි.

දැල් ආවරණ නැතුව කෙළින් ම මී මැසි උගුලට ඔළුව ඔබලා අපි කළේ අත්වැරැද්දක්. ඒකට අපට දඬුවම ලැබුණා.

ජූනි 17

පව්ලික් අද කඩදාසි කුරුල්ලන් හදලා කාමරය පුරා උන්ව පියාඹෙව්වා. සෙර්යෝෂා එකෙක්ව හදලා බැල්කනියෙන් එළියට වැටෙන්න ඇරියා. ඒක කරකැවී ගිහින් කරණමක් ගහලා හරියට ම පාර මැද ඇදගෙන වැටුණා. ඊට පස්සේ අපි හැමෝ ම කඩදාසි කුරුල්ලන් බැල්කනියෙන් බිමට අත අරින්නට ගත්තා. මගේ එකක් හරියට ම පාර හරහා ඉගිල්ලිලා එහා පැත්තේ ගේක වහළෙට වැටුණා. සෙර්යෝෂාගේ එකක් පාරේ එමින් තිබුණු කාර් එකක් උඩට වැටිලා කාර් එකත් එක්ක ම යන්න ගියා. ටික වෙලාවකින් මට ඒක එපා වෙලා ගෙදර ගියා. මොකක්දදෝ හේතුවකට මහා දුක්බර ගතියක් දැනුණා. මට දැනුත් ඒ දුක්බර ගතිය දැනෙනවා. මට හිතාගන්න බෑ කරන්න මොන ම දෙයක්වත්.

ජූනි 18

අපි අදත් කඩදාසි කුරුල්ලන් හදලා බැල්කනියෙන් පහළට අතෑරියා. ඒත් අපිට ඒක ඉක්මනට ම එපා වුණා. ඒ හින්දා අපි දාං අදින්න ගත්තා. ඒත් ඒකත් එපා වුණා. අපි වෙන එක එක ජාතියේ සෙල්ලම් කළා. ඒත් ඒ එකකින්වත් එච්චර සතුටක් දැනුණේ

නෑ.

ඉක්මනින්ම සෙර්යෝෂා ගෙදර යන්න ගියේ එයාට මේ ඔක්කොම එපා වෙලා කියලා. මටත් සෙල්ලම් කරන්න තරම් එච්චරට අසාවක් තිබුණේ නෑ. ඉතිං මමත් ගෙදර එන්නට ආවා. ඊයේ වගේ ම මට දැනුණේ දුක්බර ගතියක්. මට තේරෙන්නේ නෑ ඇයි මට මෙහෙම දැනෙන්නේ කියලා. ඒ මම විඩාපත් වෙලා හින්දාද? මං එහෙම හිතන්නේ නෑ. විඩාපත් වෙලා ඉන්න කොට සෙල්ලම් කරන්න පුළුවනි. එතකොට විඩාපත් කම නවතිනවා. ඒත් දුක්බර ගතියක් දැනෙනකොට සෙල්ලම් කරන්නවත් හිතෙන්නේ නෑ.

මගෙන් ඇහුවොත් මං කියන්නේ ඒක එන්නේ කිසි දෙයක් කරන්න නැති කමින් කියලා. මොනවා හරි ප්‍රයෝජනවත් දෙයක් කරමින් ඉන්න වෙලාවට කිසිදාක දුක්බර ගතියක් දැනෙන්නේ නෑ. ඒත් මුළු දවසම ඇඟිලි ගැට කඩ කඩා නිකං උන්නොත්, නැත්නම් හැම ජාතියකම මෝඩ විකාර වැඩ වලින් කාලේ නාස්ති කරලා දැම්මොත්, කාලය නාස්ති කිරීම ගැන ලැජ්ජාවක් දැනෙන්න ගන්නවා. දුක්බර ගතියක් ඇති කරන්නේ ආන්න ඒකයි.

ජූනි 19

පව්ලික් මුළු උදේ වරුවෙ ම හිටියේ නොරිස්සන ගතියෙන්. එයාට කිසි ම සෙල්ලමක් කරන්න ඕන කමක් තිබුණේ නෑ. රෑ කෑමෙන් පස්සේ එයා කොහේදෝ පිටත් වෙලා ගියා. සෙර්යෝෂා යි මම යි හැම තැනක ම එයාව හෙව්වා. අපි හැම මඩුවක ම, හැම අට්ටාලයක ම බැලුවත් එයාව හොයා ගන්න බැරි වුණා. අපි හිතුවේ එයා කවුරු හරි අපේ අතිත් යාළුවන්ගෙන් කෙනෙක්ව බලන්න යන්න ඇති කියලයි. ඉතිං අපි එයාව හොයන එක නතර කළා. අපිටත් සතුටු ගතියක් දැනුණේ නෑ.

"අපි අනිත් අයත් එක්ක මී මැස්සන්ව බලා කියා ගත්ත නං මේ විදිහට දැනෙන්නෙ නැතිවෙන්ඩ තිබ්බා" සෙර්යෝෂා කීවා.

"ඒක නෙවෙයි, පව්ලික් ළඟ නැති වෙලාවේ අපි දෙන්නා ගිහින් මී මැස්සන්ව බලලා එමුද?" මම යෝජනා කළා.

සෙර්යෝෂාගේ මුහුණ එළිය වුණා. "එයා එන්න කලිං අපි

දැන්ම ම යමු. නැත්තං එයා කියාවි අපට කිසි ම කොන්දක් නෑ කියලා"

අපි ඉක්මන් ගමනින් පාසලට ගියා. වත්තට ඇතුළු වූ හැටියේ



ම අපට ඈතින් මී මැසි පෙට්ටිය පෙනුණා. කවුදෝ කෙනෙක් ඒ පැත්තකින් වාඩිවෙලා මී මැස්සන් දිහා බලාගෙන ඉන්නවා. ඒ පව්ලික්.

"එහෙනං තමුසේ මෙතන? මොකද තමුසෙගෙ ජනප්‍රිය පිටකොන්දට වුණේ? තමුසේ අපට කීවේ මී මැස්සන් ගැන අපි කිසිම උනන්දුවක් පෙන්නන්න හොඳ නෑ කියලා. එහෙම කියලා තමුසෙ ම හොරෙන් රිංගලා ඇවිත් උන් දිහා බලා ඉන්නවා. ඒක සහෝදරයෙක් කරන තරං වැඩක්ද?" අපි කෑ ගැහුවා.

පව්ලික් බැලුවේ වරදක් කළ විදිහට යි.

"ම්.... මං....මං මේ අහම්බෙන් වගේ ආවේ. මං මේ මෙතන පහු කරගෙන යන ගමන්, ඉතිං මං හිතුවා ඇතුළට ඇවිත් බලන්න"

"හොරිකඩයෙක්! තමුසෙට ඕන වුණේ කොහොම හරි මී මැස්සන්ව බලන්න"

"සහතික ම යි නෑ, මං මොහොකටද උන්ව බලන්නේ?"

"ඒත් තමුසේ ආවේ උන් දිහා බලන්න නේද?"

"එතකොට තමුසෙලා?"

"අපිත් මේ අහම්බෙන් වගේ ආවේ. අපි මේ මෙතනින් පහු කරගෙන යන ගමන්. එතකොට අපි දැක්කා තමුසේ මෙතන ඉඳගෙන ඉන්නවා, ඉතිං අපි ආවේ තමුසේ දිහා බලන්නයි"

"ඒක ඇත්තක් නෙවෙයි. තමුසෙලාට පොරොන්දුවක් කඩ නොකර ඉන්ඩ කොන්දක් නෑ. එච්චර යි"

"තමුසේ කතා කරන්ඩ ඕන නෑ. තමුසේ මෙතෙන්ට ආවේ අපට කලින්"

අපි හුග වෙලාවක් තිස්සේ වාද කළා. කොච්චර තදට වාද කළාද කියනවා නං යූරා එනවා වත් අපට ඇහුණේ නෑ. එයාට අපේ කතා ඇහිලා.

"ඔයාලා කාටවත් කිසිම පිට කොන්දක් නෑ" එයා කීවා.

"ඇයි?"

"ඔයාලා වැඩ පටන් අරන් අතෑරලා දාපු හින්දා. ඔයාලට මොනව හරි පිට කොන්දක් තිබ්බා නං කොච්චර අමාරු වුණත් ඒක අතෑරලා දාන්නේ නෑ"

"අපි කිසි දෙයක් අතෑරලා දැම්මේ නෑ. අපට ඕන වුණේ පොඩ්ඩක් විවේක ගන්නයි. අපි ආයෙත් වැඩ පටන් ගන්න සූදානම්" පව්ලික් කීවා.

"ඒක හොඳා. එහෙනං දැන් ගෙදර ගිහින් දැල් ආවරණ හදාගෙන ඇවිත් අපට එකතු වෙනවලා. ඒත් දැන් කෑ ගහන්නේ නැතුව යන එකයි වැඩිය හොඳා, නැත්තං මී මැස්සෝ අනීවි"

"අපි ටිකක් ඉඳගෙන ඉඳලා ඊට පස්සේ යන්නං" එහෙම කීවේ පව්ලික්.

අපි මී මැසි පෙට්ටිය කිට්ටුවෙන් සද්ද බද්ද නැතුව ඉඳගෙන මී මැස්සෝ එකා පස්සේ එකා බඩ ගාගෙන ඇවිත් රොන් හොයන්න පිටත් වෙලා යන හැටි බලා උන්නා. සමහර මී මැස්සෝ ආපහු ආවා. උන් ලැගුම් ලෑල්ල උඩ වහලා ඇතුළට බඩගෑවා. හැම වෙලාවෙ ම මී මැසි පෙට්ටිය වටේ කැරකි කැරකී මී මැස්සෝ හිටියා.

මී මැස්සොත් එක්ක ජීවමාන අපේ මී මැසි පෙට්ටිය දිහා බලන එක හරි ම අපූරු යි. උන් දිහා බලා හිටියායින් අපට ලැබුණේ ලොකු සතුටක්. ටික වෙලාවකට පස්සේ අපි ගෙදර

ගිහින් කම්බි වලිනුයි, තුනී දැල් රෙදි වලිනුයි මුහුණු ආවරණ හැදුවා. ඒකෙන් රෑ වෙනකම් ම අපිට වැඩ තිබුණා. අපේ මුහුණු ආවරණ ඇත්වශයෙන් ම හොඳට ආවා. හිතේ දුක්බර බව ගැන අපට එහෙම පිටන් ම අමතක වුණා.

ජූනි 20

අද හරි ම අපූරු දවසක්! උදේ පළවෙනි වැඩේ හැටියට අපේ කණ්ඩායම පාසල් වත්තේදී රැස් වුණා. හැම කෙනෙක් ම දැල් අරගෙන ආවා. යූරා දුම් භාජනය ගොනාවා. අපි දුම් භාජනය පරීක්ෂා කරන වැඩෙන් පටන් ගත්තා. අපි වේළුණු දරකෝටු එකතු කරලා භාජනේට දැම්මට පස්සේ යූරා ඒකට ගිනි අවුළුවලා පිම්බා. ඒක ලස්සනට වැඩ කළා.

ඊට පස්සේ අපි මී මැසි පෙට්ටිය ඇරලා ඇතුළ බැලුවා. සූ ගාලා මී මැස්සෝ! රාමු උන්ගෙන් කළු ගැහිලා. අපි පියන අරිද්දී උන්ගෙන් සමහර එවුන් එළියට එන්න හැදුවා. එත් යූරා උන්ට දුම් ටිකක් පිම්බායින් උන් ආපහු බඩගෑවා. ඊට පස්සේ තෝල්යා රාමුවලින් එකක් එළියට ගත්තා. ඉතිං අපිට පැණි වදයක දර්ශනය පළවෙනි වරට දැක ගන්න ලැබුණා. ඒක හදලා තිබුණේ පැති හයක් තියෙන පුංචි කුටීර එක ළඟින් ළඟින් හදලා. ඒවාට කියන්නේ කුටීර කියලා. මී මැස්සන් බොහෝ කඩිසරව වැඩේ යෙදිලා හිටියා. ඉතිං අපි උන්ට බාධා නොවෙන විදිහට රාමුව ඉක්මනින් ආපහු තිබ්බා.

මී මැස්සෝ අපූරු කෘමීන් ජාතියක්. උන් හදන මී වද කොච්චර ලස්සනද, පිළිවෙලද කියනවා නං ඒවා හදලා තියෙන්නේ එච්චර පුංචි සත්තුද කියලා විශ්වාස කරන්නත් අමාරුයි. සත්තුත් බුද්ධිමත්. උදාහරණෙකට බල්ලා ගනිමු. ඒත් බුද්ධිමත් ම බල්ලාට වුණත් පැණි වදයක් හදන්න බෑ.

ජූනි 21

අද ගාල්යා ඇගේ කැමරාව අරන් ඇවිත් මී මැසි පෙට්ටිය ළඟින් අපේ කණ්ඩායම තියලා ඡායාරූපයක් ගත්තා. ළමුන් පිරිස

මී මැසි පෙට්ටිය පිටිපස්සේ පේළියට හිටගත්තා. ඒත් මටත්, සෙර්යෝෂාටත්, පාව්ලික්ටත් ඉඩක් තිබුණේ නෑ. ඉතිං අපි ඉස්සරහින් ඉඳ ගත්තා. අපට හෙළවෙන්නේ නැතුව ඉන්නැයි කියූ ගාල්යා කැමරාවෙන් ක්ලික් සද්දයක් ඇති කරලා පින්තූරය ගත්තා. ෆොටෝ ගන්න එක අපූරු දෙයක්! ක්ලික්! ඒ එක්ක ම ඔන්න ඔයා සේයා පටයේ. මං සැරයක් දැක්කා සේයා පටයක් සුද්ද කරන හැටි. ඒවා මොනවදෝ දියරයක දාලා හොළවනවා, හොළවනවා.... ටික වෙලාවකට මොකවත් සිද්ධ වෙන්නේ නෑ. ඒත් හිටි අඩියේ ම පින්තූරය පේන්න ගන්නවා. එක ම වෙනස හැම දේ ම තියෙන්නේ අනිත් පැත්තට වීම යි. ඒ සේයා පටයකින් එන්නේ ඒ විදිහට හින්දායි. ඒත් ඒක මුද්‍රණය කළා ම ආයෙත් හරියට ම නියම පැත්තට එනවා.

මම කල්පනා කරන්නේ අපේ පින්තූරය කොහොමට ඒවිද කියලායි. මට බය ඒකේ මගේ ඇස් දෙක පියවිලා තියේවිද කියලායි. මොකද ගාල්යා කැමරාවෙන් ක්ලික් සද්දේ දානකොට ම මට ඇස් පියවුණු හින්දා. මට ඕක කලිනුත් සිද්ධ වෙලා තියෙනවා. අපි පන්තියේ කට්ටිය ඡායාරූපයකට පෙනී හිටිද්දී මට වැරදි වෙලාවට ඇහැ පියවෙලා තිබුණා. ඡායාරූපයේ තිබුණේ මගේ ඇස් වැහිලා, හරියට මං හිටගෙන නිදියනවා වගේ. පන්තියේ අය මාව හම ගැහැව්වේ නැති එක විතරයි. මම මුළු ඡායාරූපය ම නරක් කරලාලු. හරියට ම ඒක මගේ වැරැද්ද වගේ!

ජූනි 22

ඡායාරූපය තව ම සූදානම් නෑ. මොන ලැජ්ජාවක්ද! ගාල්යා කියන්නේ සේයා පටය තව ම වේලිලා නැතිලු. අපි ඇහුවා ඒක හොඳට, හරියට ඇවිත්ද කියලා. ඒත් එයා කියන්නේ නෑ.

"මං හෙට මුද්‍රණය කරගෙන එන්නං. එතකොට බලන්නකෝ"

මං හොඳට ම කැළඹිලා ඉන්නේ. ගිය සැරේ වගේ මගේ පින්තූරේ අන්ධයෙක් වගේ වෙන්ඩ එපා කියලා විතරක් මං බලාපොරොත්තු වෙනවා. හරියට ම වැරදි වෙලාවට මගේ ඇස් පියවෙන්නේ මොන ඉලව්වකද්!

අපොයි, මට හෙට වෙනකං ඉන්න බැරි තරම යි.

ජූනි 23

ගාල්යා ඡායාරූපය ගෙනාවා. මං හැර හැම කෙනෙක් ම හොඳට ඇවිත්. මගේ කට හායි ගාලා ඇරිලා. ඒක කොහොම වුණාද මට තේරුම් ගන්න බෑ. මොකද මම කට ඇරගෙන හිටිය වගක් මට කොහෙත් ම මතක් වෙන්නේ නෑ. අනිත් හැමදේ ම හරියට ම හරි. මගේ ඇස් දෙක තියෙන්න ඕන විදිහට ම ඇරිලා. ඒත් කටත් ඒ විදිහට ම ඇරිලා. ඒක වැහිලා තියෙන්න යි තිබුණේ. ඇත්ත වශයෙන් ම මට අනිත් කට්ටියගෙන් හැම ජාතියෙ ම නපුරු දේවල් අහන්න සිද්ධ වුණා.

"මොකක් හින්දාද තමුසෙට කට බලියාගෙන ඉන්න වුණේ?"

"මං හිතලා කළේ නෑ"

"තමුසේ දිවත් එළියට දාගෙන ඉන්නයි තිබ්බේ ඒ වෙලාවේ!"

"මගේ පෙනුම කොහොමද කියන එක තමුසෙලාට අයිති වැඩක් නෙවෙයි. තමුසෙලා හැමෝ ම හොඳට ඉන්නවා නේද?"

"ඔව් අපි හොඳට ඉන්නවා, ඒත් බලනවකෝ තමුසේ දිහා!"

"මා ගැන මොකද?"

"එතන වාඩිවෙලා ඉන්නේ කටබලියාගෙන හරියට මාළුවෙක් වගේ!"

මගේ කට වහලා දාන්න මොකවත් කරන්නට බැරිදැයි කියලා මං ගාල්යාගෙන් ඇහුවා.

"මොකටද? මං හිතන්නේ ඔයා බොහෝ ම හොඳට ඇවිත් තියෙනවා කියලා. ඒක හරියට ම හොඳට ඇවිත් තියෙනවා"

"ඔයා කියන්නේ මගේ පෙනුම ඒ වගේ කියලද? මං හිතුවේ හොඳ පෙනුමක්"

"ඉතිං ඔයා ඔයා ම නේ"

"ඒත් ෆොටෝ එක මගේ පෙනුම මෝඩ කරලා"

"එහෙම මොකවත් නෑ. ඔයාගේ කට යාන්තං ඇරිලා තියෙන්නේ ඔයා හිනාවෙන හින්දා. එච්චරයි. ඒකේ කිසි වැරැද්දක් නෑ. ඔයාව කොහෙත් ම මෝඩ විදිහට පේන්නේ නෑ. ඒකේ අනිත් පැත්ත තමා පේන්නෙ, ඔයාගේ පෙනුම හුඟාක් බුද්ධිමත්"

එයා මාව සනසවන්න හදනවා කියලා මට සහතිකයි. ඒත් සමහරවිට හැබෑවට ම මගේ පෙනුම බුද්ධිමත් වත්ද? මං දන්නේ

නෑ. මං දන්න එක ම දේ තමයි හැම වෙලේ ම ඡායාරූපවලදී මාව විහිළුකාරීව පේනවා කියන එක. ඒක එහෙම වෙන්නේ කොහොමද කියලා මං දන්නේ නෑ. මොකද ඇත්තට ම මම සෑහෙන්න කඩවසම් හින්දා. ඒත් මගේ ඡායාරූපයක් දිහා බැලීමෙන් ඒ වගක් හිතෙන්නේ නෑ. උදාහරණෙකට මේ ඡායාරූපය ගනිමු. මං මගේ කට ගැන කතා කරන්නේ නෑ. මොකද කොහොමටත් ඒක මගේ වරද. ඒත් අර නාහේ දිහා බලමු. ඒක නියම මුක්කං නහයක් මිසක ටිකක්වත් මගේ නහය විදිහ නං නෙවෙයි. එතකොට කන්? මගේ කන් සමෝවාරයක අඬු වගේ එළියට පැනලද තියෙන්නේ? හොඳයි, මං හිතන්නේ ඒකෙ එච්චර දෙයක් නෑ. මොනවා හරි සමාන කමක් තියෙනවා. ඒක මගේ මිසක වෙන කාගෙවත් එකක් නෙවෙයි කියලා කියන්න හැකියි. ඒ හින්දා මොනවා හරි දෙයක් තියෙනවා. ප්‍රධාන දේ තමා මමයි සෙර්යෝෂායි, පාව්ලිකුයි මී මැසි පෙට්ටිය ඉස්සරහින් වාඩිවෙලා ඉන්න එක. ඒක හුඟාක් ප්‍රයෝජනවත්.

ගෙදර එන ගමන් සෙර්යෝෂා මෙහෙම කීවා.

"අපිව අර විදිහට ඉස්සරහට තල්ලු කළේ මොන එකක්ද? කවුරු හරි හිතාවි අපි තමා ප්‍රධාන මී මැසි පාලකයෝ කියලා"

"ඔව්, ඒකේ හොඳක් පේන්නෙ නෑ. විශේෂයෙන් අපි ඔක්කෝම අතෑරලා දාලා වැඩේට එකතු වුණේ අන්තිමේදී වෙලාත්. හැමෝ ම හිතාවි අපි ඔක්කෝම ලකුණු ගන්න හැදුවා කියලා. අපි උද්ධච්ඡ වුණා කියලා කියාවි"

මම ගෙදර ඇවිත් උද්ධච්ඡකම ගැන කල්පනා කළා. මිනිස්සු උද්ධච්ඡ කරවන්නේ මොකක්ද? උදාහරණෙකට සමහර මිනිස්සු හිතන්නේ තමන් බොහෝ ම අපූරුයි කියලා. ඉතිං හැම වෙලේ ම තමන් ගැන පුරසාරං කියවනවා. ඒත් කෙනෙක් හැබෑවට ම හොඳයි නං ඒ ගැන කථා කරන්න ඕනෑ කමක් නෑ, මොකද ඕන කෙනෙකුට එයා හොඳයි කියලා බලාගන්න පුළුවන්. එයා හොඳ නෙවෙයි නං කොච්චර පුරසාරං කිව්වත් වැඩක් නෑ, මොකද කිසි කෙනෙක් විශ්වාස කරන්නේ නැති හින්දා. එතකොට තව සමහර මිනිස්සු ඉන්නවා තමන් කඩවසම් කියලා හිතාගෙන ඉන්න. ඒ ගොල්ලෝ ආඩම්බරේට ඇවිදින්නේ පපුව පුම්බාගෙන. ඒත් ඕන කෙනෙකුට බලාගන්න පුළුවන් කෙනෙක් කඩවසම්ද

නැද්ද කියලා. ඉතිං මොකටද ඒ ගැන පුරසාරං ගහන්නේ? සමහරු හිතන්නේ තමන් හරි දක්ෂයි කියලායි. තමන් ඇත්තට ම දක්ෂද නැද්ද කියලා අනිත් අයට තීරණය කරන්න දෙනවා වෙනුවට ඒ අය කරන්නේ ඒ ගැන කයිවාරු ගහන එකයි. මගේ මතය නං උද්ධච්ඡ වෙන එක මෝඩ කමක් කියන එකයි. අනිත් හැමෝට ම වැඩියෙන් තමන් දක්ෂයි කියලා හිතන එක මෝඩ කමක් විතරයි, මොකද දක්ෂ මිනිස්සු දන්නවා මුළු ලෝකෙ ම ඉන්න දක්ෂ අය ඒ ගොල්ලෝ විතරක් නෙවෙයි කියලා.

ජූනි 24

අද අපට ගුරුතුමිය කියා දුන්නා කොහොමද මී මැස්සන්ට වතුර දෙන්නේ කියලා. ටැංකියක් අරගෙන, ඒක වතුරෙන් පුරවලා

ඒකෙ ටැප් එක යටින් ඇල හැඩේට ලෑල්ලක් තියලා වතුර බිංදුවෙන් බිංදුව වෑස්සෙන්න අරින්න ඕනෑ. එතකොට මී මැස්සන්ට තෙමෙන්නෙ නැතුව වතුර බොන්න පුළුවන්.

වැංකියක් කොහෙන් හොයා ගන්නද කියලා අපි දැනං හිටියේ නෑ. ඒත් ග්‍රීෂා කීවා එයාලගේ අට්ටාලයේ පරණ පීප්පයක් තියෙනවා කියලා. ඉතිං අපි එයාලගෙ ගෙදර ගියා. ග්‍රීෂගේ අම්මා කීවා ඒක අපට ගන්න කියලා. ඒත් ඒ පීප්පේ මහ එපා කරන තරං බරයි. අට්ටාලයෙන් ඒක බිමට බාගන්න අපට හුඟාක් අමාරු වුණා. ඒක තල්ලු කරගෙන යද්දි පාරෙදි අපට ෆේද්‍යා මුණ ගැසුණා.

"කොහේද යක් පැටවුනේ යන්නේ ඔකත් අරන්? අරක්කු පෙරන්න යනවද?"

"නෑ, මී මැසි ගොවිපොළට. මේ මී මැස්සන්නට වතුර දෙන්නයි"

"උඹලට පිස්සු! උන්ට මොකටද ඔච්චරට වතුර?"

"ඒවා හරි. උන් ඒ ටික බීලා දාවි" යූරා කීවා.

ඉතිං අපි පීප්පය තල්ලු කරගෙන පාසල් වත්තට ගිහින් ඒක පුරවන්න ගත්තා. ඒත් පීප්පේ කොච්චරට වේලිලා තිබ්බාද කියනවා නං ඒක හතර වටින් වතුර පිටට ගලාගෙන ගියේ පෙනේරෙකින් වගේ. අපි හිතුවේ අපට ඒක ආපහු ගෙනියන්න වේවි කියලායි. ඒත් ගාල්යා කීවා පීප්පෙ හොඳට පෙඟුනහම ඒක හදලා තියෙන ලී පතුරු ඉදිමිලා වතුර කාන්දු වෙන එක නවතීවි කියලායි.

ඉතිං අපි දිගින් දිගට ම වතුර ඇද්දා. අපි සමහර විට වතුර බාල්දි දෙසීයක් විතර පුරවන්න ඇති, අන්තිමේ වතුර කාන්දු වෙන එක නතර වෙද්දී. ටිකෙන් ටික ලී පතුරු ඉදිමිලා හැන්දෑව වෙනකොට පීප්පේ බාගයක් වතුර පිරිලා තිබුණා.

අපි හෙට ඉතිරි ටික පුරවනවා.

ජූනි 25

පීප්පය මුළු රෑ පුරා හොඳ හැටි පෙඟිලා. උදේ වෙනකොට බිංදුවක්වත් කාන්දු වුණේ නෑ. ඒකෙ කට ළඟට එනකම් ම පිරෙව්වාට පස්සෙයි අපට තේරුම් ගියේ ලැල්ලකට වතුර කාන්දු වෙන්න නම් පීප්පය පොළොවෙන් ටිකක් උඩින් තියන්න ඕනෑ කියලා. ඉතිං වතුර ඔක්කෝම අහකට හලලා, පුංචි වේදිකාවක් උඩට පීප්පය නග්ගලා ආයෙත් වතුර පුරවන්න අපට සිද්ධ වුණා. ඊට පස්සේ අපි පොරොප්පයේ යාන්තං සිදුරක් හැදුවා, වතුර

බිංදුව ගානේ වැස්සෙන විදිහට. අන්තිමේදී ඒක සූදානම් කරලා ඉවර වුණා. ඉක්මනින් ම මී මැස්සෙක් ඇවිත් ලෑල්ල උඩ වහලා උගේ ඔළුවේ තියෙන තුඩින් තෙත ලෑල්ලට ඇන්නා. ටික වෙලාවකින් අනිත් මී මැස්සොත් ඇවිත් වතුර බොන්න ගත්තා. අපේ මහන්සියට තෑගි ලැබුණු බවක් අපිට දැනුණා.

ඊට පස්සේ අපේ පුරෝගාමී රැස්වීමක් පැවැත්වුණා. ගාල්යා අනිත් කණ්ඩායම්වලට කීවා අපි කරලා තියෙන දේ ගැන. හැම කෙනෙක් ම ඒ ගැන උනන්දු වුණා. දෙවැනි කණ්ඩායමේ අයට ඕනෑ වුණේ ඒ ගොල්ලෝ කරමින් හිටිය වැඩේ එහෙම ම නවත්තලා අපට එකතු වෙන්නට යි.

"නෑ, නෑ ඒක හරියන්නේ නෑ. ඔයාලා ඔක්කෝ ම මී මැස්සන් ඇති කරන්න ගියොත් කවුද පරීක්ෂණ පාත්තියේ කටයුතු කරන්නේ ? " ගාල්යා ඇසුවා.

"අපි අපේ වැඩ අතාරින්නේ නෑ. අපි අපිට වෙලාව තියෙන වෙලාවට ඇවිත් මී මැස්සන් බලන්න එනවා විතරයි" ඒ ගොල්ලෝ කීවා.

"ඒක වෙන ම කාරණාවක්. තමන්ගේ වැඩේ නොසළකා හරින්නෙ නැති නං ඕන වෙලාවක අපි ඔයාලව මෙහේට පිළිගන්නවා. වත්තත් වැදගත් කියලා ඔයාලා දන්නවානේ"

ජූනි 26

මී මැස්සෝ රොන් සොයන්න යන හැටි අද අපි බලාගෙන හිටියා. අපි හොයා ගත්තා උන් අපේ පරීක්ෂණ පාත්තියෙන්

එහාට යන්නේ නැති බව. අපේ කැකිරි, එළවළු ජාති, වට්ටක්කා හැම ජාතියක ම මල් පිපිලා. හැම පේළියක් ම පුංචි කහපාට මල්වලින් වැහිලා ගිහින්. අපි බලාගෙන හිටියා මී මැස්සෝ මලෙන් මලට පියාඹන හැටි, පොළොවට කිට්ටු පුංචි මල් කෙමි අස්සට බඩගාන හැටි.

වට්ටක්කා මලක් ඇතුළට බඩගෑව එක මී මැස්සෙක් එළියට ආවේ කහපාට රොන් මුළු ඇඟ පුරා ම ගාගෙනයි. මී මැස්සෝ සමහරක් පාරට එහා පියාඹා යන හැටි අපි දුටුවා. ඒත් උන් කොහේට ගියාද කියලා පස්සෙන් ගිහින් දැන ගන්න අපිට බැරි වුණා. උන් ඉගිල්លුනේ ඒ තරං උඩින්. වැඩියෙන් ම හිතන්න පුළුවන් උන් උද්‍යානෙට ගියා කියල යි.

ජූනි 27

මී මැස්සන්ට කෑමට දෙන්න යූරා පැණි ටිකක් වීදුරුවකට ගෙනාවා. එයා පැණි චුට්ටක් වීදුරු කෑල්ලක ඉහිරවලා ඒක මී මැසි පෙට්ටිය කිට්ටුවෙන් තිබ්බා. අපි සූදානම් කළ සංග්‍රහය ගැන කිසි ම බැල්මක් හෙළන්නේ නැතිව මී මැස්සෝ ඒක පහු කරගෙන ඉගිල්ලිලා ගියා. ෂේන්යා එක මී මැස්සෙකුට මහපටැඟිල්ල තියලා අල්ලාගෙන උාව හරියට ම පැණි ටික උඩට අතෑරියා. මී මැස්සා එක සැරේට ම පැණි ටික කන්න ගත්තා. උා මොනවා කරාවිද්දයි අපි බලාගෙන හිටියා. පැණි කෑවාට පස්සේ උා ආපහු මී මැසි පෙට්ටියට ඉගිල්ලී ගියා. ඉක්මනින් ම තව එකෙක් එළියට ඇවිත් වීදුරු කෑල්ලට පියාඹලා පැණි කන්න පටන් ගත්තා. ඊට පස්සේ උාත් ආපහු මී මැසි පෙට්ටියට ම ඉගිල්លුනා. මිනිත්තුවකට නැත්තං දෙකකට පස්සේ තවත් මී මැස්සෙක් කෙළින් ම පැණි තියෙන තැනට ඉගිල්ලුණා. හරියට ම උා එතැන පැණි තියෙන බව දැනගෙන හිටියා වගේ. අපි හොඳට ම පුදුම වුණා. උන් කොහොමද පැණි ටික ගැන දැන ගත්තේ?

"ෂෙන්යාගේ මී මැස්සා උන්ට කිව්වා වෙන්ඩ ඇති" මම කීවා.

අනිත් අය මට හිනා වුණා. "මී මැස්සන්ට බෑ එක එකාට කතා කර ගන්න"

"ඒත් කොහොමද මෙතන පැණි තියෙනවා කියලා අනිත් උන් දැන ගත්තේ?"

"සමහරවිට පියාඹලා යනකොට අහම්බෙන් දැක්කා වෙන්ඩ පුළුවනි"

මී මැස්සා ඉගිල්ලී ගියාට පසු ෆ්‍රේද්යා මෙහෙම කීවා. "අපි පැණි ටික හංගලා බලා ඉඳිමු මොකද වෙන්නේ කියලා"

අපි පැණි තියෙන වීදුරු කෑල්ල අහකට ගත්තා. මිනිත්තු කීපයකට පස්සේ අපි දුටුවා මී මැස්සෙක් පෙට්ටියෙන් එළියට ඇවිත් කලින් පැණි තිබුණු තැනට කෙළින් ම පියාඹනවා. උෟ එතැන පැණි තිබුණු බව දැනගෙන හිටියා කියන එක හොඳට ම පැහැදිළියි. එහෙම නං ඒ ගැන කවුරුන් හෝ උෟට කියලා තියෙනවා. මී මැස්සා හුග වෙලාවක් එතැන කරකැවෙමින් සිටියා. ඉතිං අපි පැණි ටික ආයෙත් එතැනින් ම තැබුවා. උෟ කෙළින් ම ඒකට පියාඹා ඇවිත් ටිකක් කාලා යන්නට ගියා. පැණි ටික තවත් ටිකක් ඈතින් තබන්නට අපි උත්සාහ කළා. බොහෝ ඉක්මනින් ම මී මැසි පෙට්ටියෙන් පිටවුණු මී මැස්සෙක් පරණ තැනට කෙළින් ම ඉගිල්ලී ආවා. පැණි නැති බව දැන ගැනීමෙන් උෟ පුදුම වුණු බවක් පෙනුණා. පැණි තියෙන තැන හොයා ගත්තා තුරාම උෟ සූ හඬ නගමින් වටේ කැරකුණා. ඒත් ඊළඟ මී මැස්සා කෙළින් ම අලුත් තැනට පියාඹලා ආවා.

මට ඇතිවුණු සතුට නිමක් නෑ.

"පේනවාද! ඒ කියන්නේ පැණි ටික එහාට වෙලා කියලා උෟට කවුරු හරි කියලා තියෙනවා"

අපි මී මැස්සෝ දිහා දවස පුරාම බලාගෙන හිටියා. පැණි ටික තියෙන තැන වෙනස් කළ හැම වෙලාවේ ම ඉස්සෙල්ල ම එන මී මැස්සා කෙළින් ම යන්නේ ඒක ඊට කලින් තිබුණු තැනට යි. ඊට ටික වෙලාවකට පස්සේ උෟ තැන හොයා ගන්නවා. දෙවැනියට එන මී මැස්සා හරියට ම නියම තැනට කෙළින් ම එනවා. උන් එක එකා අතරේ කතා බහ කරගන්න මොනවා හරි විදිහක් තියෙනවා කියලා ලේසියෙන් ම තේරෙනවා.

එත් උන් කතා කරන්නේ කොහොමද? ගෙදර ආව හැටියේ ඉඳලාම මම කල්පනා කළේ ඒ ගැන. උන්ට කතා කරන්න පුළුවන් නම් උන්ට දිවක් තියෙන්න ඕනෑ. ඒත් අපි කොහොමද හොයා

ගන්නේ උන්ට හැබෑට ම දිවක් තියෙනවා කියලා? උන් ඒ තරමට පුංචි සත්තු ජාතියක් නේ. ඒ වගේ ම උන්ට කතා කරන්න පුළුවන් නම් ඒකේ තේරුම උන්ට කන් තියෙන්නත් ඕනෑ කියන එක යි. උන්ට කන් තියෙනවද කියලා මං හෙට හොයා බලනවා.

ජූනි 28

මී මැස්සන්ට කන් දෙකක් නෑ. මං උන් එකෙකුට හුඟක් ළඟට වෙලා බැලුවා. ඒත් කනක ලකුණක් වත් මට පෙනුණේ නෑ. ඇත්ත වශයෙන් ම කොහෙත් ම උන්ට කන් ඇතියි කියලා මම හිතන්නේ නෑ. මම උන්ට මහ හයියෙන් කෑ ගහලා බැලුවා. ඒත් උන් නෙවෙයි යාන්තං වත් මාව ගණන් ගත්තේ.

අද නීනා සෙර්ගෙයෙව්නා ගුරුතුමිය අපේ මී මැසි පෙට්ටිය බලන්න ආවා. අපි ඈට අපේ පරීක්ෂණය ගැන කීවා. එය සිදු කළ හැටි ඇයට පෙන්වන ලෙස ඇය අපෙන් ඉල්ලා සිටියා. ඉතිං අපි මී මැස්සෙක් අල්ලලා පැණි තියෙන වීදුරුව උඩින් තිබ්බා. මී මැස්සා පැණි ටික කාලා ආපහු මී මැසි පෙට්ටියට ඉගිල්ලුණා. මිනිත්තු කීපයකින් මී මැස්සෙක් එළියට ඇවිත් කෙළින් ම පැණි තියෙන තැනට පැමිණියා.

"ආන් බලන්න!" අපි කෑ ගැහුවා. "ඒ කියන්නේ පළවෙනි එකා පැණි ගැන උඟට කියලා තියෙනවා"

"අපි මේ මී මැස්සාට ලකුණක් තියන්න බලමු" ගුරුතුමිය කීවා. කුඩා තීන්ත බිංදුවක් මී මැස්සාගේ පිටපස්ස පැත්තේ යාන්තමින් තැබීමෙන් එය කළ හැකි බව ඈ අපට පැහැදිළි කළා. තෝල්යා ගෙදර දුවලා තීන්ත බඳුනක් අරගෙන ආවා. මී මැස්සා පැණි වීදුරුව උඩ වැහුව හැටියේ ම එයා සුදු තීන්ත ලපයක් උගේ පස්ස පැත්තේ තිබ්බා. මී මැස්සා කොච්චර පැණිවලට වහ වැටිලා හිටියද කියනවා නං වෙන කිසි දෙයක් උඟ දැක්කේ නෑ. පැණිවලින් බඩ පුරවා ගත්ත උඟ ඉගිල්ලිලා ගියා. අපි මිනිත්තු කීපයක් බලාගෙන හිටියා. ඒත් කවුද දන්නවාද ඊළඟට මී මැසි පෙට්ටියෙන් එළියට ආවේ. වෙන එකෙක් නෙවෙයි කලින් මී මැස්සා ම යි. උඟ කෙළින් ම පැණි තියෙන තැනට ආවා. උඟ තවත් පැණි ටිකක් කෑවාට පස්සේ ආපහු ඉගිල්ලී ගියා.

ටික වෙලාවකින් ඌ ආයෙත් ආවා. අපි මහත් පුදුමයට පත් වුණා.

"මොන පෙරේත මී මැස්සෙක්ද!" මම කිව්වා. "ඔහොම කාගෙන ගියොත් ඌව පැලිලා මැරෙයි"

ඒත් ගුරුතුමිය අපට කියා දුන්නේ මී මැස්සා කොහෙත් ම කෑමක් සිදු නොකරන බව යි. ඌ කරන්නේ තමන්ට ගෙනියන්නට පුළුවන් තරම් පැණි මී වදයට ගෙන යන එක බව යි. හැම මී මැස්සෙක් ම කරන්නේ ඒකයි. උන්ට රොන් හමුවෙන හැම වෙලාවෙ ම උන් ඒවා මී වදයට අරගෙන එනවා.

සුදු තිතක් තියෙන මී මැස්සා ආයෙත්, ආයෙත් ආවා. මී මැස්සන් ගණනාවක් ආවා යැයි අපි හිතාගෙන හිටියත් ඒ එක මී මැස්සෙක් විතරක් බව අපට පෙනුණා.

"එහෙනං උන් එක එකාට කතා කරගන්නේ නෑ?"

"ඇත්ත වශයෙන් ම උන් මිනිස්සු වගේ කතා කරන්නේ නෑ" එහෙම කීවේ අපේ ගුරුතුමී. "ඒත් උන්ට තම තමන්ගේ පණිවිඩ හුවමාරු කරගන්න විදිහක් තියෙනවා. උන්ට උන්ගෙ ම භාෂාවක් තියෙනවා. ඔයාලා හොඳට පරිස්සමින් නිරීක්ෂණය කළොත් කොහොමද උන් ඒක කරන්නෙ කියලා හොයා ගන්න පුළුවන් වේවි"

ජූනි 29

මී මැස්සෙක්ව මී වදයෙන් හුඟාක් ඈතට ගෙනිහින් දැම්මොත් ඌට ආපහු වදයට එන්න පාර හොයා ගන්න පුළුවන්දැයි බලන්නට අපි අද තව පරීක්ෂණයක් කළා.

එක මී මැස්සෙක්ව වීදුරුවකට අල්ලා ගත් මම ඌට පියඹා යන්නට බැරි ලෙස වීදුරුවේ කට වහලා ගෙදරට අරගෙන ආවා. මම යාළුවන්ට කීවේ ඌට ලකුණක් තියලා අපේ ගෙදර බැල්කනියේ ඉඳලා ඌට යන්න ඉඩ හරිනවා කියලායි.

යාළුවෝ ටික බලාගෙන හිටියා ලකුණු කළ මී මැස්සා ආපහු ඒවිද කියලා. මම ගෙදර යන අතරේ වීදුරුව උඩට අල්ලාගෙන ගියේ අපි යන දිහාව මී මැස්සාට බලාගන්න පුළුවන් වෙන්න යි. ඌට පියාඹලා යන්න බැරි වෙන්න වීදුරුවේ කට වහ ගන්න

වග බලා ගත්තා.

උෟට ලකුණක් තියන්න කලින් ඉගිල්ලිලා යන එක වළක්වන්නට මම කළේ පීරිසියකට පැණි ටිකක් දාලා වීදුරුවේ කට හරවලා ඒක උඩ තියන එකයි. මී මැස්සා පැණිවලට වැහුව හැටියේ ම වීදුරුව අයින් කළ මම උෟට තීන්ත ලපයක් තිබ්බා. උෟ සන්සුන් විදිහට පැණි එකතු කර ගත්තා. ටික වේලාවකට පස්සේ උෟ ඉගිල්ලිලා ගියා. මම කඩිනමින් පාසල දිහාවට ගමන් කළා. අතරමගදී මට සෙර්යෝෂා මුණ ගැසුනා.

"ඒකා ආපහු ආවා! ඒකා දනට ම එහේට ඇවිත්!" ඔහු කෑ ගැහුවා.

අපි පාර මැද්දේ ම සතුටින් උඩ පැන්නා. මොන තරම් බුද්ධිමත් මී මැස්සෙක්ද! හිතලා බලන්න එච්චිර පුංචි සතෙක් එච්චර දුරක් පාර හොයාගෙන ගිය එක ගැන!

"මට වීදුරුව දෙනවකෝ, අපි තවත් මී මැස්සෙක් අල්ලාගෙන පරීක්ෂා කරමු"

ඒත් මම ඇවිත් තිබුණේ වීදුරුව ගෙදර තියලායි. අපි ආපහු අපේ ගෙදරට දිව්වා. පැණි පීරිසිය අහකට ගන්න හදනවාත් එක්ක ම මී මැස්සෙක් ඇවිත් පැණිවලට වහලා පැණි එකතු කරන්න ගත්තා. අපි උෟ දිහා පරීක්ෂාවෙන් බලද්දී පෙනුණා උගේ පිටේ තීන්ත ලපයක් තියෙන හැටි.

"හෝ... ඒ අර මී මැස්සා ම යි! උෟ ආයෙත් තව පැණි ගෙනියන්න ඇවිත්"

"සමහර මී මැස්සෝ ආපහු තමන්ගේ ගේ තියන තැනට පාර හොයාගෙන ගිහින් තවත් පැණි ගෙනියන්න ආයිත් පියාඹලා එනවා" යෙර්යෝෂා කීවා.

"අපි තව ටිකක් වෙලා බලමු. සමහරවිට උෟ ආයිත් ඒවි" මම යෝජනා කළා.

අපි බලා සිටියා. මිනිත්තු දහයකින් පමණ මී මැස්සා ආයේත් ආවා. හැන්දෑව වෙනකොට උෟ විසි සැරයක් ආවා. පුදුම කෘමියෙක්! උෟ නිකම් ම මැස්සෙක් වුණා නං තමන්ගේ බඩ විතරක් පුරවාගෙන ඉගිල්ලිලා යනවා යන්න. ඒත් මී මැස්සා උෟ ගැන විතරක් නෙවෙයි හිතන්නේ. උෟ මී වදයේ ඉන්න අනිත් මී මැස්සන්ටත් පැණි අරගෙන යනවා. සමහර මිනිස්සුන්ට මී

මැස්සන්ගෙන් ආදර්ශයක් ගන්න පුළුවන්.

ජූනි 30

අපිට ගැටළුවක් වෙච්ච එක දෙයක් තියෙනවා. මී වදයෙන් හුගාක් ඈත තියන පැණි ටිකකට මී මැස්සෙක්ව තිබ්බහම උං ඒ තැන මතක තියාගෙන ආයෙත් තව පැණි ගෙනියන්න එතැනට ම එනවා. ඒත් පැණි ටිකක් මී වදය ළඟින් ම තියලා බලා හිටියට එක ම මී මැස්සෙක්වත් ඒකට වහන්නේ නෑ? උන් ඒක පහුකරගෙන පියාඹලා යනවා.

තවත් පරීක්ෂණයක් කරන හැටි ගුරුතුමිය අපට කියා දුන්නා.

"වීදුරු කැලි දෙකක් අරගෙන ඒ දෙකට ම වෙන වෙන ම පැණි ටික ගානේ දාන්න. එකක් බිම තියන්න. අනික පාට කඩදාසියක් උඩ තියන්න. එහෙම කරලා බලන්න කොයි එකේ මී මැස්සො කලිං වහයිද කියලා"

ඉතිං ඈ කී විදිහට අපි කළා. පැණි තියෙන එක වීදුරු කැල්ලක් අපි තණකොළ උඩින් තිබ්බා. අනික අපි තිබ්බේ ලා නිල් පාට කඩදාසියක් උඩ. මුලදී මී මැස්සෝ මේ දෙකෙන් එකක්වත් නොදැක ඒවා පහුකරගෙන පියාඹලා ගියා. ඒත් ටික වෙලාවකට පස්සෙ එක මී මැස්සෙක් නිල්පාට කඩදාසිය උඩ වීදුරු කැල්ලෙ වැහැව්වා. අපි උංට ලකුණක් තිබ්බා. ටික වෙලාවකින් උං ආයෙත් ආවා. ඉක්මනින් ම තවත් එකෙක්, ඒ කියන්නේ ලකුණක් නැති තව මී මැස්සෙක් එතනට ඇවිත් වැහැව්වා. අපි උංටත් ලකුණක් තිබ්බා. පැය දෙකකදී මී මැස්සෝ පහක් නිල්පාට කොළය උඩ පැණිවලට ආවා. ඒත් තණකොළ උඩ පැණි වීදුරු කැල්ලට එක ම එකෙක්වත් වැහැව්වේ නෑ.

"උන්ව අද්දලා ගන්න ඇත්තේ පාට වෙන්ඩ ඕනෑ" වීත්යා කීවා.

"ආන්න හරි, දැන් ඔයාලා දන්නවා ඇයි මල් වල ඔච්චරට දීප්තිමත් පාට තියෙන්නේ කියලා. ඒ මී මැස්සන්වයි අනිත් කෘමීන්වයි ආකර්ශනය කරගන්න" නීනා සෙර්ගෙයෙව්නා පැහැදිලි කළා.

"ඒත් මල් මොකටද මී මැස්සන්ව ආකර්ශනය කරගන්නේ?" මම

ඇසුවා.

"මී මැස්සෝ පරාගනයට උදව් කරන හින්දා. මැ මැස්සොයි, අනිත් කෘමීනුයි මල්වල වැඩි වැඩියෙන් වහන තරමට ඒවා වැඩිපුර පරාගනය වෙනවා. ඒකෙන් බීජ නිෂ්පාදනය වැඩිවෙනවා"

හැම පැළයක් ම කෘමීන් අතින් පරාගනය නොවෙන බව ගුරුතුමිය කීවා. උදාහරණයකට රයි වගේ සමහර පැලෑටිවල පරාගනය රැඳී තියෙන්නේ සුළඟේ යි. රයි මල් ඉතා ම පුංචියි. මී මැස්සන්ටවත් අනිත් කෘමීන්ටවත් ඒවා පේන්නේ නෑ.

ස්වභාව ධර්මය කොච්චර අපූරුද! මල් ඔච්චරට ලස්සන වෙලා තියෙන්නේ ඇයි කියලා මං මීට කලින් කල්පනා කරලා තිබුණේ. ඒකට හොඳ හේතුවක් තියෙන බව දැන් පැහැදිලියි. කෘමීන්ගෙන් පරාගනය වෙන පැළවලට ලස්සන ම ලස්සන ලොකු මල් තියෙනවා. ඒ කෘමීන්ට ඒවා ලේසියෙන් හොයාගෙන රොන් විසුරුවන්නට උදව් දෙන්න පුළුවන් වෙන විදිහට. ඒ කියන්නේ ලස්සන මල් බලන්න අපූරුයි විතරක් නෙවෙයි, ඒවායේ ප්‍රයෝජනයකුත් තියෙනවා.

ජූලි 1

අපි තව ම ත් අපේ මී මැස්සන් ගැන පරීක්ෂණ කරමින් සිටින්නේ. අද අපි කඩදාසි දෙකක් ගත්තා. එකක් රතු පාට, අනික නිල් පාට. ඒ දෙකට ම වෙන වෙන ම පැණි ටිකක් ගානේ දාලා මී මැස්සෙක්ව නිල් කොළය උඩින් තිබ්බා. ඌ දිගින් දිගට ම නිල් කොළය උඩට ආයෙත් ආයෙත් ඇවිත් පැණි අරගෙන ගියා. ඒත් ඌ ඒ ළඟින්ම තිබුණු රතු පාට කොළේ පැණි ගැන කිසි ම උනන්දුවක් පෙන්නුවේ නෑ. රතු කොළේත් නිල් කොළේ වගේ ම පැණි තිබුණා. ටික වෙලාවකින් අපි කොළ දෙකේ තැන් මාරු කරලා බැලුවා. මී මැස්සා නිල් කොළය කලින් තිබූ තැනට පියාඹලා ආවා. ඒත් ඌ රතු පාට කොළය දැක්කාම ඒ උඩ වහන්නේ නැතිව සූ හඬ නගමින් වටේ කරකැවුණා. අන්තිමට ඌ නිල්පාට කොළේ දැක්කා. දැකලා ගිහින් ඒකේ වහලා පැණි එකතු කර ගත්තා. ඊළඟට අපි නිල් කොළේ තවත් ටිකක් එහාට කළා. ඒත් මී මැස්සා ඒක සොයා ගත්තා.

අපි අනිත් පාටවලිනුත් පරීක්ෂා කළා. මී මැස්සෝ හැම වෙලේ ම යළි යළිත් ආවේ උන් මුලින් පැණි හොයා ගත්ත පාට තියෙන තැනට යි. ඒකේ තේරුම මී මැස්සන්ට පාට වෙන් කරලා හඳුනා ගන්න පුළුවන් විතරක් නෙවෙයි, උන්ට ඒ වගේ ම ඒවා මතක තියා ගන්නත් පුළුවන් කියන එකයි. ඒ හින්දායි උන්ට වැඩියෙන් ම පැණි දෙන මල්වලට හැම වෙලේ ම එන්න පුළුවන්.

හෙට ග්‍රීෂායි ෆේද්යායි පුරෝගාමින්ගේ කඳවුරකට පිටත් වෙනවා. ඒ ගොල්ලෝ අද අපිට ආයුබෝවන් කියලා, ආයෙත් තමන් මී මැසි ජනපදයේ වැඩවලට එන්නේ නැති බව කීවා. ගිම්හාන කඳවුරට යන එක තියෙද්දී වුණත්, මී මැස්සන්ගෙන් වෙන් වෙලා යන එක කණගාටුවක් කියලායි ෆේද්යා කීවේ. ඒත් අපි එයාට කීවා කණගාටු වෙන්න එපා, අපි මී මැස්සන්ව හොඳින් බලා ගන්නවා කියලා.

ජූලි 2

මී මැස්සන් දිහා වැඩි වැඩියෙන් පරීක්ෂාවෙන් බලා හිටිය තරමට අපි තව තවත් පුදුමයට පත් වුණා. බැලූ බැල්මට නම් ඇත්තට ම මැස්සන්ගේත් මී මැස්සන්ගේත් කොහෙත් ම සමාන කමක් නෑ. මැස්සන් කමකට නැති මෝඩ එවුන්. උන් කරන එක ම දේ තමා සූ ගගා උන්ට ඕන නැති තැන්වලට ම බඩ ගාන එකයි, ඒ ඇර මිනිස්සුන්ට හිරිහැර දිදී හැම ජාතියක ම විෂ බීජ පතුරවන එකයි. ඒත් මී මැස්සො හැම වෙලේ ම කරන්නේ ප්‍රයෝජනවත් දෙයක්. උන් අනිත් මී මැස්සොත් එක්ක එකට වැඩ කරනවා. හැම එකෙක් ම වැඩ කරන්නේ තමන් වෙනුවෙන් නෙවෙයි, මුළු මී මැසි ජනපදේ ම වෙනුවෙන්. උන් කොච්චර නම් පුදුම දේවල් කරනවාද! අද අපි මී මැසි ජනපදේ ළඟට ආවා ම මොනවා දැක්කා කියලාද ඔයාලා හිතන්නේ? මී මැස්සෝ හුඟ ගණනක් දොරකඩින් ඉඳගෙන තටු ගහනවා වේගයෙන්. හරියට පුංචි ඇංජින් ටිකක් වගේ. මුලදී අපි හිතුවේ උන් ලැල්ලට ඇලිලා ඉගිලෙන්න බැරිව ඉන්නවා කියලායි. අපි උන්ව එළෙව්වා, ඒත් උන් ඉගිල්ලිලා ගිහින් ආපහු ඇවිත් ආයේත් ඒ විදිහට ම තටු ගසන්නට ගත්තා. අපි ගුරුතුමිය ළඟට දුවලා ගිහින් ඒකේ තේරුම

මොකක් දැයි ඇහුවා.

"උන් මී වදේට හොඳ වාතාශ්‍රය සපයනවා. අද හුඟක් උණුසුම් දවසක්. මී වදේ ඇතුළේ වාතාශ්‍රය අඩු වෙනවා උණුසුම් කාලගුණේදී, ඉතිං උන් ඒක සිසිල් කරවනවා" ඈ කීවා.

මං කිව්වේ නැද්ද උන් අරුම පුදුම ජාතියක් කියලා. උන් ගාව උන්ගේ ම වාතය සැපයීම් ක්‍රමයක් තියෙනවා.

අද තවත් හිත කළඹවන දෙයක් සිද්ධ වුණා. මගේ අම්මායි තාත්තායි මී මැසි ජනපදය බලන්නට ආවා.

ජූලි 3

තවත් උණුසුම් දවසක්. මී මැස්සෝ දවසෙන් වැඩිමනක් ගෙව්වේ මී මැසි ජනපදයට වාතාශ්‍රය සපයමින්. ඒ වගේ ම උන් මී මැසි පෙට්ටිය යි, වතුර පීප්පය යි අතරේ එහාටත් මෙහාටත් ඉගිල්ලුණා. අහසේ දිග ඉරි දෙකක් තියෙන්නා වාගෙයි. එකක් මී මැසි ජනපදයේ ඉඳලා පීප්පය ළඟට, අනික පීප්පය ළඟ ඉඳලා මී මැසි ජනපදය ළඟට.

වතුර බිව්වාට පස්සේ උන් මී වදයට ආපහු යන්නේ මොකදැයි කියලා අපට තේරුම් ගන්න බැරි වුණා. වතුර බොන්න එන මී මැස්සන්ට ලකුණක් තියන්න කියලා ගුරුතුමිය කීවා. තෝල්යා මී මැස්සන්ට තිත් තිබ්බා. බොහෝ ඉක්මනින් ම අපට බලාගන්න පුළුවන් වුණා හැම වෙලාවෙ ම වතුර බොන්න ආවේ එක ම මී මැස්සන් ටිකක් කියලා.

"ඒක එක විදිහක වතුර ගේන කණ්ඩායමක්. උන් මී වදේට වතුර ගෙනියනවා වෙන්ඩ ඕනෑ" ෆේද්යා හඬ නැඟුවා.

"ආන්න හරි. උණුසුම් කාලගුණයේදී මී මැස්සන්ගෙන් සමහර දෙනෙක් මී මැසි ජනපදේට වතුර ගේනවා ඇතුළේ වැඩ කරන අනිත් උන් වෙනුවෙන්" ගුරුතුමිය කියා දුන්නා.

"ඒ වුණාට එවුන්ටත් ඇවිත් තමන්ට ඕන වතුර ටික බීලා යන්න පුළුවන්නේ?" මම ඇසුවා.

මී වදයක තියෙන වැඩ වෙනස් නොවෙන විදිහට තදින් බෙදා දීලා තිබෙන බව ගුරුතුමිය පැහැදිළි කළා. තව ම ත් එළියට ගිහින් රොන් හොයන්න ඉගෙන ගෙන නැති තරුණ මී මැස්සෝ

ජනපදය ඇතුළේ මී වද බඳින වැඩ, වද පිරිසිදු කරන වැඩ, වාතාශ්‍රය සපයන වැඩ, ඒ වගේ ම මී මැසි පැටවුන්ට කෑම දෙන වැඩ වගේ දේවල් කරනවා. වැඩිමහළු මී මැස්සෝ තමයි රොන් හොයන්න, එතකොට උණුසම් දවස්වලට වතුර ගේන්න වගේ දේවල් වලට පිටට යන්නේ.

"උන් ඇතුළේ වැඩ කරන හැටි බලාගන්න බැරි එක අපරාදේ" ඒ ෂෙන්යා.

ගුරුතුමියි කීවා මී මැසි ජනපදයක ඇතුළේ වැඩ කරන හැටි බලන්න පුළුවන් විදිහේ වීදුරු මී මැසි පෙට්ටි තියෙනවා කියලා. කවදා හරි දවසක අපිත් ඒ වගේ මී මැසි පෙට්ටියක් ගන්නවා.

ජූලි 4

ගුරුතුමිය අපට අද කීවා දෙහි ගස් ඉක්මනින් ම මල් පිපේවි, ඒ හින්දා අපි ප්‍රධාන පැණි වාරයට සූදානම් වෙන්න ඕනෑ කියලා.

"ඒ මොකක්ද?" අපි ඇහුවා.

"ඒ තමයි හුගාක් මල් ජාති ඒ කියන්නේ ඇඹිල්ල, බක්වීට්, මේපල්, නැත්තං විලෝ වගේ ගස් වල එක සැරේ පිපෙන කාලේ. එතකොට තමයි මී මැස්සෝ අතිරික්ත පැණි ගබඩා කරන්නේ"

"ඒත් අපිට බක්වීට් හරි ඇඹිල්ල හරි නැනේ"

"ඒ වුණාට අපිට දෙහි ගස් තියෙනවානේ. අපේ මී මැස්සෝ ඒවායින් අතිරික්ත පැණි හදා ගනීවි"

මී මැසි පෙට්ටියට වැඩිපුර කෑල්ලක් එකතු කර ගන්නා හැටි ඇය අපට පෙන්නා දුන්නා. ඒක එක විදිහක ගබඩාවක් වගේ. ඒකේ ලොකු අමතර රාමු තියෙනවා. ඒවායේ පැණි හුගාක් ගබඩා කරන්න පුළුවනි. ඊට පස්සේ ඈ අපට කීවා දෙහි ගස්වල මල් පිපෙනවද කියලා බලන්න කියලා. මුලින් ම මල් පිපෙනවා දැක්ක හැටියේ ම අමතර රාමු පෙට්ටියට එකතු කරන්න ඕනෑ.

ජූලි 5

දෙහි ගස්වල තාම මල් පිපිලා නෑ. මම ම එක ගහකට නැගලා බැලුවා, හරියට ම දැන ගන්න. ඒත් තව ම පොහොට්ටු ඇරිලා

නෑ.

තෝල්යා දැක්කා මම ගහ උඩ ඉන්නවා.

"ගහ උඩ නැගලා මක් කරනවද? වහා ම බහිනවා!"

"මං මේ මල් පිපිලද කියලා බලනවා"

"ඕකට ගස් උඩ නගින්නම ඕන නෑ. ඒවා පිපුනහම බිමට පේනවා"

ඒත් සහතිකේට ම දැන ගන්න මම සතුටුයි. ඒක අපිට මඟැරුනොත් ඒකෙන් වෙන්නේ නරකක්.

ජූලි 6

හැම වෙලාවෙ ම මී මැස්සෝ දෙන්නෙක් නැත්තං තුන් දෙනෙක් මී මැසි පෙට්ටියේ දොරකඩ ඉන්න හැටි මම දැකලා තියෙනවා. අනිත් උන් ඇතුළට යනවා, එළියට ඇවිත් පියාඹලා යනවා, ඒත් මේ මී මැස්සන් එක තැනකට වෙලා බලා ඉන්නවා මිසක කොහේටවත් පියාඹන්නේ නෑ. උන් එතැනට වෙලා මොනවා කරනවාද කියලා මම කල්පනා කළා. අද මම හොයා ගත්තා.

බඹරෙක් මී මැසි පෙට්ටියට ඇතුළු වෙන්න හැදුවා. ඌ සූ ගගා පෙට්ටිය වටේට වටේට ඉගිල්ලුණා. ඒ මී වදේ ඇතුළට යන්න තැනක් හොයන්න, ඇතුළට ගිහින් මී පැණි ටික ගිල දාන්න. කිසිම හිලක් හොයා ගන්න බැරි වුණා ම ඌ ප්‍රධාන දොරටුවෙන් ඇතුළු වෙන්න හැදුවා. ඒත් දොරකඩ හිටිය මී මැස්සෝ උගේ පිටට කඩා පැනලා ඌව ඈතට එළෙව්වා.

බඹරා තමන්ට පුළුවන් ඉක්මනින් එතනින් ඈතට ඉගිල්ලුණා. ඒත් මී මැස්සෝ ඌව අල්ලාගෙන විතෙන් විද්දා. පැණි හොරකම් කරන්න හැදුවාට නියම විදිහට සැළකුවා. කම්මැලි, වයසක බඹරෙකුට ගිල දාන්ඩ නෙවෙයි මී මැස්සෝ මහන්සි වෙලා පැණි එකතු කළේ. බඹරා පැණි ඩිංගක්වත් එකතු කළේ නෑ. ඉතිං ඌට කිසිම අයිතියක් නෑ ඒවා කන්න.

මම අනුමාන කළා මී මැසි ජනපදයේ දොරකඩ ඉන්න මී මැස්සෝ සමහර විට මුර භටයෝ වෙන්න පුළුවන් කියලා. උන් බඹරු වගේ හොරුන්ගෙන් මී වදය ආරක්ෂා කරනවා වෙන්නට ඇති. මම ගුරුතුමියගෙන් ඇහුවා. ඈ කීවා මම හරි කියලා.

එහෙනම් කොහොම වුණත් මම මොට්ටයෙක් නෙවෙයි.

ගුරුතුමිය අපට කීවා මී මැස්සෝ තමන්ගේ ජනපදය ආරක්ෂා කර ගනිද්දී නිතර ම මියයන බව. මොකෙක් හරි ලොකු මෘගයෙක්, ඒ කියන්නේ වලහෙක් වගේ එකෙක් මී මැසි ජනපදය ආක්‍රමණය කළොත් මුළු මී මැසි රංචුව ම ඇවිත් පහර දෙනවා. තමන්ගේ විතෙන් ආක්‍රමණිකයාට අනිනවා. ඒත් ඒ හැමෝ ම මැරෙනවා, මොකද මී මැස්සෙකුට තමන්ගේ විත නැතුව ජීවත් වෙන්න බැරි හින්දා. ඉතිං ජේනවානේ උන් කොච්චර නිර්භීතද කියලා.

ජූලි 7

අපි විද්‍යාවට ඉතා වැදගත් දායකත්වයක් සපයලා තියෙනවා. අද ෂෙන්යා ෂෙම්යාකින් සොයාගත්තා මී වදය ඇතුළත බලාගන්නා විදිහක්. එයා කණ්නාඩියකින් හිරු රැස් මී මැසි පෙට්ටිය ඇතුළට වැටෙන්නට සැළැස්සුවා. එවිට ඇතුළ එළිය වුණා. ඇත්ත වශයෙන් ම එක සැරේකට අපි එක්කෙනාට යි ඇතුළ බලන්නට පුළුවන් වුණේ. ඉතිං එක්කෙනා බැගින් ගිහින් බැලුවා. මගේ වාරේ කවදාවත් එන එකක් නෑ කියලායි මට හිතුණේ. මං ඉස්සරහින් හිටිය වීත්යා අල්මාසොව් කොච්චර වෙලාවක් ඒ දිහා බලා හිටියද කියනවා නං මගේ ඉවසීම හිඳුණා. එයාව ඉක්මන් කරවන්න හැදුව හැම වෙලාවෙ ම එයා කීවේ "පොඩ්ඩක් ඉන්නවා!" කියලායි. අන්තිමේ එයා මට කණ්නාඩිය දෙනකොට මං මුළු පැයකට වඩා බලා උන්නා වෙන්ඩ ඇති. ඒත් ඒ වෙනකොට ඉර බැහැලා ගිහින්.

"ඉර බැහැලා ගියා ම මොකටද තමුසේ මට කණ්නාඩිය දුන්නේ?"

"ඉර බැහැපු එක මගේ වැරැද්දක්යැ?"

නීච ආත්මාර්ථකාමී මෘගයා! හෙට මම කණ්නාඩියක් අරගෙන ගිහින් අනිත් අයට කලිං මං කැමති හැටියට බලනවා.

ගෙදරදී මම මී පැණි ගැන විස්තර තියන පත්තර ලිපියක් කියෙව්වා. මී පැණි බෙහෙතක් විදිහට ප්‍රයෝජනයට ගන්නා බව ඒකෙන් සොයා ගන්න පුළුවන් වුණා. බඩේ අමාරු, දුර්වල හදවත්, දුර්වල පෙණහළු, දුර්වල ස්නායු තියෙන මිනිස්සු, නැත්තං

වෙනත් ජාතිවල ලෙඩ තියෙන මිනිස්සු මී පැණි කන්නට ඕනෑ. එතකොට බොහෝ ම ඉක්මනින් ම ඒ ලෙඩ සනීප වෙනවා. විසප්පුවක් නැත්තං සැරව ගෙඩියක් තියනවා නම් කරන්නට තියෙන්නේ පැණි ටිකක් ගාලා රෙදි කෑල්ලකින් බඳින එක විතරයි. විසප්පුව හරි සැරව ගෙඩිය ඉක්මනින 'ම නැතිවෙලා යනවා.

ජූලි 8

මම උදේ ම නැගිටලා කණ්නාඩියක් අරගෙන මී මැසි පෙට්ටිය ළඟට ගියා. ඒත් අද ඉර පෑයුවේ නෑ. දවස පුරා ම කළු කරලා. මගේ වාසනාව තමා!

අද ආයේත් පුරෝගාමීන්ගේ රැස්වීමක් තිබුණා. හැම කණ්ඩායමක් ම තමන්ගේ වැඩ ගැන වාර්තා කළා. අපි අපේ පරීක්ෂණ ගැන කීවා. දෙවැනි කණ්ඩායම මෙහෙයවන යූරා පරීක්ෂණ පාත්තියේ වැඩ කටයුතු වාර්තා කළා. එයා කීවේ ගිය අවුරුද්දෙදීට වඩා විශාල කැකිරි අස්වැන්නක් එයාලා බලාපොරොත්තු වෙන බවයි. මෙතනදී පොඩි පැහැදිළි කිරීමක් කරන්නට ඕනෑ. ගිය අවුරුද්දේ අපි මී මැස්සෝ ඇති කළේ නෑ. මේ අවුරුද්දෙ අපේ මී මැස්සො කැකිරි පරාගනය කරන්න උදව් කළා.

ජූලි 9

අන්තිමේ ඉර පෑව්වා. මම මගේ ආවරණ දැළ දමාගෙන, අත්මේස් දෙක පැළඳ ගත්තා. ඒ මී මැස්සන් අනින්නේ නැති වෙන්න යි. ඊට පස්සේ මම මී මැසි පෙට්ටිය පැත්තකින් ඉඳ ගත්තා කණ්නාඩිය අතට අරගෙන. හප්පා.... මොන තරම් හිත කළඹන දර්ශනයක්ද! මී වද මී මැස්සන්ගෙන් සූරි ගැහිලා. කළුපාට රංචුවක් වුණු උන් වද උඩ එහාටත් මෙහාටත් බඩ ගෑවා. පුංචි කුටීරවල ඇතුළටත් ආයිත් එළියටත් බඩ ගෑවා. මී වදේ ඇතුළේ හුඟක් උණුසුම් වෙන්නට ඇති. මොකද මම දැක්කා දොරකඩ ඉඳන් තටු ගැසූ. මී මැස්සෝ වගේ ම ඇතුළේ මී මැස්සනුත් ඉඳගෙන තටු ගහනවා. හැම පුංචි මී මැස්සෙක් ම පෙනුණේ හරියට පුංචි

වායු පංකාවක් වගේ. මී මැසි බබාලව බලාගන්න මට තිබුණේ නැහෙන්න තරං ආසාවක්. ඒත් මට එයාලගේ ලකුණක්වත් බලාගන්න බැරි වුණා. පස්සේ මං ගුරුතුමියගෙන් ඇසුවා ඇයි අපේ මී මැසි ජනපදේ එකම මී මැසි බබෙක්වත් නැත්තේ කියලා.

"ඇයි ඔයා මී මැසි බබාලා ගැන හිතන්නේ?" ඈ මගෙන් ඇසුවා.

"මං හිතුවේ එයාලා චූටි ම චූටි මී මැස්සන් වෙන්ඩැති කියලා" මම කීවා.

ගුරුතුමිය හයියෙන් හිනා වුණා.

"නෑ.... එයාලා එහෙම නෙවේ. හෙට අපි මී මැසි පෙට්ටිය අරිමුකෝ. මං ඔයාලට පෙන්වන්නම් ඒ ගොල්ලන් කොයි විදිහද කියලා"

හැමෝ ම හෙට මී මැසි බබාලව බලන්න නොවරදවා ම එන්න කියලා මම කීවා.

ජූලි 10

අද උදේ අප් මුළු කණ්ඩායමම මී මැසි පෙට්ටිය ළඟට එකතු වුණා. ඉක්මනින් ම ගුරුතුමිය ආවා. ඈ අපට කියා දුන්නා මී මැස්සෝ කොහොමද එයාලගෙ පැටවුන්ව බෝ කරන්නෙ කියලා. මී මැස්සෝ හදන හදන හැම ඉටි කෝෂයක් ම පැණි ගබඩා කරන්න නෙවෙයි කියලා අපි එතකොට යි දැන ගත්තේ. එයින් සමහරක් ප්‍රයෝජනයට ගැනෙන්නේ පැටවුන් බෝ කරන්න යි. හැම මී මැසි ජනපදයක ම මී මැසි රැජිණක් ඉන්නවා. එයා වෙන කිසි ම දෙයක් කරන්නේ නෑ, බිත්තර දමන එක ඇර. අනිත් මී මැස්සියන්ට බිත්තර දමන්න බෑ, ඒ ගොල්ලන්නට පුළුවන් වැඩ කරන්න විතරයි. ඒ නිසා යි ඒ අය වැඩකාර මැස්සියෝ හැටියට හඳුන්වන්නේ. මී මැසි රැජිණ දවසකට බිත්තර දෙදාහක් විතර දානවා. ඈ හිස් ඉටි කෝෂවලට බිත්තරය බැගින් දානවා. ඒ කෝෂ හරියට පුංචි කූඩු වගේ.

මී මැසි පෙට්ටිය ඇරලා එක වද රාමුවක් එළියට ගන්න කියලා ගුරුතුමිය අපට කීවා. මුලදී අපි හිතුවේ වද හිස් කියලා. ඒත් නීනා සේර්ගෙයෙව්නා කීවා හොඳට ළං වෙලා බැලුවොත් බිත්තර

බලන්න පුළුවනි කියලා. හැබෑ ම තමා, ළඟට ම ඇහැ තියලා බැලුවහම චූටි ම චූටි බිත්තර අපට පෙනුණා. හැම කෝෂයක ම පතුලේ තමයි ඒවා තිබුණේ. ඒවා පොපි ඇටයකට වඩා ලොකු නෑ. එකම වෙනස පොපි ඇට කළු පාට යි, බිත්තර සුදු පාටයි වීම විතරයි.

එච්චර පුංචි බිත්තරේකින් මී මැස්සෙක් එළියට එන්නේ කොහොමද කියලා අපට නම් කොහොමවත් හිතාගන්න බැරි වුණා. ඒත් ගුරුතුමිය කීවේ බිත්තරවලින් එළියට එන්නේ මී මැස්සන් නොවෙයි කියලා යි. ඒ එළියට එන්නේ කීටයොලු. උන් හරියට චූටි ම චූටි පණුවන් නැත්තම් දළඹුවන් වගෙයිලු. මී වදය පරීක්ෂා කර බැලූ ගුරුතුමිය කීටයින් සිටින කෝෂ කීපයක් සොයා ගත්තා. උන්ගෙන් සමහර එවුන් හුඟාක් පුංචි යි, අනිත් උන් ටිකක් ලොකු යි. උන් කෝෂය පතුලේ වකුටු වෙලා උන්නා.

"කීටයෝ තමයි මී මැස්සන්ගේ ළමයි" නීනා සෙර්ගෙයෙව්නා කීවා. ඒක ඇහීමෙන් අපි හොඳටෝම පුදුම වුණා.

"එතකොට කොහොමද මේ පණුවෝ මී මැස්සන් වෙන්නේ? උන් පණුවෝ හරි දළඹුවෝ නෙවෙයිද?"

"නෑ කීටයින් පිළවුන් හැටියට සංවර්ධනය වෙනවා. ඊට පස්සේ දවස් ගාණකට පස්සේ පිළවාගෙන් සම්පූර්ණ වැඩුණු මී මැස්සෙක් මතු වෙනවා"

වැඩකාර මැස්සියන් ඇරුනහම මී මැස්සෝ රැජිණ පැටවුණුත්, පිරිමි මී මැස්සනුත් ඇති දැඩි කරන බවත් ගුරුතුමිය අපට කීවා. රැජිණ මැස්සියන්ට විශේෂ විශාල කෝෂ තනනවා. අලුත් රැජිණ මැස්සිය කෝෂයෙන් පිටවෙන්න කලින් පරණ රැජිණිය මී මැසි ජනපදයේ මැස්සියන් කොටසකුත් එක්ක පිටවෙලා ගිහින් වෙන ම ජනපදයක් හදා ගන්නවා. ඒ කණ්ඩායම තව මී මැසි පෙට්ටියකට දා ගත්තොත් අලුත් මී මැසි ජනපදයක් ඇති කරන්නට පුළුවනි. පිරිමි මැස්සන් වැඩකාර මැස්සියන්ට වඩා තරමක් විශාලයි. වැඩකාර මැස්සෝ ගැහැණුයි. පිරිමි මැස්සෝ පැණි එකතු කරන්නේ නෑ. ඒත් උන්ට තියෙන්නේ පුදුම බඩගින්නක් තමා. හීතල කාලේ ආවහම පිරිමි මැස්සන්ව මී වදෙන් එළියට එළවලා දානවා. නැත්තං උන් ගබඩා කරලා තියෙන ඔක්කෝම පැණි ටික ගිල දානවා.

නීනා සෙර්ගෙයෙව්නා අපට කියා දීපු දේ වලට පස්සේ මම මී මැස්සන් ගැන කල්පනා කළා. මුලදී මට හිතුණේ මී මැස්සන් හුඟක් කුරුල්ලන්ට සමාන යි කියලා යි. මොකද කුරුල්ලන්ටත් තටු තියෙනවා, ඒ වගේ ම උන් බිත්තරත් දානවා. ඒත් ඊට පස්සෙ යි මට මතක් වුණේ කිරිල්ලි බිත්තර උඩ ලැගලා රැකලායි පැටවුන් බිත්තරයෙන් එළියට එන්නේ කියලා. ඒත් මී මැස්සෝ උන්ගේ බිත්තර උඩ ලගින්නේ නෑ. ඒ වගේ ම උන්ගේ බිත්තර කීටයෝ බවට හැරෙනවා. ඒ හින්දා මී මැස්සන් කොහෙත් ම කුරුල්ලන්ට සමාන වෙන්නේ නෑ. නෑ, මී මැස්සන් වැඩියක් ම සමාන වෙන්නේ සමනලයින්ට යි. සමණලයින්ටත් තටු තියෙනවා. උනුත් බිත්තර දානවා, ඒ බිත්තර දළඹුවෝ වෙනවා, දළඹුවෝ කෝෂයක පිලවෙක් වෙනවා. එයින් පස්සේ සමණලයෙක් හැදෙනවා. මං ඒක දන්නවා. මොකද ගිය ගිම්හානයේදී මං ලෝම තියෙන විශාල දළඹුවෙක්ව පෙට්ටියකට දාලා බැලුව හින්දා. ඌ කෝෂයක් හදාගෙන හුඟ කාලයක් එහෙම ම හිටියා. අන්තිමේ එක අපූරු දවසක මෙන්න ඒකෙන් ලස්සන සමනලයෙක් එළියට ආවා. ඉතිං සමහරවිට මී මැස්සාත් හැබෑවට ම පුංචි සමණල ජාතියක්.

ජූලි 11

අද නම් බොහෝ ම සුන්දර ඉර පායපු දවසක්. මම උදේ ම මී මැසි පෙට්ටිය ළඟට ආවා. තෝල්යා එතන වාඩි වෙලා මී මැසි පෙට්ටියේ පියන ඇරලා කණ්නාඩියක් අල්ලාගෙන එබිලා බලාගෙන තනියම හිනාවෙනවා.

"මොකද තනියම හිනාවෙන්නේ?" මං ඇහුවා.

"නටනවා"

"නටනවා? කවුද?"

"මී මැස්සෝ!"

"තමුසෙට පිස්සු!"

"හොඳා බලනවකෝ ටිකක් එහෙනං!"

මමත් කණ්නාඩිය අරගෙන එබිලා බැලුවා.

මී මැස්සෙක් වදය පුරා එහා මෙහා පනින හැටි පෙනුනා. ඌ පැත්තෙන් පැත්තට හැරී ඉක්මනින් ම වටේට කරකැවෙන්නට

වුණා. හිටි ගමින් ම තවත් මී මැස්සෙක් උෟ පස්සේ දිව්වා. උන් දෙන්නාම එකට කැරකෙන්නට ගත්තා. ඊට පස්සේ තුන්වෙනි එකෙකුත් එකතු වුණා. උන් කොච්චර විහිළු විදිහට ඒක කළාද කියනවා නං මට හිනාව නවත්තා ගන්න බැරි වුණ තරම යි.

"උන් හුඟ වෙලාවක් තිස්සේ ඒක කරනවා. මං බලාගෙනයි උන්නේ" තෝල්යා කීවා.

මී මැසි පෙට්ටියේ පහළ දොරටුව දිහාත්, බිම දිහාත් මම බැලුවා. එතකොට මම දැක්කේ මී මැස්සෝ රංචුවක් ම වටයක් ගැහිලා නටන හැටි යි. උන්ගෙන් එකෙක් නැටුම මෙහෙයෙව්වා. අනිත් උන් උගේ හැම ඉරියව්වක් ම අනුකරණය කරමින් නැටුවා. නායකයා වටේට වටේට කරකැවුණා. අනිත් උනුත් ඒක ම කළා. ඊට පස්සේ නායකයා වෙන තැනකට පියාඹලා ගිහින් ආයේත් එතැන නටන්න ගත්තා. ටිකෙන් ටික අනිත් එවුනුත් එතෙන්ට එකතු වෙලා ආයේත් එකට නටන්න වුණා.

අපේ අනිත් සගයෝ ටික ආවායින් පස්සේ අපි මී මැස්සන්ගේ නැටුම ඒ ගොල්ලන්ට පෙන්නුවා.

"මොන කෙහෙම් මලක්ද ඒකේ තේරුම?" ඒ වීත්යා.

"සමහරවිට මොනවා හරි විදිහක මී මැසි නිවාඩු දවසක්වත්ද?"

මී මැස්සන්ට නිවාඩු දවසක් තියෙනවා කියන අදහස ඇහුවා ම අපි හැමෝ්ට ම හිනා ගියා.

අපි ගුරුතුමිය ළඟට දිව්වා, මී මැස්සන් නටන්නේ ඇයිද කියලා අහන්න. හුඟක් මල් තියෙන තැනක් මී මැස්සෙකුට හම්බ වුණා ම උෟ ආපහු වදේට පියාඹලා ඇවිත් නටනවා කියා ඈ කීවා. ඒ තමා අනිත් මී මැස්සන්ට රොන් ගන්න යන්න ඕනෑ කොහාටද කියලා දන්වන විදිහ. අනිත් උන් උෟ වටේ රංචු ගැහිලා ඉව කරලා බලනවා. සුවඳින් උන්ට කියන්න පුළුවන් මොන මල්වලින්ද රොන් අරන් තියෙන්නේ කියලා. ඊට පස්සේ මී මැස්සෝ එළියට ඇවිත් මල් තියෙන තැනට පියාඹනවා.

"ප්‍රධාන පැණි වාරෙට තමා මී මැස්සන් නටන හැටි වැඩියක් ම බලාගන් පුළුවන්" ගුරුවරිය කීවා "මං හිතන්නේ ඔයාලා ගිහින් බලන්න ඕනෑ දැන් දෙහි ගස් වල මල් පිපිලද කියලා"

අපි ඉක්මන් කරලා පාසලට ගියා. පාසල් වත්තේ පරණ විශාල දෙහි ගස් ගණනාවක් තියෙනවා. උඩ බැලුව අපට පෙනුණා

පුංචි ලා කහ පාට මල් පිපිලා තියෙන හැටි. මී මැස්සෝ දූනට ම ත් ඒවා උඩින් රංචු ගැහිලා. මී මැසි පෙට්ටියේ අමතර කොටස් එකතු කරන්න අපි කට්ටිය දිව්වා. අපේ මී මැස්සේ හැන්දෑව වෙනකම් ම ජනපදය ඇතුළේ නැටුවා. එක මී මැස්සෙක් නටාගෙන ඇවිත්, උන්ට ලගින්නට හදලා තියෙන ලෑල්ලට වැටිලා ඊට පස්සේ ඉගිල්ලිලා ගියා.

අද හැන්දෑවේ ගෙදර ආවට පස්සේ මම මී මැස්සන් ගැන හුඟාක් කල්පනා කළා. එහෙනම් එහෙම යි මී මැස්සෝ එක එකාට කතා කර ගන්නේ! රොන් ගන්න යන්න ඕනෑ කොහාටද කියලා තව එකෙකුට කියන්න ඕනෑ වුණා ම උන් කරන්නේ නටන එක. ඇත්ත වශයෙන් උන් එක එකාට කතා කරගන්න බෑ. ඒත් උන්ට සුවඳින් පාර හොයා ගන්න පුළුවන්. ඒකේ තේරුම උන්ගේ සුවඳ දැනීම අපට වඩා හුඟාක් උසස් විදිහට දියුණු වෙලා කියන එක යි. ඒකේ හැබෑවට ම පුදුම වෙන්න දේකුත් නෑ, මොකද මිනිස්සුන්ට වඩා බල්ලන්ටත් හොඳ සුවඳ දැනීමක් තියෙන හින්දා. ඒත් එතකොට බල්ලෝ මී මැස්සන්ට වඩා හුඟාක් ලොකුයිනේ.

ඊට පස්සේ මං හිතුවේ මල් ගැනයි. ඇයි ඒවා ඒ තරමට සුවඳ? නිකම්ම මිනිස්සුන්ට සතුටක් දෙන්න විතරද? නෑ, මල්වල සුවඳත් ඒවායේ පාට වගේ ම තියෙනවා ඇත්තේ මී මැස්සන්ව අද්දවා ගෙන පරාගනයට උදව් කරගන්න වෙන්න ඕනෑ. මී මැස්සයොයි අනිත් කෘමීනුයි තමන් ළඟ පැලපදියම් වෙන තරමට ගහකට හොඳ යි. එතකොට තව දෙයක් තියෙනවා... මල්වල රොන් තියෙන්නේ ඇයි? ඒකත් කෘමීන් අද්දවා ගන්න නෙවෙයිද? මම හෙට ඒක ගුරුතුමියගෙන් අහනවා.

ජූලි 12

මම ගුරුතුමියගෙන් ඇහුවා. ඈ කීවා මම හරි කියලා.

ජේන හැටියට මම බුද්ධිමත් වේගෙන එනවා. හිතන එක ම තමා ඒක කරන්නේ. දූත් ඉඳලා මම හැම ජාතියක ම දේවල් හැම වෙලේ ම හිතන්නයි යන්නේ. ඒකෙන් හිත පළල් වෙනවා.

අපේ මී මැස්සෝ අද නං මුළු දවස ම ගිනි සැරේට වැඩ. උන්

මුළු වටපිටාවෙ ම පිරිලා එක විදිහට හ්ම්...ම්.. සද්ද කරනවා. හරියට ගිය මාසේ ගාල්යා අපිව එක්ක ගිය රෙදි වියන කම්හලේ වගෙයි. මී මැස්සෝ කලබලයෙන් මී වදයෙන් එළියට එනවා, ඇතුළට යනවා. දෙහි මල් පිපිලා තියෙන කාලේ තමන්ට පුළුවන් තරම් රොන් එකතු කර ගන්න කලබලේකින් වැඩ කරනවා වගෙ යි පේන්නේ. ඇතුළු වෙන දොරටුව ළඟ ලෑල්ල මුළු දවස තිස්සේ ම ඇතුළට රොන් අරන් එන මී මැස්සන්ගෙනුත් වදයෙන් එළියට එන මී මැස්සන්ගෙනුත් පිරිලා තිබුණා. ඒ වගේ ම ගසුත් උන්ගෙන් සූරි ගැහිලා. මී මැස්සන් හින්දා මල් පේන්නෙත් නැති තරම්. උන් දාස් ගාණක්. අපි කොහෙත් ම හිතුවේ නෑ අපි ගාව එච්චර මී මැස්සන් ඉන්නවා කියලා.

ගුරුතුමිය අපට කීවා ප්‍රධාන පැණි වාරයට මී මැසි ජනපදයේ වැඩකාර මැස්සියෝ අසූ දාහක් විතර ඉන්න පුළුවන් කියලා. සමහර විශාල ජනපදවල සියක් දාහක් වුණත් ඉන්න පුළුවන්ලු.

සියක් දාහක්! නිකම් ඒ ගැන හිතලා බලමු. නගරෙක ජනගහනයක් තරම්. ඒත් ඒ ගැන හිතුවොත් මී මැසි ජනපදයක් කියන්නේ මී මැසි නගරයක්!

ජූලි 13

හ්ම්.... ම් සද්දෙන් වැඩ! මී මැස්සෝ ඉස්සරහට යි පස්සට යි සූ හඬ නගාගෙන යන්නේ හරියට අහස් යානා සේනාංකයක් වගෙයි. ඉස්සරහා දොරකඩ ලෑල්ල තවමත් මී මැස්සන්ගෙන් පිරිලා. ජනපදය ඇතුළේ අද ආයේත් නැටුම් තිබුණා. ඒකෙ පෙනුම හැබෑවට ම නිවාඩු දවසක් වගේ ම යි. සමහරවිට පැණි එකතු කරන කාල වකවානුව මී මැස්සන්ට නිවාඩුයි වත්ද? කොහොමටත් ඒ තරම් රොන් එකතු කර ගන්න එක උන්ට ලොකු සතුටක් වෙන්ඩ ඕනෑ. හීත කාලේ වෙනුවෙන් හුඟාක් පැණි දෑන් උන් ගාව තියෙනවා.

ජූලි 14

හපොයි බොලේ.... මොන තරං දෙයක්ද! අපව පත්තරේ වැටිලා!

අපි අද උදේ ඉස්කෝලේ වත්තට ආවා ම වීත්යා පත්තරයකුත් අරගෙන දුවගෙන ආවා.

"යාලුවනේ මේ බලන්න! අපි පත්තරේ වැටිලා!" එයා කෑ මොර දුන්නා.

අපි පත්තරය බැලුවා. ඒකේ ගාල්යා ගත්ත අපේ පින්තූරේ වැටිලා. ඒ එක්ක ම අපි ගැන ලිපියකුත්. ඒකේ විස්තර කරලා තියෙනවා කොහොමද අපි අපේ ම මී මැසි පෙට්ටියක් හදාගත්තේ කියලා, ඒ වගේ ම කොහොමද මී මැස්සන් ඇති කරන්න පටන් ගත්තේ කියලා. අපි හැමෝගෙ ම නම් එක්ක පාසලේ ලිපිනයත් තිබුණා.

ළඟ ම පත්තර කඩේට අපි දිව්වා පත්තර මිලට ගන්න. පව්ලිකුයි මමයි දෙක ගානේ ගත්තා. අපි ගැන ලියන්න ඇත්තේ කවුද කියලා හිතාගන්න අපි උත්සාහ කළා.

"ගාල්යා වෙන්න ඕනෑ. අර පින්තූරේ ගත්තේ එයායි. එයා පින්තූරෙත් එක්ක විස්තරේ පත්තරේට යවන්න ඇති"

අපි ගාල්යා ළඟට දුවලා ගිහින් ඇහුවා ලිපිය ලිව්වේ ඈද කියලා. ඈ කිව්වා ඔව් කියලා. අපි එයාට ස්තුති කළා.

"ඔයාලා මට ස්තුති කරන්න ඕනි නෑ. මී මැසි පෙට්ටිය හදලා

ඔක්කෝම ඉතුරු වැඩ ටික කළේ ඔයාල යි. ඒ හින්දා ඔයාලට පුළුවනි ඔයාලට ම ස්තුති කර ගන්න" එයා කීවා.

අපි අපේ අයට පත්තරේ පෙන්නන්න ගෙදර දිව්වා. පව්ලික් මෙන්න මෙහෙම කීවේ මමයි, පාව්ලිකුයි සෙර්යෝෂායි ගෙදර යන අතරතුරේදී.

"අපිට අපි ගැන ස්තුති කරගන්ඩ දෙයක් නෑ"

"ඔව්, ඒක අපි තුන් දෙනාට කරන්න ඉතුරු කරලා තිබුණා නං මෙලහකට මොන මී මැසි ජනපදයක් වත් නෑ" සෙර්යෝෂා එකඟ වුණා. "අපි වැඩේ අතෑරලා දැම්ම වෙලාවේ ඒක දිගට ම කරගෙන ගිය අනිත් අයටයි අපි ස්තුති කරන්න ඕනෑ"

"බොරු රූවටිලිවලින් තමයි අපව පත්තරේ වැටිලා තියෙන්නේ. ඒ හින්දා පුරසාරං කියවන්ඩ අපිට මෙතන කිසිම දෙයක් නෑ"

"ඔව්, මිනිස්සු අපේ නම් පත්තරෙන් කියවලා කියාවි 'මොන තරං අපූරු ළමයිද!' කියලා. එයාලා වැඩේ දන්නවානං හෙම!" ඒ පවුලික්.

"මම නං පත්තරේ කාටවත් පෙන්නන්නේ නෑ" සෙර්යෝෂා කීවා.

"මාත් එහෙමයි" පව්ලිකුත් කීවා.

ඒ දෙන්නා ගැන නං මං දන්නේ නෑ. ඒත් මම නම් හැම කෙනෙකුට ම පත්තරේ පෙන්නුවා. මම ඒක අම්මටයි, තාත්තටයි, එතකොට වාස්යා මාමාටයි, නාද්යා නැන්දටයි, ඒ වගේඩම අහල පහළ හැමෝට ම යි පෙන්නුවා. හැම කෙනෙක් ම මට ප්‍රශංසා කළා. මා ගැන කොච්චර කලබලයක් ඇති වුණාද කියනවා නං මට ලොකු අපහසුවක් දැනෙන්න ගත්තා. මගේ හෘදය සාක්ෂිය මට කරදර කරන්න වුණා. ඒකෙන් මම හෘදය සාක්ෂිය ගැන හිතන්න ගත්තා. ඒක මොකක්ද, ඇයි ඒක කරදර කරන්නේ යන දේවල් ගැන. හොඳ වැඩක් කරද්දි හෘදය සාක්ෂිය යාන්තංවත් රිදිල්ලක් දෙන්නේ නැත්තේ ඇයි, ඒත් පහත් වැඩක් නැත්තං නරක දෙයක් කරද්දී කටු අනින්නා වගේ රිද්දවන්නේ ඇයි?

මං හිතන්නේ හෘදය සාක්ෂිය කියන්නේ මගේ ඇඟ ඇතුළේ ම ඉන්න පුංචි මිනිහෙක් කියලා. පුංචි ම පුංචි හොඳ මිනිහෙක්. එයාට ඕනෑ මමත් හොඳ කෙනෙක් වෙන එක යි. මම නරක් වෙද්දී එයා මට මහ කාළකණ්ණි බවක් හිතේ ඇති කරවනවා.

ඒත් මම දන්නවා ඒක මගේ හිතලුවක් විතරයි කියලා. හැබැවට ම නං මා ඇතුළේ මම ම ඇරෙන්න වෙන කිසි ම කෙනෙක් නෑ. ඒ හින්දා මට දොස් කියන්නේ මම ම යි, ඒ වගේ ම මගේ හෘදය සාක්ෂිය කියන්නේ මම ම යි.

ඇයි මං දන් මට ම දොස් කියාගන්නේ? අහල පහළ අයට පුරසාරම් දෙඩෙව්වාට යි, කතා කරන්න තරම් වැදගත් කිසි ම දෙයක් මං හැබැවට ම කරලා නැති කොට මම වැදගත් කෙනෙක් කියලා ඒ අය ලවා හිතෙව්වාට යි. පුරසාරං කියන්න තරං දෙයක් නැත්තං මම ඊළඟ වතාවේ නම් පුරසාරම් දොඩවන්නේ නෑ ම යි.

ජූලි 15

අපේ මී මැසි ජනපදය ගැන ආරංචිය මුළු පාසල පුරාම පැතිරිලා. අද පහළ පන්තිවලින් ටික දෙනෙකුයි, ඉහළ පන්තිවලින් ටික දෙනෙකුයි ශිෂ්‍යායෝ අපව බලන්න ආවා. අපි ඒ ගොල්ලන්ට අපේ මී මැසි පෙට්ටිය පෙන්නලා මී මැසි පාලනය ගැන අපි ඉගෙන ගත්ත හැම දෙයක් ම එයාලට කීවා. ඒ ගොල්ලෝ කීවා අපෙන් මී මැසි පාලනය ඉගෙන ගන්න එයාලා එනවා කියා.

පහුවෙලා මිනිහෙක් ආවා, අමුත්තෙක්.

"ඔයාලා ගැනද පත්තරේ ලියලා තිබුණේ?" එයා ඇහුවා.

"ඒ අපි තමා"

"එතකොට මං හිතන්නේ මේ ඔයාලගේ මී මැසි පෙට්ටිය? මං පොඩ්ඩක් බලන්නද?"

"අපොයි බලන්න බලන්න"

එයා මී මැසි පෙට්ටිය පැත්තකින් දණ ගහලා හුඟ වෙලාවක් මී මැස්සන් දිහා බලාගෙන හිටියා. අන්තිමේ එයා නැගිටලා මෙහෙම කීවා.

"විශිෂ්ටයි! මං කොහෙත් ම ඒක විශ්වාස කළේ නෑ!" එහෙම කියලා එයා යන්න ගියා.

ඔන්න බලමු! ලොකු මහත් වුණු අයත් අපේ වැඩේ ගැන උනන්දු වෙන්න අරන්. මේ ඔක්කෝම අර පත්තරේ ලිපිය හින්දායි. එහෙම නොවුණා නං කිසි කෙනෙකුට කොහෙත් ම අපි ගැන ආරංචි

වෙන්නේ නෑ.

ජූලි 16

අද වෙන පාසලකින් පිරිමි ළමයි දෙන්නෙක් ආවා අපව බලන්න. ඒ ගොල්ලෝත් පත්තරෙන් අපි ගැන කියවලා හිතා මතා ම යි අපේ මී මැසි ජනපදය බලන්න ඇවිත් තියෙන්නේ. ඒ ගොල්ලන්ට එකක් හදන්න ඕනෑ වෙලා. ඒ අය ගියාට පස්සේ ඊයේ ආව මනුස්සයා අදත් ආයේ ආවා. එයා හුඟ වේලාවක් අපිත් එක්ක කතා කර කර හිටියා. ඒත් ඊට පස්සේ මී මැස්සෙක් එයාට ඇන්නා. එයා යන්න ගියා.

ජූලි 17

අපි දූන් හුඟක් ජනප්‍රිය වෙමින් යනවා! ගාල්යා ඇවිත් කීවා අපට ලියුමක් තියෙනවා කියලා.

අපට හොඳටෝම පුදුමයි. අපිට ලියන්නේ කවුරු වෙන්න ඇද්ද? ඇතුළට දිව්ව අපි ලියුම ගත්තා. මෙන්න ඒක. (මම ඒක දිනපොතේ ලියන්න ගෙදර ගෙනාවා. ඒක ලියලා තියෙන්නේ කැබිනට් හදන වඩු වැඩ පාසලක සිසුන්)

ආදරණීය තරුණ මී මැසි පාලකයිනි! අපි ඔබ ගැන පුවත් පතින් කියවූවෙමු. ඔබ සමඟ ලිපි හුවමාරුවකට අපි කැමැත්තෙමු. ඔබ කරමින් සිටින දෙයට අප ඉතා උනන්දු වෙන අතර දූන් අපට වුවමනා කරන්නේ ඔබේ ආදර්ශය අනුගමනය කරමින් මී මැසි පාලනය කරන්නට යි. මී මැසි පෙට්ටියේ දිග, පළල, උස මිනුම් ටික අපට ඔබ එවනවා නම් අපි ඉතාමත් කෘතඥ වෙමු. හැකි කමක් තිබෙනවා නම් අපිට චිත්‍ර සැළසුම් එක්ක එවන්න. අපි ලී බඩු හැදීම ගැන ඉගෙන ගනිමිනුයි සිටින්නේ. අපි දූනට ම ත් කකුල් තුනේ පුංචි පුටු, මේස, බංකු වගේ දේවල් හදන්නට දන්නවා. ඊළඟ අවුරුද්දේ අපි විශේෂ හුරුවකින් කළ යුතු ලී බඩු හදන්නට යි සිටින්නේ. ඒ නිසා අපිට හොඳ මී මැසි පෙට්ටියක් හදන්නට පුළුවන් වෙන්න ඕනෑ. සමහරවිට පස්සේ, මී මැසි පාලනයට එන අනිත් ළමයින්ට මී මැසි පෙට්ටි හදා දෙන්න

අපට පුළුවනි. කරුණාකරලා අපට දන්වන්න මී මැස්සන් ගන්නට තියෙන්නේ කොහේද කියලා. අපි ඔබේ පිළිතුරු එනතුරු බලා සිටිනවා. අපි ඔබට උණුසුම් සුභ පැතුම් එවමින් වැඩිදුර සාර්ථකත්වය පතනවා"

අද අපි පුරෝගාමීන්ගේ රැස්වීමක් පැවැත්වූවා. ගාල්යා ලියුම කියෙව්වා. පිළිතුරු ලියන්නට අපි එක සැරේට ම තීරණය කළා. ඒ අයට සියලුම උපදෙස් දෙමින්, මී මැසි පෙට්ටියේ රූප සටහන් ඇතුළත් කරමින් සහ අපට මී මැස්සන් එවූ මී මැසි ගොවිපොළේ ලිපිනය සඳහන් කරමින් අපි දිග ලිපියක් ලීවා.

ජූලි 18

අද අපට තවත් ලිපියක් ලැබුණා. ඒක මිත්යා රොමෂ්කින් කියා නමක් ඇති පුංචි පිරිමි ළමයෙකුගෙන්. පුංචි ළමයෙක්ගේ හුඟක් විනීත ලියුමක්. අපි ඒකට හුගාක් කැමති වුණා. මෙන්න ඒක.

"ආදරණීය යාළුවනේ, මමත් මී මැසි පාලකයෙක්. පහුගිය අවුරුද්දේ ඉඳලා ම මම පෙට්ටියක දාලා මී මැස්සෝ ඇති කරන්න හදනවා. ඒත් උන්ව ඒකේ නතර කරලා තියාගන්න බෑ.

උන් ඉගිල්ලිලා යන්න යනවා. මම පැණියි, සීනියි පෙට්ටියේ තිබ්බා. ඒත් උන් කරන්නේ පැණි ටික කාලා යන්න යන එක යි. ඊයේ මම තවත් මී මැස්සන් දහයක් ඇල්លුවා. ඒත් උනුත් යන්න ගිහින්. මට ඕනෑ කරන්නේ පුළුවන් තරම් මී මැස්සෝ ටිකක් එකතු කරලා තියා ගන්න යි. එතකොට මම ලොකු වුණා ම මට පුළුවන් මී මැසි පෙට්ටියක් නැත්තං දෙකක් උණත් තියාගෙන මී මැසි පාලකයෙක් වෙන්න. කරුණාකරලා මට කියන්න මී මැස්සෝ ඉගිල්ලිලා යන්නේ නැති විදිහට කොහොමද තියාගන්නේ කියලා. මොකද මං මොනවා කළත් උන් කොහෙත් ම නතර වෙලා ඉන්නේ නැති හින්දා. ඒ වගේ ම මට කියනවද මී මැස්සෝ ඔයාලට අනිනවද කියලා. මොකද උන් මහ ජරා විදිහට අනිනවා. ඒත් මං නිර්භීත විදිහට ඒක උහුලා ගන්න හදනවා. හරියට පෙරමුණට ගිය සෙබළෙක් වගේ. කරුණාකරලා මට ලියලා එවන්න මොකක්ද කරන්න ඕන කියලා.

ඔබේ මිතුරු මිත්යා රොමෂ්කින්"

මිත්යාගේ ලියුම කියෙව්වා ම අපිට හිනාව නතර කර ගන්න බැරි වුණා. අන්තිමේ අපට මතක් වුණා අපිත් මී මැස්සන් එක එකා ගානේ අල්ලන්න උත්සාහ කළ හැටි ගැන. ඉතිං අපි හිනාවෙන එක නතර කරලා මී මැස්සන් ගැන අපි දන්න හැම දෙයක් ම ගැන කියලා දිග ලිපියක් මිත්යාට ලිව්වා. ඊට පස්සේ අපි අපේ මී මැසි පෙට්ටිය බලන්නට ගියා.

ජූලි 19

අපට දැන් හැමදා ම ලියුම් ලැබෙනවා. අද එකක් මට පුද්ගලිකව ආවා. " ජනප්‍රිය මී මැසි පාලක කෝල්යා සිනිට්සින්" ලියුම් කවරයේ තිබුණේ එහෙම යි. මගේ ප්‍රීතිය නිම් හිම් නෑ. ලියුම දිගාරින වෙලාවේ මගේ අත් හිත කලබලය හින්දා වෙව්ලුවා.

"ආදරණීය නොහඳුනන මිතුරු කෝල්යා සිනිට්සින්" එහෙම යි ඒක පටන් ගත්තේ. "ඔයා සමහරවිට පුදුම වේවි, මීට කලිං කිසිදාක දැකලා නැති ගෑනු ළමයෙකුගෙන් ලියුමක් ලැබෙන කොට. සමහර විට ඔයාගේ නමයි, හැම දේ ම යි එක්ක පත්තරේ පළවුණු ජනප්‍රිය කෙනෙක් නිසා ඔයාට මාව අඳුනා ගන්න ඕන වෙන එකකුත් නැති වෙන්න පුළුවන්. ඔයාලගේ පින්තූරෙත් එක්ක ඔයාලගේ පුරෝගාමී කණ්ඩායම කළ වැඩ වල විස්තරය මමත් පත්තරෙන් කියෙව්වා. අපි ඒ ලිපිය අපේ පුරෝගාමී කණ්ඩායමේ රැස්වීමකදී කියවලා තීරණය කළා ඔයාලගේ ආදර්ශය අනුගමනය කරමින් මී මැසි පාලනයට යොමු වෙන්න.

ඔයාට සමහරවිට මේක කියවද්දී හිනා යන්න පුළුවනි. මොකද සමහර පිරිමි ළමයි ගෑනු ළමයින්ව හෙළා දකිනවා, ඒ අය කිසි ම කමකට නැති අය කියලා. ඒත් අපි තීරණය කරලා තියෙන්නේ ගැහැනු ළමයිනුත් පිරිමි ළමයි තරමට හොඳ යි කියලා පෙන්වන්නට යි. අපි මී මැසි පාලනය බාර ගන්නට යි යන්නේ. අපි ලොකු මහත් වෙලා සමූහ ගොවිපළේ මී මැසි ඒකකයේ වැඩට යද්දී මී මැස්සන් ගැන දැනගෙන ඉන්න එක ප්‍රයෝජනවත් වේවි.

පුරෝගාමී කණ්ඩායම මාවයි තෝරා ගත්තේ ඔයාලට ලියලා

ඔයාලා මී මැසි පෙට්ටිය හදාගත්තේ කොහොමද, මී මැස්සන් රැක බලා ගත්තේ කොහොමද කියලා අහන්න. ඒත් මං හිතුවේ ඔයාට පුද්ගලික ලිපියක් ලියන එක හොඳ යි කියලා යි. මොකද මං ඔයාගේ නමට ආස යි. මම විශ්වාස කරනවා ඔයා හුඟාක් ප්‍රසන්න පිරිමි ළමයෙක් කියලා. දැනට එපමණයි. පුරෝගාමීන්ගේ සුභ පැතුම් සමඟ ලූස්යා අබානෝවා."

මුලදී මේ ලූස්යා ගැහැනු ළමයාට ලිවීමේ අදහසට මං එච්චර කැමති වුණේ නෑ. ඒත් අනිත් අය කීවේ මම ලියන්න ඕනෑ ම යි කියලා යි. ලූස්යාටත් ඇගේ යෙහෙළියන්ටත් ඕනෑ කරන හැම දේ ම කියලා වහා ම මම ලියන්නට ඕනෑ කියලා ගාල්යා කීවා. මී මැස්සන් ඇති කරන්නට ගැහැනු ළමයින් හිතනවා නම් අපේ යුතුකම තමයි ඔවුන්ට උදව් දෙන එක.

ඉතිං මම ගෙදර ඇවිත් ලියුමක් ලියන්නට ඉඳ ගත්තා. ගැහැනු ළමයාට කිසි ම වැරැද්දක් හොයා ගන්න බැරි වෙන විදිහට, ඉතා ම කදිමට ලියන්නට උත්සාහ කරමින් මම ඒකට මුළු පැයක් ම මහන්සි වුණා. ඒක ලියලා ඉවර වුණා ම මම ඒක කියෙව්වා. ඒක මට ඇහුණේ ඉතා ම අපූරු විදිහට යි. ඇත්ත වශයෙන් ම ඉතා ම අපූරුයි. මම ඒක අපේ සගයින් ඉස්සරහා කියෙව්වා. ඒ වගේ ලියුමක් යවන්න කිසි ම කෙනෙක් ලැජ්ජා වෙන්නේ නැති බව ඒ ගොල්ලෝ කීවා.

ජූලි 20

අද අපව බලන්නට තවත් අමුත්තෝ ආවා. වැඩිපුර ම පිරිමි ළමයි. ඒත් ඒ අතරේ ගිය වතාවේ මී මැස්සෙකුගෙන් ඇනුම් කෑව මනුස්සයාත් උන්නා. අපි බය වුණේ එයා ආයෙත් සැරයක් ඇනුම් කාවි කියලායි. ඉතිං අපි එයාට ඔළුවේ දාගන්න දැල් ආවරණයක් දුන්නා. ගුරුතුමිය ආවා ම එයා හැම ජාතියක ම ප්‍රශ්න ඇගෙන් අහන්න ගත්තා.

"සමාවෙන්න, මේ මී මැසි පෙට්ටියේ බලාපොරොත්තුව අධ්‍යයන විතරද, නැත්තං ඒ ඇර මොනව හරි ප්‍රායෝගික ප්‍රයෝජනයක් ඒකේ තියෙනවද?"

"ඒ දෙකම" නීනා සෙර්ගෙයෙව්නා උත්තර දුන්නා.

"එතකොට ඒකේ තියෙන ප්‍රායෝගික ප්‍රයෝජනය මොකක්ද? නගරේ මී මැස්සෝ ඇති කරන එක ඇත්තටම කරන්න පුළුවන් දෙයක්ද?"

"ඇත්තවශයෙන්ම ඔව්. මී මැස්සන්ට පුළුවන් උයන් වල, ගෙවතුවල, පාරවල් අයිනේ වැවෙන මේපල්, දෙහි, විලෝ, කුරුළු බෙරි එතකොට වෙන වෙන ගස් වල පඳුරුවල මල් වලින් ඕන හැටියේ පැණි ගන්න. ඇරත් මී මැස්සෝ රොත් හොයන්න නිතරම ඈත පියාඹනවා. උන්ට පුළුවනි නගරෙන් පිටට පියාඹලා වට පිට ගම්වල කුඹුරු වලින් පැණි එකතු කර ගන්න. ගම්බද විතරයි මී මැස්සෝ ඇති කරන්න පුළුවන් කියන්නේ පරණ මතයක්. මොස්කව් වගේ නවීන නගරවල මී මැස්සෝ ඇති කරන එක හොඳටෝම කරන්න පුළුවන් දෙයක්."

"එහෙමනං මමත් වහාම පටන් ගන්නවා. ප්‍රශ්නෙ තමා කොහේ මී මැසි පෙට්ටිය තියන්නද කියලා මම දන්නේ නැති එක" මිනිසා කීවා.

"අපොයි මී මැස්සෝ හිතන තරං එච්චරට කලබල කරන්නේ නෑ." ගුරුතුමිය කීවා. "මී මැසි පෙට්ටිය ඕන නං වත්ත පිටිපස්සේ හරි, මිදුලේ හරි, බැල්කනියේ හරි තියන්න පුළුවනි. එහෙම නැත්තං අට්ටාලේ හරි මඩුවක හරි වුණත් කමක් නෑ"

"මී මැස්සෝ බැල්කනියේ ඈ? ඒක නං අපූරු අදහස! ඕං බලමු, කවුද ඕක හිතන්නේ? විද්‍යාව මොන තරං ප්‍රගතියක් ඇති කරමින් ඉන්නවාද!"

එයා ගුරුතුමියට ස්තුති කරලා අතට අත දුන්නා. අපේ අකමැත්තක් නැතිනම් මී මැස්සන්ව අධ්‍යයනය කරන්නට ආපහු එන බවට පොරොන්දු වුණු එයා යන්නට ගියේ ඔළුවේ දැල් ආවරණයත් එක්ක ම යි. ඒක ගන්නට අපට එයා පස්සේ දුවන්න සිද්ධ වුණා.

ජූලි 21

අද හුඟාක් රස්නේ දවසක්. මී මැස්සෝ අද වැඩිමනක් වැඩ කළේ නෑ. උන් මී මැසි පෙට්ටියෙන් එළියට වැක්කෙරිලා

දොරකඩ ලෑල්ල උඩ එක ළඟින් සංඝ කුට්ටියක් වගේ එල්ලිලා හිටියා. හරියට කළුපාට රැවුලක් වගේ. 'රැවුළ' එතන හුඟාක් වෙලා එල්ලිලා තිබුණා. ඊට පස්සේ මී මැස්සෝ ආයෙත් ජනපදය ඇතුළට බඩගෑවා. ටික වෙලාවකට පස්සේ ආයෙත් එකට ඇලීගෙන උන් එළියට ඇවිත් ටික වෙලාවක් එල්ලිලා හිටියා. අන්තිමේ උන් පෙට්ටිය ඇතුළට ගිහින් ඒකේ ම හිටියා.

ජූලි 22

සෙර්යොෂායි, පාව්ලිකුයි, මමයි අද උදේ මී මැසි පෙට්ටිය ළඟට ආව වෙලේ අපි දැක්කා මී මැස්සෝ ආයෙත් දොරකඩ එකට රංචු ගැහෙන්නට යන හැටි. අපි හිතුවේ උන් ආයෙත් 'රැවුළක්' වෙන්න යනවා කියලායි. ඒත් හිටි ගමන් ම උන් ඔක්කෝම

රංචුව පිටින් ම උඩට පියාඹලා මී මැසි පෙට්ටිය උඩින් මහ හඬින් සූ හඬ නගමින් කරකැවෙන්න ගත්තා. ඉක්මනින් ම අනිත් මී මැස්සොත් උන්ට එකතු වෙලා ඉවරයක් නැති කලබලයක් කරන්නා වගේ පේන්න ගත්තා. බය වුණු අපි ගහක් පිටිපස්සේ හැංගිලා මී මැස්සන් වත්ත වටේ කැරකි කැරකී යන හැටි බලා උන්නා. උන් කොච්චර සද්දයක් කළාද කියනවා නං හැතැප්මක් ඈත හිටියත් ඒ සද්දේ ඇහුණා.

"උන්ට මක් වෙලාද?" පව්ලික් ඇසුවා.

"මං දන්නවා උන් රංචු වෙන්වෙලා යනවා" සෙර්යෝෂා කෑ ගැහුවා.

"හෝ එහෙම යි! අපි උන්ව කොහේ තියන්නද?"

"අපට බාල්දියක් ඕනෑ" මම යෝජනා කළා.

"ඔව්, ඔයාලා දෙන්නා ගෙදර දුවලා එකක් ගේන්න. මං මෙතන ඉඳන් බලන්නං මොකද වෙන්නේ කියලා" පාව්ලික් කීවා.

මම යි සෙර්යෝෂා යි පාර දිගේ දුවන්නට වුණා. මුළු ගේ පුරා හෙව්වත් මට හිස් බාල්දි එකක්වත් හොයා ගන්න බැරි වුණා. ඉතිං මම ගුවන් විදුලි යන්ත්‍රය දාගෙන ආව විශාල කාඩ්බෝඩ් පෙට්ටිය ඩැහැගෙන ආයෙත් පාරට දිව්වා. පාසල් වත්තට ළඟා වෙද්දි මම දැක්කා සෙර්යෝෂාත් දුවගෙන එන හැටි. එයාගේ අතේ බාල්දියක්. ඒත් පාව්ලික්ගේ ලකුණක් වත් නෑ.

"කෝ පාව්ලික්?" මම ඇහුවා.

"දන්නේ නෑ, මං එයාව හැම තැන ම හෙව්වා. ඒත් හොයා ගන්න බෑ"

"කෝ මී මැසි රංචුව?"

"මී මැසි රංචුවත් ගිහිං"

අපි නතර වෙලා හතර වටේ බලන්නට ගත්තා. එතකොට ම පාව්ලික්ගේ ඔළුව වැට පිටිපස්සෙන් මතු වුණා.

"ඔතන මක් කරනවද? ඉක්මනට මෙහේ එනවා!"

අපි වැට උඩින් එහා වත්තට පැන්නා. සෙර්යෝෂාගේ කකුල වැටේ පැටලිලා වැටෙන්නට ගියා. බාල්දිය එයා අතින් අතෑරුණා. ඒකා මහ සද්දෙන් බිම පෙරළුණා.

"සද්ද නොකර එනවලකෝ. නැමුසෙලා මී මැසි රංචුව බය කරනවා!" පාව්ලික් රහස් හඬින් කෙඳිරුවා.

"කෝ උන්?"

"අර බලනවා!" එයා වැට කිට්ටුව ගහක් පෙන්නුවා. මී මැසි රංචුව ගහේ අත්තක පොකුරක් විදිහට එල්ලිලා හිටියා. ටික දෙනෙක් ඒ වටේ සූ සූ හඬින් කරකැවුණා. හරියට උන්ටත් පොකුරට එකතු වෙන්න තැනක් හොයනවා වගේ.

"මට බාල්දිය දෙනවා" ඒ පාව්ලික්.

"සමහරවිට බාල්දියට වඩා මේ පෙට්ටිය වැඩිය හොඳ වේවි. ඒක ලොකුයි" මම යෝජනා කළා.

"හැබෑ තමයි, කෝ මට ඒක දෙනවා"

මම ඇඟිලි තුඩින් ඉස්සිලා පෙට්ටිය මී මැසි රංචුව යටින් ඇල්ලුවා. පාව්ලික් ඇත්ත හෙළෙව්වා. රංචුව පෙට්ටියට වැටුණා. මම ඉක්මනට පියන වැහැව්වා.

"ඔන්න හරි. දැන් උන් පියාඹලා යන්නේ නෑ" මම කීවා.

අපි වැට උඩින් පැනලා ආපහු පාසල් වත්තට ආවා. අනිත් සගයෝ ටික මී මැසි පෙට්ටිය වගේ හිටගෙන උන්නා.

"ඇවිල්ලා බලනවා, අපට රංචුවක් ලැබුණා" මම කෑ ගැසුවා.

"කොහේද?"

"මෙහේ මේ පෙට්ටියේ"

"කොහෙන්ද අල්ලා ගත්තේ?"

"උන් අපේ මී මැසි පෙට්ටියෙන් ඉගිල්ලුනේ" මම පෙට්ටියේ පියන උස්සලා ඔවුන්ට ඇතුළේ හිටිය මී මැස්සන්ව පෙන්නුවා.

"ඒක හරි පුදුමයක් නේද!" ඒ ගොල්ලෝ කීවා. " දැන් අපට අලුත් ම අලුත් මී මැසි පවුලක් ඉන්නවා. අපට දැන්ම ම මී මැසි පෙට්ටියක් හදන්න යන්න වෙනවා"

අපි ආයුධ අරගෙන එක සැරේට ම වැඩේට බැස්සා. ගුරුතුමිය අවා. අපි ඈට පෙට්ටියේ හිටිය මී මැසි රංචුව පෙන්නුවා.

"ඒ ගොල්ලෝ මී මැසි පෙට්ටියෙන් පිට වෙන්න තෝරාගෙන තියෙන්නේ වැරදි වෙලාව" ඈ කීවා.

"ඒ මොකෝ?"

"මෙක පැණි වාරේ හින්දා. රංචු වෙන් වුණා ම ඒ ගොල්ලන්ට රොන් එකතු කර ගන්න පුළුවන් වෙන්නේ බොහෝ ම ටිකයි"

"ඒකට කමක් නෑ. අපිට එච්චර ගොඩක් මී පැණි ඕනි නෑ. වැඩිපුර මී මැස්සෝ ලැබෙන එක ඊට වඩා හොඳයි" අපි කීවා.

හැන්දෑව වෙන්දී අපේ මී මැසි පෙට්ටිය සූදානම්ව තිබුණා. අපි ඒකට අලුත් ආමු ගාණක් හැදුවා. පරණ මී මැසි පෙට්ටියෙන් පිලව් රාමුවකුත් අරගෙන දැම්මා. ඒ අපේ මී මැස්සන්ට අලුත් පෙට්ටිය ගෙදර වගේ දැනෙන්න යි එහෙම කළේ. ඊට පස්සේ මී මැසි රංචුව මී මැසි පෙට්ටියට හළලා උඩ පියන වහලා අපි ගෙදර ආවා.

සෙර්යෝෂායි, පාව්ලිකුයි, මායි හිටියේ හුඟාක් ප්‍රීතියෙන්. මොකද අපි නොහිටියානං මී මැසි රංචුව කොහේ හරි ඈතක පිටවෙලා යන්න තිබුණා. එහෙම නම් අපි තුන් දෙනාගේ ප්‍රයෝජනයක් නැත්තේ නෑ.

ජූලි 23

ඊයේ ගුරුතුමිය අපට කීවා අලුත් මී මැසි රංචුව ගැන වැඩිපුර වුවමනාවෙන් බලා ඉන්න කියලා. මොකද මී මැස්සෝ නිතර ම තමන්ගේ අලුත් නවාතැන් පිළිගන්නේ නෑ. උන් බලන්නේ වෙනින් ගෙයක් හොයාගෙන යන්න යි. අපි අද විශේෂයෙන් ම උදේ පාන්දරින් ම මී මැස්සන් බලන්නට ගියා. හුඟ වෙලාවක් කිසි ම දෙයක් සිද්ධ වුණේ නෑ. අන්තිමේ අලුත් ජනපදයෙන් මී මැස්සෙක් එළියට ඇවිත් දොරකඩ දිහාට හැරිලා බැලුවා. හරියට තැන මතක තියා ගන්න වගේ. ඊට පස්සේ උෟ මී මැසි පෙට්ටිය උඩින් කැරකිලා ඉගිල්ලිලා ගියා. ඉක්මනින් ම අනිත් මී මැස්සොත් එළියට ඇවිත් ඈතට පියාඹන්නට කලිං මී මැසි පෙට්ටිය වටේ කීප වතාවක් කරකැවුණා. අපි බයවුණේ උන්ට අලුත් ගෙදරට පාර හොයා ගන්න බැරිවෙලා වැරදිලා පරණ පෙට්ටියට ම යයිදෝ කියලායි. ඒත් ටික වෙලාවකට පස්සේ ආපහු ආව උන් කෙළින් ම අලුත් පෙට්ටියට පියෑඹුවා. අපි සතුටට උඩ පැන්නා. අපි උන්ට හැදුව අලුත් ගෙට උන් කැමති වුණ එකට අපි උන්නේ හුඟාක් සංතෝෂයෙන්.

ජූලි 24

අපි මුළු උදේ වරුව ම හිටියේ මී මැස්සන් දිහා බලමිනු යි.

ජනපද දෙක ම තදින් වැඩවල යෙදිලා. ඒත් අලුත් ජනපදයේ උන් වැඩිපුර උනන්දුවෙන බව යි පෙනුනේ. උන් එක ම මොහොතක්වත් නාස්ති කරන්නේ නෑ. පෙට්ටියෙන් එළියට ආව හැටියේ ම උන් තමන්ගේ පුංචි පියාපත් විහිදලා රොන් හොයන්න පිටවෙලා යනවා. අලුත් ජනපදයකදී මී මැසි රංචුවක් හැම වෙලේ ම වැඩි මහන්සියෙන් වැඩ කරනවා කියලා ගුරුතුමිය අපට කීවා. මොකද උන්ට පුංචි කාලයයි තියෙන්නේ හීත කාලේ වෙනුවෙන් මී පැණි ගබඩා කර ගන්න.

ජූලි 25

අද හුළං හුඟක් සැරයි. අහස වලාකුළු වලින් වැහිලා. ඉර ඉඳ හිටලා එබිලා බලලා ආයෙත් වලාකුළු පිටිපස්සේ හැංගුණා. කීප සැරයක් ම වැස්ස ඇද වැටුණා. පරණ ජනපදේ මී මැස්සෝ ඇතුළට ම වෙලා හිටියා. ඒත් අලුත් ජනපදේ උන් පුරුදු විදිහට ම වැඩ කරගෙන ගියා. ඉර පේන්න ගත්ත හැටියේ ම, එක සැරේට ම මී මැස්සෝ එළියට පියාඹලා යනවා. උන් දිහා බලා ඉන්න එක හරි ම ප්‍රීතියක්.

ෆේද්යායි, ග්‍රීෂායි ගිම්හාන කඳවුරේ ඉඳන් ආපහු ඇවිත්. කොච්චර ඉක්මනට කාලෙ ගෙවිලා ගිහින්ද. හිතලා බලන්න එයාලා කොච්චර පුදුම වුණාද කියලා අපට එකක් වෙනුවට මී මැසි පෙට්ටි දෙකක් ම තියෙන හැටි දැක්කා ම. එයාලා හිතුවේ අපි තව රංචුවක් ඇණවුම් කරලා ගෙනැත් කියලා. අලුත් රංචුව ආවේ පරණ ජනපදයෙන් කීවා ම එයාලා හොඳටෝම පුදුම වුණා. ඊට පස්සේ අපි එයාලට පෙන්නුවා පත්තරේ පළවුණු ලිපියයි, පින්තූරෙයි, ඒ වගේම අපට ලැබිලා තිබුණු ලියුම් ටිකයි. ඒවා ඒ ගොල්ලන්ගේ හිත්වල ලොකු බලපෑමක් ඇති කළා.

"අපි නැති අතරේ ඔයගොල්ලෝ මහ විශ්වකර්ම වැඩ කරලානේ" ඒ ගොල්ලෝ කීවා.

ජූලි 26

කාලගුණය ඉතා ම නරකයි. මුළු දවස තිස්සේ ම වගේ වැස්සා.

මී මැසි ජනපද දෙක ම නිශ්චලයි. මී මැස්සෝ පේන්න නැති හින්දා අපට දැනුණේ මහ උදාසීන ගතියක්. ඉතිං ගාල්යා යෝජනා කළා චිත්‍රපටියක් බලන්නට යන්න. ඇ කැමෙත් පස්සේ ඈ මුළු කණ්ඩායමට ම ප්‍රවේශ පත්‍ර මිලදී ගෙනාවා. අපි ගිහින් විනෝදකාමී චිත්‍රපටියක් බැලුවා.

ජූලි 27

ප්‍රධාන පැණි වාරය ඉවරයි. දෙහි මල් පරවෙලා ගිහින්. දැන් මී මැස්සන්ට සිද්ධ වෙනවා රොන් හොයාගෙන වෙන කොහේ හරි යන්න. අපි බය වුණේ අලුත් මී මැසි පවුලට සීත කාලේ පැණි නැතුව ගෙවන්න වේවි කියලායි. ඒත් ගුරුතුමිය අපිට කීවා අනිත් ජනපදයෙන් අමතර පැණි වද ටිකක් අරන් අලුත් ජනපදයෙන් තියන්න පුළුවන් බව. ඉතිං අපි අපේ පැණි වද ටික අරගෙන බැලුවා. එතකොට අපිට පෙනුණා රංචු දෙකට ම ඇතිවෙන තරමට පැණි තිබෙන බව.

"ඒත් මේ අවුරුද්දේ ඔයාලට පැණි චුට්ටක්වත් ලැබෙන්නේ නෑ" ඈ කීවා.

"අපිට පැණි ඕන ම නෑ. අපි වැඩිය කැමති ඒවා මී මැස්සන්ට ම ලැබෙන එකට යි. ඔක්කෝටමත් වැඩිය ගත්තම වැඩ කළේ උන්. ඉතිං හැබෑට ම ඒවා අයිති උන්ටයි" අපි කීවා.

"ආන්න හරි. ඒකෙන් රංචු දෙකට ම සීත කාලේ ගෙවන්න ඇති තරම් පැණි ලැබේවි. ලබන අවුරුද්දේ ඒ ගොල්ලෝ ගොඩක් රොන් එකතු කරාවි. ඒකෙන් ඔයාලට හුඟක් වැඩිපුර ලැබේවි"

"අපේ ම පැණිවල රහ බලන එක කොච්චර අපූරුද!" පාව්ලික් කීවා.

"ඒත් හීත කාලෙට අපේ මී මැස්සෝ කොහේද ඉන්නේ? උන්ට හීත කාලෙට ගැලපෙන මී මැසි පෙට්ටියක් හදන්න වෙයිද අපට?" යූරා ඇහුවා.

"සාමාන්‍ය ගේක බිංගේක* හරි වෙන තැනක හෑරුව බිංගේක හරි මී මැසි පෙට්ටියක් දෙකක් හීත කාලෙදි තියන්න පුළුවනි" ගුරුතුමිය කීවා.

---

* සීත රටවල ආහාර කල්තබා ගැනීම සඳහා බිංගෙවල් තනා තිබේ.

අපි තීරණය කළේ අපි ම බිම් ගෙයක් හාරන්නට යි. හෙට අපි වැඩ පටන් ගන්නවා. එතකොට අපේ මී මැස්සන්ට සීත කාලේ එද්දී හරි වෙලාවට කදිම උණුසුම් ගෙයක් ලබා දෙන්න අපිට පුළුවන් වේවි.

ජූලි 28

උදේ පළවෙනි දේ හැටියට අපි කළේ රැස්වෙන එක යි. ඊට පස්සේ වත්ත පහළින් විශාල වළක් හාරන්න වැඩට බැස්සා. අපි වළ වහන්න යන්නේ ලෑලි වලිනු යි. ඒ උඩින් පස් තට්ටුවක් දමනවා. ඒ සීතල නැති කරන්නට යි.

පොළොව හුඟක් තද යි. ඒ හින්දා හාරන වැඩේ හුඟක් අමාරු යි. ඒත් ලොකු වළක් හැදෙනකම් ම අපි මුළු දවසම නැවතිල්ලක් නැතුව වැඩ කළා. යූරා යෝජනා කළේ වළ පතුළේ ගිනි මැළයක් ගැසිය යුතු යි කියලා යි. ඒ වළේ බිත්ති හොඳින් වේලිලා තෙතමනය නැති වෙන්නට යි. වේළුණු දරකෝටු ගෙනා අපි ලොකු ගිනි මැලයක් පත්තු කළා. ගින්න නිවෙන්නේ නැතිව තියා ගන්න අපි කළේ. හොයා ගන්න තිබුණු රොඩු බොඩු හැම දෙයක් ම ඒකට ගෙනැවිත් දමූ එක යි. ගින්න අවුළුවද්දී හැන්දෑ වෙලා තිබුණා. වැඩි වෙලා යන්නට කලිං හොඳටෝම කළුවර වැටුණා. ගින්න තියෙද්දි ම අපි අළු අස්පස් කරලා මහන්සියෙන් දවසක් තිස්සේ කළ වැඩවලින් පස්සේ ටිකක් විවේක ගන්නට ඉඳ ගත්තා. වළ ඇතුළේ ඉදගෙන උඩ කළුවර අහසේ තරු නිවී නිවී දිළිසෙන හැටි බල බලා ගස් අස්සේ හුළඟ කොඳුරන සද්දේ අහන් ඉන්න එකෙන් කදිම වගේ ම උණුසුම් සුවපහසු බවක් දැනෙනවා.

"සිසිර කාලෙදි මී මැස්සෝ දකින්න නැති එක මහ එපා කරවන වැඩේ. මං උන්ට හුරුවෙලා, උන් හරිම විනෝදයක් ගේන පුංචි සත්තු ජාතියක්. ඒ වගේ ම හරි ම බුද්ධිමත් වැඩ කාරයෝ"එහෙම කීවේ ග්‍රීෂා.

"මටත් උන් ගැන කණගාටුයි" ෆේද්‍යාත් කීවා.

"සිසිර කාලෙ වෙනකොට තව හුග කාලයක් තියෙනවා. ඇරත් සිසිර කාලෙදි අපිට මී මැස්සෝ ගැන හිතන්න බැරි තරමට

ඉස්කෝලේ වැඩ තියේවි" තෝල්යා ඒ අයව සැනසුවා.

"අර වයසක මී මැසි පාලක සීයා හරි" පාව්ලික් කීවා. "එයා කිවේ මී මැසි පාලනේ පටන් ගත්ත ම කවදාවත් ඒක කෙනෙක් අතෑරලා දාන්නේ නෑ කියලා. මමත් ලොකු මහත් වුණා ම සමූහ ගොවිපොළක මී මැසි පාලකයෙක් වෙන්න හිත හදාගෙනයි ඉන්නේ. මට හුඟාක් මී මැසි ජනපද තියේවි. සීයක් නැත්තං දෙසීයක්. වැඩියක් ම වෙන්න පුළුවන් දෙසීයක්"

"ඒක ඔයාට නං හරි. ඒත් මං ගැන කොහොමද? මම නං පාලම්, බිං ගෙවල්, ඇළ මාර්ග හදන්න ඉංජිනේරුවෙක් වෙන්නයි යන්නේ..." ඒ ෆේද්යා.

"ඒකෙ කාරියක් නෑ. ඔයාට ඉංජිනේරුවෙක් වෙනවා වගේ ම මී මැස්සන් ඇති කරන්නත් පුලුවනි. උන් ඔයාව පාලං හදන එකෙන් වළක්වන්නේ නෑ" මම කීවා.

"ඇත්ත වශයෙන් ම නෑ. මම චිත්‍ර ශිල්පියෙක් වෙන්න යි යන්නේ. ඒත් ඒ එක්ක ම මී මැස්සන්වත් ඇති කරනවා. කෙනෙකුට බැරිද විශේෂඥයෝ දෙන්නෙක් වෙන්න" එහෙම කීවේ වීත්යා.

"කලාකාරයෙකුට නං එහෙම පුළුවනි. ඒත් මං වෙන්න යන්නේ ගුවන් නැවියෙක්" ඒ ෂෙන්යා.

"ඉතිං ඒකට මොකෝ? ඔයා හැම වෙලාවෙ ම පියාසරන්න යනවායැ?" මම ඇහුවා.

"ඒත් හිතමු මට හුඟක් ඈත පියාසරන්න වුණා කියාල?"

"මී මැස්සෝ ඔයා නැති වුණාට ජීවත් වේවි. උන්ට සාත්තු කරන්න ඕන කමක් නෑ. උන්ට උන් ගැන බලා කියා ගත්තැහැකි"

"ඔව්, ඒක ගුවන් නැවියෙකුට එච්චර නරක නෑ තමා. ඒත් මට ඕනෑ නාවිකයෙක් නැත්තං කපිතාන් කෙනෙක් වෙන්න. මුහුදු ගමන් වලට සමහර වෙලාවට මුළු අවුරුද්දක් ම යනවා! එතකොට මගේ මී මැස්සන්ට මක් වෙයිද?" යූරා ඇහුවා.

"ඔයාට පුළුවනි මී මැස්සන්ව නැවේ අරගෙන යන්න" මම කීවා. "කරන්න තියෙන එක ම වැඩේ තමා මුහුදේ යද්දී මී මැසි පෙට්ටියේ දොරටුව වහලා තියන්න වෙන එක. කොහේ හරි වරායකට ආව ගමන් ඔයාට පුළුවනි මී මැස්සන්ට යන්න අරින්න. උන් ගොඩබිමට ගිහින් පැණි හොයාගෙන ආපහු ඒවි. මං හිතන්නේ නාවික මී මැසි පෙට්ටියක් තියා ගන්න එක හරි ම

විනෝදයක් වේවි"

ඕනෑම කෙනෙකුට- ඒ කියන්නේ ගුවන් නැවියෙකුට, රියැදුරෙකුට, ආකරවල වැඩ කරන ශිල්පියෙකුට, ගොඩනැගිලි සාදන කෙනෙකුට... මේ වගේ ඕනෑ ම කෙනෙකුට ඕනෑකම තියෙනවා නම් මී මැස්සෝ ඇති කරන්න පුළුවන් බව මම ඔප්පු කළා. ගෙදර ගිය හැටියේ මම කල්පනා කළේ මගේ මී මැසි පාලන කටයුතු කරන්නේ කොහොමද කියලායි. මොකද ලොකු මහත් වුණහම කරන්න මම තීරණය කරලා තියෙන්නේ ආර්ක්ටික් ප්‍රදේශයේ වැඩට යෑම යි. මී මැස්සෝ ආර්ක්ටික් ප්‍රදේශයේදී හුඟක් සුවපහසුවෙන් ඉඳී කියලා මම හිතන්නේ නෑ. එහේ කිසි ම මලක්වත්, ගහක්වත් නෑ. අයිසුයි, ධ්‍රැව වලස්සුයි විතර ම යි. ඊට පස්සේ මම හිතුවා මං ලොකු වෙන කාලේ වෙනකොට මිනිස්සු ආර්ක්ටික් ප්‍රදේශයේ ගස් වවන්න පටන් ගනීවි කියලා. එතකොට මට වෙනින් ඕනෑ ම තැනක වගේ ම එහේත් මී මැස්සන් ඇති කරන්න පුළුවන් වේවි. එතකොට ගස් හිටවලා නොතිබ්බොත් මම ම ගස් හිටවනවා. ඒ අතරේ මම මී මැස්සන්ට පැණි බීම දෙනවා. එහෙම නං ඒකත් හරි. මම ආර්ක්ටික් ප්‍රදේශයේ මී මැස්සන් ඇති කරන්න යි යන්නේ.

ජූලි 29

අපි හිතුවේ නෑ අපට තවත් ලියුම් ඒවි කියලා. ඒත් අද තව එකක් ආවා. අපි හැම දෙනා ම අද උදේ අපේ මී මැසි ගොවිපොළේදී මුණ ගැසුනා. යූරා කුස්කෝව් දුවගෙන ආවේ ලියුමක් වනමින්. මී මැසි ගොවිපොළට එන අතරේ එයා පාසලේ කාර්යාලයට ගිහින්. එහේදී තමයි එයාට අපේ ලියුම හම්බ වෙලා තියෙන්නේ. අපි ලියුම් කවරේ ඉරලා හයියෙන් කියවාගෙන ගියා.

"ආදරණීය මිතුරනි! 'ලෙනින්ගේ මඟ' සමූහ ගොවිපොළේ පුරෝගාමීන් වන අපි ඔයාලා ගැන පත්තරයෙන් කියවලා ඔයාලට ලියන්නට තීරණය කළා. අපි සමූහ ගොවිපොළක පුරෝගාමීන් වී සිටිද්දීත් අපේ ම මී මැසි පාලන ඒකකයක් හදාගෙන නැති අතර නගරේ ඔයාලා ඔයාලගේ ම මී මැසි පාලනයක් ගෙනියන

එක ගැන අපි කොහොම ලැජ්ජා වෙනවද කියලා ඔයාලට කියන්න ඕනෑ. අපි තීරණය කළා වහා ම අපේ වැරැද්ද හදාගන්න. දැනටම අපි අපේ ගොවිපොළ මණ්ඩලය එක්ක කාරණය ගැන කතා කරලායි තිබෙන්නේ. අපට ආරම්භයක් හැටියට මී මැසි පෙට්ටි දෙකක් ලබා දී තිබෙනවා. ඉතිං අපටත් මී මැසි පාලන ඒකකයක් තියේවි"

"ඉතිං ආදරණීය මිතුරනි, ඔයාලා හිතන්න ඕන නෑ පහුගිය කාලෙ පුරා අපි කම්මැලි කමින් උන්නා කියලා. අපේ ගොවිපොළ පිහිටලා තියෙන්නේ ස්ටෙප්ස් බිමේ, ළඟ ම නගරයේ ඉඳලා හුඟාක් ඈතින්. මෙහේ කාලගුණය හුඟාක් ම නරකයි. සිසිර කාලෙදි මෙහේ භයානක විදිහට හිම වැටෙනවා, හිම කුණාටු ඇතිවෙනවා. සමහර වෙලාවට කොච්චර තදින් හිම වැටෙනවාද කියනවා නම් අපිට පාසල් යන්නට සිදු වෙන්නේ හිම උඩ ලිස්සන පතුරුවල නැගලා. ගිම්හාන කාලෙදි මෙහේ හුඟාක් රස්නෙයි. හිරු රැස්වලට පිච්චෙනවා. උණුසුම් හුළං දහරාවල් හැම දෙයක් ම වේලලා දානවා. පොළොවේ පස් වේලිලා ඉරි තලනවා. නියඟයත් එක්ක සටන් වදින්න ගොවීන්ට සිද්ධ වෙනවා ආවරණ හදන්න. අපේ පුරෝගාමී කණ්ඩායම තීරණය කළා ඒ අයට උදව් කරන්න. අපේ පාසලට අයිති ගෙවත්තකුත්, පරීක්ෂණ පාත්තියකුත් තිබෙනවා. අපි හැම දෙනා ම ඒකේ වැඩ බෙදාගෙන කරනවා. පිරී ඉතිරී යන අස්වැන්නක් බලාපොරොත්තුවෙනුයි අපි වැඩ කරන්නේ"

"ආදරණීය මිතුරනි, අපි දන්නවා නගරේ ඉන්න ඔයාලාත් ගස් වර්ග, මල් වර්ග හිටවමින් උයන් සහ ගෙවතු සකසන්නට උදව් දෙන බව. දැන් ඔයාලා ඒ වගේ ම මී මැස්සන් ඇති කරන්නටත් පටන් අරගෙන! සුභ පැතුම්! නගරයේ සිටින ඔයාලාත්, ගමේ සිටින අපිත් මීටත් වඩා හොඳින් වැඩ කරන්නට ප්‍රතිඥා දෙමු. ඒ අපේ රට දීප්තිමත්, ලස්සන එකක් කරන්නට කළ හැකි අපේ කුඩා දායකත්වය කරන්නට අපිට හැකි වෙන ලෙස යි"

"ඔයාලට සෑම දේකින් ම සාර්ථකත්වය පතනවා. ඔබගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් අපි මේ ලියුම අවසන් කරනවා පුරෝගාමීන්ගේ ආදර්ශ පාඨයෙන්:

ලෙනින් ගිය මඟ යාමට සූදානමින් සිටින්!"

"නිරතුරුව ම සූදානමින්!" ලියුම අවසන් කරමින් අපි සැම දෙනා ම එක හඬින් පැවසුවා.

ගෙදර ආවාම මම ලියුම ගැන කල්පනා කළා. මම කල්පනා කළේ අර සමූහ ගොවිපොළේ පුරෝගාමීන් එක්ක සසඳලා බලද්දී නගරේ සිටින පුරෝගාමීන් වන අපි සැබැවින් ම සිදු කරලා තියෙන්නේ බොහෝ සුළු ප්‍රමාණයක දෙයක් බව යි. ඒ වගේ ම ඒ අය එක්ක තරග කරන්නට නම් අපට තව බොහෝ දුරක් යන්නට ඇති බව යි. මම ඔවුන්ගේ ලිපියට බොහෝ කැමති යි. ඒ නිසා යි මම එය දිනපොතේ පිටපත් කළේ. දැන් මම ඒක පිටපත් කරලා අවසාන යි. මගේ දින පොත අවසානයට ඇවිත් තිබෙන හැටි මට පෙනුණා. තවත් මේකේ ලියන්නට කොහෙත් ම ඉඩක් නෑ.

ටික දවසකින් මම තව සටහන් පොතක් සල්ලිවලට ගෙනැවිත් මගේ දිනපොත දිගට ම ලියනවා. ඒත් දැනට නම් මෙච්චර ම යි.

ලිව්වේ

පුරෝගාමී කෝල්යා සිනිට්සින්

වැඩ බැරි දාස ගැන කතා

වැඩබැරිදාස සහ යාළුවන් ගැන කතා 30කි. ඔවුන්ගේ කුසුම්පුරයේ විස්තරවලින් ඇරඹෙන මෙම කතා පෙළ වැඩබැරිදාසගේ විස්තරත්, ඔවුන් ගුවන් ගමනක යෙදුණු සැටිත්, හරිතපුරයට ඔවුන් පැමිණෙන අයුරුත්, හරිතපුරයේ සහ සරුංගල්පුරයේ විස්තරත්, එම පුරයන්හිදී මේ මිතුරන් කළ කී දෑත්, වැඩබැරි හොඳ ළමයකු වී නැවත කුසුම්පුරයට පැමිණෙන අයුරුත් විස්තර කරයි.

ළමා ලෝකයට හාස්‍යයත්, දැනුමත් සමඟ මානව දයාව පිළිබඳ සියුම් හැඟීමත් ගෙන එන මෙම කතා පෙළ නිකොලායි නෝසව් නම් ලෝ පතළ රුසියානු ලේඛකයා බිහිකළ හොඳ ම නිර්මාණවලින් එකකි.

තවත් රුසියානු ළමා පොත් රැසක්

ළමා සිත්වල සියුම් තැන් පිළිබඳව වඩාත් ගැඹුරින් සොයා බලමින්, ඊට ගැළපෙන අයුරින් සෝවියට් රුසියානු ළමා කෘති ලියැවී තිබේ. පිටු සැලසුම්, වර්ණ සංකලනයත් හා භාෂා රටාවත් එකී පොත්වල යොදාගෙන ඇත්තේ ළමා සිත් සංවර්ධනය සඳහා වූ අධ්‍යාපන, මනෝවිද්‍යාත්මක පදනමකිනි. එසේ ම මිනිසාගේ අගය, මිනිසා කෙරෙහි වන ආදරය, මිනිසාගේ සාමූහිකත්වය, මිනිසාගේ පැවැත්ම උදෙසා එකිනෙකා විසින් කළ යුතු දේ ගැන වැඩියෙන් ම කතා කොට ඇත්තේ සෝවියට් රුසියානු ළමා සාහිත්‍යය යි.

සයුරි ප්‍රකාශන වෙතින් මෙම රුසියානු ළමා පොත් රැසක් ප්‍රකාශයට පත් කර ඇති අතර පහසු මිලකට ඔබට ලබා ගත හැකිය.
එසේ ම පුස්තකාල සමාජ, පාසල් සාහිත්‍ය සංගම් හෝ වෙනත් ඕනෑම සුබසාධන ආයතනයකට මෙන් ම උපන්දින ත්‍යාග ලෙස දරුවන්ගේ මිතුරන්ට පිරිනැමීමට පිටපත් 20කට වැඩියෙන් ලබා ගන්නා අයට සාධාරණ වට්ටමක් ලබා දෙනු ලැබේ.

සයුරි පොත්

සයුරි ප්‍රකාශන

102/176,
මත්තෙගොඩ පාර, මත්තෙගොඩ
දුර. 071 5181421



නිකොලායි නෝසව්
රුසියාවේ විසූ සම්මානනීය
ලේඛකයෙකි.
වැඩබැරිදාස ගැන කතා,
මිෂ්කාගේ කැඳ හැළිය,
ටොක් ටොක් ටොක්
ටොටොක්,
සීයාගේ ගෙදර ගිහින්,
පණ ඇති තොප්පිය
ආදී කෘති බොහෝ ගණනක්
ලියූවෙකි.

ළමෝ කණ්ඩායමක් එක්ව නිවාඩු කාලය පුරා කළ කටයුතු ගැන කියැවෙන්නකි මෙය. ළමුන් තුළ වන ස්වභාවික කුතුහලය, විනෝදකාමීත්වය, මුරණ්ඩු බව, මෝඩකම්, වීරක්‍රියා, මිත්‍රත්වය ආදී බොහෝ දේ කැටිකොට ලියන ලද්දකි.
විද්‍යාත්මක අධ්‍යාපනික කෘතියක් ලෙසින් ද අගය කළ හැකි ය. සාමූහිකත්වයේ අගය මතු කරන අතර සියුම් හාස්‍යයෙන් යුතු ය. සෑම දරුවෙකුට ම ඉතා යෝග්‍ය පොතකි.

200/-

ISBN 978-955-1889-07-4

සයුරි ප්‍රකාශන
102/176, මත්තෙගොඩ නිවාස පාර, මත්තෙගොඩ.
071 7963748 071 5181421